# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT
# 2016



## සී/ස හලාවත වැවිලි සමාගම
## சிலாபம் பெருந்தோட்ட நிறுவனம்
## CHILAW PLANTATIONS LTD

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு
Ministry of Public Enterprise Development

# අන්තර්ගතය


| | Page No |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 02 |
| මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා | 03 |
| සභාපතිතුමන්ගේ පණිවිඩය | 04 - 05 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 06 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 07 |
| කළමනාකරණ විමසුම | 08 - 20 |
| මූල්‍ය සමාලෝචනය | 21 - 24 |
| ආයතනික පාලන ප්‍රකාශය | 25 |
| අවධානම් කළමනාකරණය | 26 - 27 |
| විගණන සහ කළමනාකරණ කමිටු | 28 |
| **මූල්‍ය වාර්තා** | |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව | 29 - 31 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය | 32 |
| විගණකාධිපති වාර්තාව | 33 - 35 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 36 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 37 |
| ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 38 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 39 |
| ගිණුම්කරණ, ප්‍රතිපත්ති සහ සටහන් | 40 - 67 |
| දස වසරක සාරාංශය | 68 |
| වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය | 69 |
| පෙරකලාසි අයදුම් පත | 70 |

# දැක්ම

වඩාත් විද්‍යානුකූලව හා ලාභදායීව පාලනය කරනු ලබන ශ්‍රී ලංකාවේ හොඳම පොල් ආශ්‍රිත වැවිලි සමාගම බවට පත්වීම.

# මෙහෙවර

පොල් වගාවේ සම්පත් හා වත්කම් විද්‍යාත්මකව සහ වානිජ්‍යමය ලෙස සංවර්ධනයෙන් තිරසාර වූ ඉහළ ලාභයක් සමඟම විභව ඵලදාවක් සහ ඵලදායීතාවයක් ලැබීමට කැපවීමෙන් කටයුතු කරන අපේ ප්‍රවීන කාර්ය මණ්ඩලය දිරිමත්ව බල ගැන්වීමෙන් වත්මන් මෙන්ම අනාගත සියලු කොටස්කරුවන්ට වාසි අත්වන අන්දමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යයක් බවට පත්කිරීමේ මහඟු ජාතික ක්‍රියාවලියට දායක වෙමු.

## මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා

| | 2016 | 2015 | වෙනස % |
|---|---|---|---|
| පොල් නිෂ්පාදනය (ගෙඩි '000) | 16,522 | 12,517 | 32 |
| **සාරාංශ ප්‍රතිඵල** | **Rs' 000** | **Rs' 000** | **%** |
| ආදායම | 383,090 | 399,366 | (4.08) |
| දළ ලාභය | 148,707 | 148,748 | (0.03) |
| පොලිය සහ බදු පෙර ලාභය | 117,604 | 119,909 | (1.92) |
| බදු පෙර ලාභය | 84,817 | 88,293 | (3.94) |
| බදු පසු ලාභය | 70,764 | 81,444 | (13.11) |
| රඳවාගත් ලාභය | 633,886 | 598,277 | 5.95 |
| දැව සංචිතය | 61,841 | 56,686 | 9.09 |
| ගෙවන ලද ලාභාංශ | - | 30,000 | - |
| සමුච්චිත මුළු ලාභාංශ | 426,650 | 426,650 | - |
| **මූල්‍ය තත්ත්වය** | | | |
| ජංගම නොවන වත්කම් | 966,343 | 886,295 | 9.03 |
| මේරූ/නොමේරූ වගා | 728,533 | 653,071 | 11.55 |
| ජංගම වත්කම් | 312,333 | 256,882 | 21.59 |
| තොග | 104,999 | 47,613 | 120.53 |
| කෙටි කාලීන ආයෝජන (ස්ථාවර තැන්පත්) | 140,868 | 152,646 | (7.72) |
| මුළු වත්කම් | 1,278,676 | 1,143,177 | 11.85 |
| ජංගම වගකීම් | 134,591 | 54,740 | 145.87 |
| ජංගම නොවන වගකීම් | 248,358 | 233,474 | 6.38 |
| කොටස් ප්‍රාග්ධනය | 200,000 | 200,000 | - |
| කොටස්කරුවන්ගේ අරමුදල් | 895,727 | 854,963 | 4.77 |
| **මූලික දර්ශක** | | | |
| ජංගම අනුපාතය (වාර) | 2.32 | 4.69 | (50.55) |
| ක්ෂණික අනුපාතය (වාර) | 1.54 | 3.82 | (59.70) |
| දළ ලාභ අනුපාතය | 38.82 | 37.25 | 1.57 |
| කොටසක ඉපැයීම රු. | 3.48 | 3.93 | (11.45) |
| සාමාන්‍ය ස්කන්ධයට ආපසු ලැබීම් (ROE)% | 8.08 | 10.19 | (2.10) |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE)% | 10.28 | 11.02 | (0.74) |
| මුළු වත්කම්වලට ජංගම වගකීම් | 0.11 | 0.05 | 119.82 |
| කොටස්කරුවන්ගේ අරමුදල් අනුපාතය | 70.05 | 74.79 | (4.74) |
| පොලී ආවරණය (වාර) | 3.59 | 3.79 | (5.43) |

## සභාපතිතුමා/ප්‍රධාන විධායක නිලධාරිගේ පණිවිඩය

2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සීමාසහිත හලාවත වැවිලි සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් වත්මන් සභාපති වශයෙන් ඉදිරිපත් කිරීමට ලැබීම සම්බන්ධයෙන් මම ඉතාමත් සතුටට පත්වෙමි.

හලාවත වැවිලි සමාගම වර්ෂ 1992 සිට වසර 16 ක පෞද්ගලික කළමනාකරණයෙන් පසුව වර්ෂ 2008 දී කළමනාකාරිත්වය නැවත රජය වෙත පවරා ගන්නා ලදී. හලාවත වැවිලි සමාගමෙහි කළමනාකාරිත්වය රජයට පවරාගත් වර්ෂ 2008 න් පසුව සමස්ත සේවකයින්ගේ කැප වීම තුළින් වර්තමානය වන විට හලාවත වැවිලි සමාගම තිරසාර සංවර්ධනයක් අත්කරගෙන ඇති බව සතුටින් ප්‍රකාශ කරන්නෙමි.

හලාවත වැවිලි සමාගමට අක්කර 14,161ක වගා වපසරියක් හිමි අතර, එතුළින් ආසන්න වශයෙන් අක්කර 9,450 ක භූමි ප්‍රමාණයකට හිමිකම් කියමින් මුළු භූමි ප්‍රමාණයෙන් 67 % ට ආසන්න පොල් වගාවකින් සමන්විත වන අතර, එය පුත්තලම, කුරුණෑගල හා ගම්පහ යන දිස්ත්‍රික්කයන් තුළ වතු ඒකක 85 ක් ලෙස පිහිටා ඇත. වතු ඒකක 85 වතු කලාප 06 ක් යටතේ ඵලදායිතාවයකින් යුතුව කළමනාකරණය කරනු ලැබේ. එම පොල් වගා වපසරිය තුළින් 27 % ක පොල් යටි වගාවන් ස්ථාපිත කොට ඇත. හලාවත වැවිලි සමාගමෙහි ඇති සමස්ත පොල් ගස් ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් අවුරුදු 50 ඉක්මවා ඇති බැවින් ඉදිරියේදී එතුළින් ඇතිවන්නා වූ අවධානම් තත්ත්ව හඳුනාගනිමින් අද වන විට අක්කර 2,535 ක පොල් පැළ වගාව ව්‍යාප්ත කිරීමට අප සමත් වී ඇත.

### බෝග විවිධාංගීකරණය හා සත්ව පාලනය

තිරසාර සංවර්ධනයක් කරා හලාවත වැවිලි සමාගම ගමන් කිරීමේදී එහි භූමිය උපරිම හා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට අප උත්සාහ කරන අතර, එහි ප්‍රතිඵලය ලෙස හලාවත වැවිලි සමාගම සතුව අතුරු බෝග අක්කර 2,260 ක් කජු, රඹුටන්, ගම්මිරිස්, කුරුඳු, ඩ්‍රැගන් ෆෘට්, බද්ධ අඹ හා අන්නාසි ලෙස විවිධ වතු කොට්ඨාසයන් තුළ සාර්ථකව ස්ථාපිත කර ඇත. ඉහත වගාවන් තුළින් අන්නාසි, අඹ, කුරුඳු, ඩ්‍රැගන් ෆෘට් හා ගම්මිරිස් වැඩි ප්‍රමාණයක් තවමත් පැළ අවධියෙහි පවතී. කෙසේ වෙතත් 2016 වර්ෂ අවසානයේදී අතුරු බෝග වගා මගින් රුපියල් මිලියන 23 ක පමණ ආදායමක් ඉපැයීමට සමත් විය.

දකුණු ආසියාවේ විශාලතම පොල් වත්ත ලෙස හඳුන්වනු ලබන පළුගස්වැව වත්ත තුළ සාර්ථකව සිදුවන මී ගව පාලන ව්‍යාපෘතිය තුළින් මී කිරි හා යෝගට් නිෂ්පාදනය ද ඉතා සෞඛ්‍ය ආරක්ෂිතව නිෂ්පාදනය කරමින් 2016 වර්ෂය ඇතුළතදී කිරි ලීටර් 37,372 ක නිෂ්පාදනය පාදක කරමින් මුදවපු මී කිරි හා යෝගට් නිෂ්පාදනය තුළින් රුපියල් මිලියන 7.06 ක ආදායමක් ඉපැයීමට ද සමත් විය. මීට අමතරව බිංගිරිය කිණියම වත්ත තුළ පැවති බැටළු පාලන ව්‍යාපෘතියට අමතරව 2016 වර්ෂයේදී බැටළු පාලන නව ව්‍යාපෘතියක් මාදම්පේ වතු සමූහයේ හීම්මැලියාගාර වත්ත පාදක කරමින් ආරම්භ කිරීමට ද සමත්විය.

### අගය එකතු කරනු ලැබූ නිෂ්පාදන වෙත යොමු වීම

රාජ්‍ය ආයතනයක් වශයෙන් හලාවත වැවිලි සමාගම එකම නිෂ්පාදනයක් කෙරෙහි අවධානය යොමු නොකරමින් විවිධ අගය එකතු කරනු ලබන නිෂ්පාදන වෙළඳපොළට එකතු කිරීමට සමත් වී ඇති බව ඉතාමත් සතුටින් දැක්විය හැකිය. සංවර්ධනයේ අරුණලු ළඟාකරගැනීමේදී හලාවත වැවිලි සමාගම අනෙකුත් වැවිලි සමාගම් හට අභියෝගයක් ඇති කරමින් රාජ්‍ය ආයතනයක කාර්යභාරය නිසි පරිදි හඳුනාගෙන ඇති ආයතනයක් ලෙස හලාවත වැවිලි සමාගම හැඳින්විය හැකිය. එහි ප්‍රතිඵල වශයෙන් පළුගස්වැව වත්ත මූලික කරගනිමින් සිදු කරන, ඉතා උසස් කොප්පරා නිෂ්පාදනය, බෝතල් කරනු ලබන පිරිසිදු පොල් තෙල් නිෂ්පාදනය, අත්පරාගනය මගින් ජානමය වශයෙන් උසස් කරනු ලැබූ TSR බීජ පොල් දැක්විය හැකිය. මීට අමතරව තම්භපණ්ණි වත්ත තුළ ස්ථාපිත පිරිසැකසුම් කරනු ලබන කජු නිෂ්පාදන මධ්‍යස්ථානය "තම්භපණ්ණි කජු නමින්" කජු වෙළඳපොළ තුළ සන්නාමක නාමයක් ගොඩනැගීමට අප සමත් වී ඇත. එමෙන්ම කජු හා පොල් තෙල් නිෂ්පාදන අලෙවිය සඳහා සාර්ථක අලෙවි යාන්ත්‍රනයක් හඳුන්වාදීමට කළමනාකාරිත්වයට හැකි විය.

මීට අමතරව වසර ගණනාවක් අකර්මන්‍ය වී ඇති පළුගස්වැව වත්ත තුළ ස්ථාපිත කොහු නිෂ්පාදනාගාරයේ කටයුතු ද නැවත ආරම්භ කිරීම කෙරෙහි සැලසුම් සකස්කරමින් සිටින බව දැක්වීමට කැමැත්තෙමි.

### වර්ෂය තුළදී හලාවත වැවිලි සමාගම ලබා ඇති ප්‍රගතිය

හලාවත වැවිලි සමාගම අවස්ථානුකූලව කළමනාකාරිත්වය ක්‍රියාත්මක කරනු ලැබූ ක්‍රමෝපායන් තුළින් හා පැවති හිතකර දේශගුණික තත්ත්වය මත වසර 05 කට පසුව හලාවත වැවිලි සමාගම ලබාගත් ඉහළම පොල් අස්වැන්න ලෙස පොල් ගෙඩි මිලියන 16.5 ක පමණ විශාල අස්වැන්නක් 2016 වසර ඇතුළතදී ලබා ගැනීමට සමත් වූ අතර, එය 2015 වර්ෂයට සාපේක්ෂව 32 % ප්‍රගතියක් පෙන්නුම් කිරීමකි.

2016 වර්ෂ අවසානයේදී හලාවත වැවිලි සමාගම රුපියල් මිලියන 70.7 ක බදු පසු ලාභයක් ඉපැයූ අතර එය 2015

වර්ෂයේදී ඉපැළු බදු පසු ලාභය වන රුපියල් මිලියන 81.4 ට සාපේක්ෂව 13 % ක අඩු වීමකි. මෙම ලාභය අඩුවීම කෙරෙහි මෙම වර්ෂයේ පොල් ගෙඩියක විකුණුම් මිල 2015 වර්ෂයට සාපේක්ෂව 17 % කින් අඩු වීම බලපාන ලදී.

හලාවත වැවිලි සමාගම රාජ්‍ය සමාගමක් ලෙස එහි හිමිකරු වන මහා භාණ්ඩාගාරය වෙත 1992 වර්ෂයේ සිට වර්ෂ 2015 දී ගෙවනු ලැබූ රුපියල් මිලියන 30 ද ඇතුළුව මේ දක්වා රුපියල් මිලියන 426 ක මුදලක් ලාභාංශ ලෙස ලබා දීම සිදුකර ඇත. එමෙන්ම කල්බදු ලෙස ද රුපියල් මිලියන 350 ක් පමණ මහා භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත.

## වතු යටිතල පහසුකම් දියුණු කිරීම සමඟ කෘෂිකාර්මික කටයුතු

වතුවල කෘෂිකාර්මික කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා වතු වෙත ප්‍රමාණවත් කෘෂි උපකරණ හා යන්ත්‍ර ලබා දීමේ සාර්ථක වැඩපිළිවෙලක් වර්ෂ 2015 දී ආරම්භකර එහි දෙවන අදියර ලෙස 2016 වර්ෂය තුළදී පමණක් රුපියල් මිලියන 7.6 ක පමණ ආසන්න මුදලක් ප්‍රාග්ධන වියදම් යටතේ කෘෂි උපකරණ හා ට්‍රැක්ටර් මිලදී ගැනීම වෙනුවෙන් වැය කර වතු කාර්යයන් කාර්යක්ෂම කිරීමට ද සමත් වී ඇත.

කාර්ය සාධනය ඉහළ නැංවීමේ ක්‍රමෝපායක් ලෙස වතු කම්කරු නිවාස අලුත්වැඩියා කිරීම, නව නිවාස ඉදිකිරීම, විදුලි අවශ්‍යතා සම්පූර්ණ කිරීම හා ජල අවශ්‍යතාවයන් සැපයීම කෙරෙහි හලාවත වැවිලි සමාගම නිරන්තරයෙන් කැප වන අතර, ඒ සඳහා ද 2016 වර්ෂය තුළදී මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර සුභසාධන කටයුතුවල ප්‍රගතියක් අත්කර ගැනීමට ද සමත්වී ඇත.

හලාවත වැවිලි සමාගමෙහි ඉදිරි අනාගතය මෙන්ම සාර්ථකත්වය ද, කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම මත තීරණය වීම නිසා නිරන්තරයෙන් කෘෂිකාර්මික කටයුතු කෙරෙහි අවධානයෙන් පසුවන අතර, වාර්ෂිකව සැලසුම් මඟින් එම පිළිවෙත්වල සාර්ථක ප්‍රගතියක් අත්කර ගැනීමට ද හැකියාව ලැබී ඇත. එහිදී පොල් පැළ වගාව හා එළදරන වගාව නඩත්තු කිරීම, ජල සංරක්ෂණ කටයුතු, රසායනික හා කාබනික පොහොර යෙදීම හා ජල අවශ්‍යතාවයන් හිදී ජල සම්පාදනය කැපී පෙනෙන අංගයන් වනු ඇත.

හලාවත වැවිලි සමාගමෙහි වතු බොහොමයක් වියළි කලාපය තුළ පැතිරී පැවතීම මත වාර්ෂිකව ඇතිවන ජල හිඟයට පිළියමක් ලෙස හලාවත වැවිලි සමාගම තිරසාර ක්‍රමවේදයන් යටතේ හඳුනාගන්නා ලද පුරන්ව පැවති පතස් 12 ක් වර්ෂ 2015 දී ප්‍රතිසංස්කරණය කිරීමේ මූලික කාර්ය ආරම්භ කොට 2016 වර්ෂය අවසානය තෙක් ක්‍රියාත්මක වන ලදී. මෙම කාලයන් ඇතුළතදී හලාවත වැවිලි සමාගමෙහි වතු කොට්ඨාශ 07 ක ජල සංඡායක ස්ථාන 12 ක් අලුතෙන් නිර්මාණය කිරීමට හා ප්‍රතිසංස්කරණය කිරීමට හැකි වූ අතර, එතුළින් දෙවර්ෂය ඇතුළතදී රුපියල් මිලියන 24 ක පමණ මුදලක් අමතර ආදායමක් සමාගමෙහි මූල්‍ය ප්‍රවාහයට එකතු කිරීමට සමත් විය.

## හලාවත වැවිලි සමාගම ලැබූ ජයග්‍රහණයන්

වර්ෂය තුළ ලැබූ අපගේ ජයග්‍රහණයන් සහ සමාජයට කරන ලද මෙහෙවර ඇගයීමට ලක් විය. ව්‍යවස්ථාපිත බැඳීම් ඉටු කිරීම තුළින් අපගේ සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අප ඉටු කළ වගකීම සහ දැක්වූ සැලකිල්ල අගයමින් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලයේ සම්මානයට පාත්‍ර විය.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයෙහි විෂය පථයට අයත් රජය සතු සමාගමක් වශයෙන් අපගේ බලාපොරොත්තුව ලෙස සියළුම අංශයන්ගෙන් තිරසාර සංවර්ධනයක් ඇතිකර ගැනීම හා එහි ප්‍රතිඵල රටෙහි සමස්ථ මහජනතාව සමග හුවමාරුකර ගැනීම වේ.

## තුති පිදුම

හලාවත වැවිලි සමාගම ලාභදායි ලෙස හා සමස්ත රටෙහි ජනතාවට වඩාත් ප්‍රයෝජනවත්ව රටෙහි සමස්ත සම්පත් පරිහරණය කරවීමට අවශ්‍ය මගපෙන්වීම දෙනු ලබන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධ අමාත්‍යාංශයේ විෂයභාර ගරු අමාත්‍යතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ද, හලාවත වැවිලි සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ හලාවත වැවිලි සමාගමෙහි දියුණුවට කැපවන සියලුම අංශයන් නියෝජනය කරන නිලධාරී මඬුල්ලටද, සේවක හා කම්කරුවන් සියලුම දෙනාට ද ඉහත ආයතනික ප්‍රගතිය අත්කරගැනීමට උරදීම වෙනුවෙන් මාගේ කෘතඥතාවය පුද කර සිටිමි.

වී.කේ.සී. හේරත්
**සභාපති**
සී/ස හලාවත වැවිලි සමාගම

## අධ්‍යක්ෂ මණ්ඩලය

**වී.කේ.සී. හේරත් මහතා**
**(සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී)**
අංක 86, බෞද්ධාලෝක මාවත, කුරුණෑගල.

**එම්.කේ.බී. සෙනවිරත්න මහතා (නීතිඥ)**
**(විධායක අධ්‍යක්ෂ)**
අංක 14, ලේඩි ගෝර්ඩන්ස් ඩ්‍රයිව්, මහනුවර.

**පී.බී.එස්.සී. නෝනිස් මහතා**
**(අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත)**
අධ්‍යක්ෂ ප්‍රසම්පාදන අධීක්ෂණ අංශය - මුදල් අමාත්‍යාංශය

**ඒ. ලක්කතාස් මහතා**
**(අධ්‍යක්ෂ)**
**අතිරේක ලේකම් - (වැවිලි සහ කර්මාන්ත)**
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

**කේ.ජී. ආනන්ද පුෂ්පකුමාර මහතා**
**(අධ්‍යක්ෂ)**
"පුෂ්පවිලා" අම්බාව, කුලියාපිටිය.

**එච්.එම්.එන්.සී. හේරත් මහතා**
**(අධ්‍යක්ෂ)**
ඉදිවින්න වත්ත, වෙල්පල්ල (වයඹ)

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

### ප්‍රධාන කාර්යාලය

| | | | |
|---|---|---|---|
| 01. | වී.කේ.සී. හේරත් මහතා | - | සභාපති/ප්‍රධාන විධායක නිලධාරි |
| 02. | එම්.කේ.බී. සෙනවිරත්න මහතා | - | විධායක අධ්‍යක්ෂ |
| 03. | කේ.ජී. ආනන්ද පුෂ්පකුමාර මහතා | - | ක්‍රියකාරි අධ්‍යක්ෂ |
| 04. | ඩී.ජී.ඒ.ආර්. ඩී සිල්වා මහතා | - | නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (වැවිලි) |
| 05. | ඩබ්.එල්.ඩී. ප්‍රනාන්දු මහතා | - | සහකාර සමාන්‍යාධිකාරි (වැවිලි ඉන්ජිනේරු) |
| 06. | බී. හෙට්ටිආරච්චි මහතා | - | සහකාර සමාන්‍යාධිකාරි (වැවිලි) |
| 07. | ආර්.එම්.ආර්.බී. රත්නායක මහතා | - | ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි |
| 08. | එච්.පී.එම්.ඩබ්. හේමචන්ද්‍ර මහතා | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 09. | එම්.එම්. මර්ලි මහතා | - | වතු කළමනාකාර |
| 10. | ඒ.ඒ. අශෝක ආනන්ද මහතා | - | වතු කළමනාකාර |
| 11. | ඩබ්.කේ. ප්‍රදීප් මහතා | - | කළමනාකාර (තාක්ෂණ හා සංවර්ධන) |
| 12. | ඒ.එම්.ටී.එච්.බී. අතපත්තු මහතා | - | කළමනාකාර (මානව සම්පත් හා පාලන) |
| 13. | එම්.කේ.එන්. අබේධීර මහතා | - | කළමනාකාර (මුල්‍ය) |
| 14. | ඒ.එන්.ඒ.එස්. කරුණාතුංග මහතා | - | කළමනාකාර (අලෙවි) |
| 15. | පී.එන්.එන්. ගුණසීල මෙනවිය | - | කළමනාකාරිනි (සැලසුම් සහ පසුවිපරම්) |

### වතු අධිකාරිවරුන්

| | | | |
|---|---|---|---|
| 16. | ජේ.එච්. ප්‍රනාන්දු මහතා | - | වතු අධිකාරි, පලුගස්වැව වත්ත |
| 17. | ජී.එම්.ඒ. කරුණාතිලක මහතා | - | වතු අධිකාරි, හලාවත වතු කලාපය |
| 18. | ඩී.එම්.ජී.ඒ. දිසානායක මහතා | - | වතු අධිකාරි, බිංගිරිය වතු කලාපය |
| 19. | එම්.ජී.සී. ඩයස් මහතා | - | වතු අධිකාරි, දිවුලපිටිය වතු කලාපය |
| 20. | බි.එම්.යු.බී. බස්නායක මහතා | - | වතු අධිකාරි, මාදම්පේ වතු කලාපය |
| 21. | ඒ.එම්.ඩී. ගුණතිලක මහතා | - | වතු අධිකාරි, තම්බපන්නි වතු කලාපය |

# කළමනාකාර විමසුම

## හලාවත වැවිලි සමාගම පිළිබඳව කෙටි හැඳින්වීම

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන ලාභදායි රාජ්‍ය වැවිලි සමාගමක් ලෙස හලාවත වැවිලි සමාගම හැඳින්විය හැකිය. හලාවත වැවිලි සමාගමෙහි පොල් වතු හා අනෙකුත් ඉඩම් කුරුණෑගල, ගම්පහ හා පුත්තලම යන දිස්ත්‍රික්කයන් මූලික කරගනිමින් ව්‍යාප්තව ඇති අතර, මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 14,161 කි. එම ප්‍රමාණයෙන් අක්කර 9,450 ක පොල් වගාවද, අනෙකුත් ඉඩම් ද විවිධ කෘෂිකාර්මික හා පාරිසරික කටයුතු වෙනුවෙන් යොදවා ඇත. පළුගස්වැව වත්ත, හලාවත, බිංගිරිය, මාදම්පේ, දිවුලපිටිය හා තම්බපණ්ණි වතු කලාපය ලෙස ප්‍රධාන වතු කලාප 06 ක් යටතේ වතු කළමනාකරණය වන අතර, ඒ යටතේ වතු ඒකක 85 ක් පාලනය වේ.

මෙම වතු කලාපයන් පහත රට වියළි හා අතරමැදි කෘෂි දේශගුණික කලාපයන් යටතේ පිහිටා ඇත. ඒ ඒ දේශගුණික තත්ත්වයන්ට උචිත වන පරිදි කෘෂි බෝගයන් සාර්ථකව ව්‍යාප්ත කර ඇති අතර, පොල් වගාවට අමතරව අතුරු බෝගයන් ලෙස කජු, රඹුටන්, ඩ්‍රැගන් ෆෲට් හා අන්නාසි පලතුරු වශයෙන් ද, කුළුබඩු වශයෙන් ගම්මිරිස් හා කුරුඳු ද වගාකර ඇත.

සත්ව පාලනය යටතේ මී ගව පාලනය හා බැටළු සත්ව පාලන ව්‍යාපෘතින්ගෙන් සමන්විත බෝග විවිධාංගීකරණය කරන ලද හා ඉඩම් උපරිමව, කාර්යක්ෂමව හා ඵලදායිව පරිහරණ රටාවකින් යුක්ත සමාගමක් ලෙස ද හැඳින්විය හැකිය. මීට අමතරව අගය එකතුකරනු ලබන භාණ්ඩයන් ලෙස උසස් කොප්පරා, පිරිසිදු පොල් තෙල් නිෂ්පාදනය, පිරිසැකසුම් කරනු ලැබූ කජු නිෂ්පාදනය මෙන්ම මී ගව පාලන ව්‍යාපෘතිය තුළින් උසස් ගුණාත්මයෙන් යුතු මී කිරි හා යෝගට් නිෂ්පාදනය කිරීමේලා ප්‍රමුඛතාවය ලබා දී ඇත.

වසර 16 ක පෞද්ගලික කළමනාකරණ කාල පරිච්ඡේදය ඇතුළත දී ප්‍රමාණවත් පරිදි පොල් යටි වගාවන් ස්ථාපිත කිරීමට කටයුතු නොකර තිබූ අතර, වර්ෂ 2008 සිට 2016 දක්වා අක්කර 2,619 ක පමණ පොල් යටි හා නව වගාවන් ආරම්භ කිරීමට හලාවත වැවිලි සමාගම සමත් වී ඇත. ඇතිවන්නා වූ පාරිසරික සාධකයන්ගේ අයහපත් බලපෑම් මත හලාවත වැවිලි සමාගමෙහි වාර්ෂික පොල් නිෂ්පාදනය කෙරෙහි ඉහල බලපෑමක් එල්ලකරමින් පවතී. කෙසේ වෙතත් මෙම සාධකයන්ගේ බලපෑම තිරසාර කළමනාකාරිත්වය තුලින් හා නිසි කෘෂි කාර්මික පිළිවෙත් තුලින් අවම කර ගැනීමට සමත් වී ඇත. කෙසේ වෙතත් මෙම කාල පරිච්ඡේදයේ දී ආරම්භ කරන්නා වූ හා ආරම්භකර ඇති යටි වගාවන් ප්‍රශස්ථ ඵලදරන අවධියට පැමිණීමට තවත් වසර 10 - 15 ක් පමණ ගත විය හැකි අතර, එම කාලපරිච්ඡේදයේදී වර්තමානයේ දී හලාවත වැවිලි සමාගම ජාතික පොල් නිෂ්පාදනයට ලබාදෙන්නා වූ දායකත්වයට වඩා ඉහළ දායකත්වයක් ලබා දීමට කටයුතු යෙදීම අපගේ අපේක්ෂාවයි.

## මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශ ගෙවීම

හලාවත වැවිලි සමාගම ප්‍රාදේශීය වැවිලි සමාගම් අතුරින් විශිෂ්ට වැවිලි සමාගම ලෙස තිරසාර විද්‍යාණුකූල කළමනාකරණය තුළින් අවංකව, ඵලදායිව/කාර්යක්ෂමව සමස්ථ සේවකයින් හා මහජනතාව වෙනුවෙන්, මහා භාණ්ඩාගාරය හා රජය වෙනුවෙන් පෞද්ගලීකරණයෙන් තොරව රාජ්‍ය ව්‍යවසායන් කළමනාකරණය කරමින් එහි නිෂ්පාදන හා උපරිම ලාභාංශයන්හි ප්‍රතිලාභ අත්කර දෙමින් ව්‍යවස්ථාපිත ගෙවීම් (ඊ.පී.එෆ්/ ඊ.ටී.එෆ්/ පාරිතෝෂික), කාර්‍යය මණ්ඩලය වෙත ත්‍යාගයන් හා දිරිදීමනා පිරිනැමීමද සමඟ එහි හිමිකරු වන මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 426 ක මුදලක් ලාභාංශ ලෙස ලබා දීම මෙන්ම භාවිතා කරන්නාවූ ඉඩම් සඳහා බදු කුලිය ලෙස ද රුපියල් මිලියන 350 ක් පමණ මහා භාණ්ඩාගාරය වෙත ලබා දීමද සිදුකර ඇත.

## පොල් ඉඩම් විවිධාංගීකරණය අගය එකතු කළ නිෂ්පාදන

පළුගස්වැව වත්ත තුළ නිෂ්පාදනය කරන්නා වූ අංක එකෙහි සුදු කොප්පරා භාවිතා කරමින් එහි ස්ථාපිත පොල් තෙල් මෝල මඟින් පොල් තෙල් නිෂ්පාදනය කරන අතර, එම නිෂ්පාදන අපගේ අලෙවි මධ්‍යස්ථාන තුළින් හා අලෙවි අංශ තුළින් බෝතල් තුළ ඇසුරුම් කර අලෙවිකරණය සිදු වේ. විශේෂයෙන් 2016 වර්ෂයේ සිට මහජනතාව වෙත අපගේ කොළඹ අලෙවි ස්ථානය තුළින් අලෙවි කරන අතර, එහි නිෂ්පාදන ගුණාත්මය සමඟ වෙළඳ පොළ ඉල්ලුම ඉහලයමින් පවතී.

පිරිසැකසුම් කරන ලද කජු සඳහා පවතින ඉල්ලුම මත අප විසින් තම්බපණ්ණි වත්ත තුළ ස්ථාපිත කජු පිරිසැකසුම් මධ්‍යස්ථානයේ නිෂ්පාදන කටයුතු ආරම්භකර කර ඇති අතර, එහි නිෂ්පාදන අපගේ අලෙවි ස්ථාන තුළින් අලෙවි කිරීම කරනු ලැබේ. හලාවත වැවිලි සමාගම තුළ හෙක්ටයාර් 800 කට වඩා කජු වගාවක් පවතින අතර, එහි වාර්ෂික නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 60,000 - 70,000 ක් පමණ වේ. එම නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් ලෙලි කජු ලෙස අලෙවි කරන අතර, කොටසක් තම්බපණ්ණි වත්ත තුළ ආරම්භ කරන ලද කජු පිරිසැකසුම් මධ්‍යස්ථානය සඳහා මූලික අමුද්‍රව්‍ය ලෙස ලබා ගනිමින් කජු පිරිසැකසුම් කරනු ලැබේ.

පළුගස්වැව වත්ත තුළ සාර්ථකව සිදුවන මී ගව පාලන ව්‍යාපෘතිය තුළින් නිෂ්පාදිත මී කිරි සඳහා විශාල ඉල්ලුමක් පවතින අතර, දෛනික නිෂ්පාදිත ප්‍රමාණය පැය කිහිපයක් ඇතුළතදීම පළුගස්වැව ස්ථාපිත අලෙවි කුටිය තුළින් අලෙවි වීම සිදුවේ. එබැවින් ඒ සඳහා නිෂ්පාදන ධාරිතාවය ඉදිරි වර්ෂය ඇතුළතදී වැඩිකිරීමට බලාපොරොත්තු වේ.

එමෙන්ම මී කිරි යෝගට් නිෂ්පාදන සඳහා ද සැපයිය නොහැකි ඉල්ලුමක් පවතී.

පවතින භූමිය උපරිම හා ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට අපගේ අවධානය යොමු වී ඇති අතර, එහි ප්‍රතිඵලය ලෙස යෝග්‍ය ඉඩම් අතුරු බෝග වගාව සඳහා යොමුකර ඇත. මේ වන විට අතුරු බෝගයන් ලෙස කජු, ඩ්‍රැගන් ෆෘට්, ගම්මිරිස්, කුරුඳු, රඹුටන් හා අන්නාසි වගාකර ඇත.

උසස් ගුණාත්මයෙන් යුතු බීජ පොල් නිෂ්පාදනය උදෙසා පොල් පර්යේෂණ ආයතනය හා එක්ව කිණියම වත්තේ පිහිටි බීජ පොල් උයනක් ස්ථාපිත කර ඇති අතර, එමගින් ඵලදායිතාවය හා තිරසාරත්වය ඉහළ නැංවීම බලාපොරොත්තු වේ.

### කම්කරු හිඟතාවය හා යාන්ත්‍රීකරණය

පවතින කම්කරු හිඟතාවය මත වතුවල අවශ්‍යතා වෙනුවෙන් කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කම්කරුවන් බාහිරින් ලබා ගන්නා අතර, ඒ සඳහා විකල්පයක් ලෙස පොහොර යෙදීම වැනි කාර්යයන් යාන්ත්‍රීකරණය කිරීමට සැලසුම් කරමින් පවතී.

### මහා පරිමාණ පොල් වගාවන් සඳහා පවතින අවදානම් තත්ව

වැවිලි කර්මාන්තයේදී පවතින ප්‍රධානතම බාධකය ලෙස වර්ෂා රහිත දිගු වියලි දේශගුණික තත්වයන් සඳහන් කළ හැකිය. තරමක් දුරට එම තත්ත්වයන් මඟහැරවීම පිණිස ප්‍රයෝජනයකින් තොරව වැසි ජලය මහ මුහුදට ගලා බැසීම අවම කරමින් උපරිම වශයෙන් වැසි ජලය වත්ත තුළ රඳවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගෙන ඇත. එමගින් පාංශු තෙතමනය ආරක්ෂාවීම මෙන්ම එක්රැස් ජලය යටි වගාවන්, නව වගාවන් සහ ඵලදරන වගාවන් අවශ්‍ය විට ජල සම්පාදනය කිරීමට යොදා ගැනීම කරනු ලැබේ.

ඒ අනුව කුඩා ජල සංචායක/පතස් 12 ක් අපගේ වතු කොට්ඨාසයන් තුළ ඇති කිරීමට හැකිවූ අතර, මාදම්පේ ගල්වාගාර හා හීම්මැලියාගාර වතු තුළ 04 ක්, සෙම්බුකට්ටිය වත්ත තුල 02 ක්, දිවුලපිටිය කටුකෙන්ද වත්ත තුල 02 ක්, සිරිලන්ද වත්ත තුළ 02 ක් සහ බිංගිරිය අතුරුමන්ද වත්ත තුළ 02 ක් ලෙස කුඩා ජල සංචායක ඇති කරන ලදී.

මීට අමතරව පියුරේරියා ආවරණ බෝගයක් ලෙසද ග්ලිරිසීඩියා සෙවන ශාකයක් ලෙසට වගාකර ඇත. එමගින් ප්‍රමාණවත් කාබනික පොහොර පසට ලබාදීම, පාංශු තෙතමන සංරක්ෂණයට උපකාර වන අතර, රනිල කුලයේ බෝග නයිට්‍රජන් තිරකාරකයක් ලෙසටද ක්‍රියාකරයි.

පොල් කර්මාන්තය මුහුණපාන අනෙකුත් ප්‍රධානතම අවදානම් හා තර්ජනයක් ලෙස පොල් තෙල් සඳහා ඇති ආදේශකයක් ලෙස මහ පරිමාණයෙන් මෙරටට ආනයනය කරනු ලබන පාම් තෙල් හා එළවළු තෙල් දැක්විය හැකිය. එම තත්වය පොල් තෙල් මෝල් සඳහා බලපෑමක් ඇතිකිරීම, පොල් කොහු සඳහා ආදේශක ලෙස පවතින නයිලෝන් හා ප්ලාස්ටික් නිෂ්පාදන භාණ්ඩයන් කොහු නිෂ්පාදන කර්මාන්තය සඳහා බලපෑමක් ඇතිකරනු ලැබේ. ඒ අනුව පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයන්හි ඉල්ලුම මෙම තත්වය මත පහල යන අතර, මාළු පොල් අවශ්‍යතාවයද ඉහළයාම තවදුරටත් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා අහිතකර ලෙස බලපා ඇත.

### මානව සම්පත් ප්‍රතිපත්ති

වැවිලි කළමනාකරණයේදී හා සංවර්ධනයේදී මානව සම්පත වැදගත් සම්පතක් ලෙසට හා වත්කමක් ලෙසට සලකන අතර, ඉහළ කෘෂිකාර්මික නිෂ්පාදනයක් හා තිරසාර ලාභයන් අත්කර ගැනීමෙහිලා එකී සම්පත වැදගත් සාධකයක් ලෙස දැක්විය හැකිය. මූලිකව වතු මට්ටමේ වතු අධිකාරීවරුන්, සහකාර වතු අධිකාරීවරුන්, ක්ෂේත්‍ර නිලධාරීන්, වතු කළමනාකරණ සහකාර සහ සහයෝගික කාර්ය මණ්ඩලය, මුරකරුවන්, කම්කරුවන් යන අය වෙත මූලික අවශ්‍ය යටිතල පහසුකම් සමග වතු බංගලා සහ නිල නිවාස නේවාසිකව සිටීම සඳහා ලබාදෙමින් දැනුම සමග කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් සහ වැඩමුළු ඔවුන් වෙත සංවිධානය කිරීම කරනු ලැබේ.





ව්‍යවස්ථාපිත බැඳීම් ඉටුකිරීම තුළින් අපගේ සේවක අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් 2016 වර්ෂයේදී සේවක භාරකාර අරමුදල් මණ්ඩලයේ සම්මානයට පාත්‍ර විය.

## පොල් ඵලදායීතාවය

හලාවත වැවිලි සමාගම විසින් පාලනය කරනු ලබන හෙක්ටයාර් ප්‍රමාණය 5733.23 වන අතර, එතුළින් හෙක්ටයාර් 3825.94 ක් පොල් වගා කර ඇත. එම ඉඩම් පුත්තලම සිට කටුනායක දක්වා මුහුදුබඩ තීරුවෙහිද, දිවුලපිටිය සිට නිකවැරටිය දක්වා ගොඩබිම් සීමාව ඇතුලත වියළි, අතර මැදි හා තෙත් යන විවිධ දේශගුණික තත්වයන් යටතේ පිහිටා ඇත. එහි විස්තර පහත පරිදි වේ,

| | වතු කලාපය | වපසරිය (හෙක්.) | කලාපය |
|---|---|---|---|
| 1 | බිංගිරිය වතු කලාපය | 1,509.66 | අතරමැදි |
| 2 | හලාවත වතු කලාපය | 645.57 | අතරමැදි |
| 3 | දිවුලපිටිය වතු කලාපය | 424.49 | තෙත් |
| 4 | මාදම්පේ වතු කලාපය | 655.86 | තෙත් |
| 5 | පලුගස්වැව වත්ත | 672.22 | අතරමැදි |
| 6 | තම්බපණ්ණි වතු කලාපය | 1,825.43 | වියළි |

## ජාතික මට්ටමේ පොල් නිෂ්පාදනය

| වසර | පොල් අස්වැන්න (ගෙඩි) | වෙනස % | ඵලදාව දෙන ගස් ප්‍රමාණය | වෙනස % | ඵලදායිතාවය (ගසක ගෙඩි ප්‍රමාණය) | ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය (මිලියන) | වෙනස % |
|---|---|---|---|---|---|---|---|
| 1992 | 20,782,648 | 0 | 421,875 | | 49 | 2,296 | 0 |
| 1993 | 19,145,214 | -8 | 407,512 | -05 | 47 | 2,164 | -06 |
| 1994 | 21,382,314 | +12 | 426,722 | +03 | 50 | 2,622 | +21 |
| 1995 | 22,603,156 | +6 | 441,379 | +04 | 51 | 2,275 | +05 |
| 1996 | 19,336,658 | -14 | 421,716 | -04 | 46 | 2,546 | -08 |
| 1997 | 19,235,974 | -1 | 412,006 | -02 | 47 | 2,630 | +03 |
| 1998 | 18,921,808 | -2 | 415,718 | +01 | 46 | 2,522 | -04 |
| 1999 | 21,348,626 | +13 | 393,360 | -05 | 54 | 2,828 | +12 |
| 2000 | 23,216,882 | +9 | 399,454 | +02 | 58 | 2,396 | +09 |
| 2001 | 21,829,630 | -06 | 395,435 | -01 | 55 | 2,769 | -11 |
| 2002 | 15,031,795 | -31 | 413,465 | +05 | 36 | 2,392 | -14 |
| 2003 | 17,585,652 | +17 | 402,937 | -03 | 44 | 2,562 | +11 |
| 2004 | 18,354,614 | +04 | 401,162 | 00 | 46 | 2,591 | +01 |
| 2005 | 14,391,265 | -22 | 408,006 | +02 | 35 | 2,515 | -03 |
| 2006 | 17,070,324 | +19 | 411,968 | +01 | 41 | 2,785 | +11 |
| 2007 | 17,815,317 | +04 | 395,762 | -04 | 45 | 2,869 | +03 |
| 2008 | 16,280,051 | -09 | 378,333 | -04 | 43 | 2,908 | +01 |
| 2009 | 18,632,247 | +14 | 380,000 | 00 | 49 | 2,762 | -05 |
| 2010 | 18,256,007 | -2 | 340,586 | -10 | 54 | 2,317 | -16 |
| 2011 | 14,527,770 | -20 | 353,113 | +04 | 41 | 2,808 | +09 |
| 2012 | 15,807,753 | +09 | 312,456 | -12 | 51 | 2,940 | +05 |
| 2013 | 9,595,275 | -39 | 313,048 | +01 | 31 | 2,513 | -14 |
| 2014 | 12,969,381 | 35 | 283,449 | -9 | 46 | 2,870 | +14 |
| 2015 | 12,517,083 | -3 | 288,951 | 2 | 43 | 3,026 | +5 |
| 2016 | 16,522,290 | 32 | 304,043 | 5 | 54 | 2,845 | -7 |







## පොල් වගා කර ඇති මුළු භූමි ප්‍රමාණය (හෙක්.)

**2016 දෙසැම්බර් 31 අවසානයේ**

| විස්තරය | පලුගස්වැව | දිවුලපිටිය | බිංගිරිය | හලාවත | මාදම්පේ | තම්බපණ්ණි | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ඵල දරන පොල් වගාව (හෙක්.) | 444.16 | 289.74 | 653.92 | 368.99 | 486.95 | 555.82 | **2,797.58** |
| ඵල නොදරන නොමේරූ පොල් (හෙක්.) | 175.00 | 114.00 | 365.99 | 116.37 | 116.70 | 138.31 | **1,026.37** |
| පොල් වගාකර ඇති මුළු භූමි ප්‍රමාණය (හෙක්.) | 619.16 | 403.74 | 1,019.91 | 485.36 | 603.65 | 694.13* | **3,825.94** |

* සැ.යු. : 2016 වර්ෂයේ දී කජු හෙක්ටයාර් 590.35 ක වගා භූමි ප්‍රමාණය පොල් වගා ප්‍රමාණයෙන් වෙන්කර දක්වන ලදී.



### හලාවත වැවිලි සමාගමට අයත් පොල් ගස්වල වයස් විශ්ලේෂණය - 2016

| වයස් කාණ්ඩය | 50 වැඩි | 20 - 49 | 10 - 19 | 5 - 9 | 0 - 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| ගස් ප්‍රමාණය | 157,956 | 219,957 | 23,532 | 39,948 | 112,071 | **553,464*** |
| මුළු ප්‍රතිශතය | 29% | 40% | 4% | 7% | 20% | |

*මේරූ, නොමේරූ, වයස්ගත, කණාටු




## වැසි දින හා වර්ෂාපතනය

2016 වර්ෂය තුළදී හලාවත වැවිලි සමාගමෙහි වතු වෙත ලැබුණු වාර්ෂික වර්ෂාපතනය වර්ෂ 2015 ට සාපේක්ෂව බෙහෙවින් පහළ වූ අතර එය 29% සිට 48% දක්වා පහළ අගයක් ගනු ලැබේ.

| වතු කොට්ඨාසය | 2016 ජන. - දෙසැ. වර්ෂාපතනය (මි.මී) | 2016 ජන. - දෙසැ. වැසි දින | පසු ගිය වසර සමඟ වෙනස වර්ෂාපතනය (මි.මී.) |
|---|---|---|---|
| බිංගිරිය | 849 | 44 | -35% |
| හලාවත | 883 | 38 | -48% |
| දිවුලපිටිය | 1,205 | 53 | -29% |
| මාදම්පේ | 925 | 29 | -37% |
| පලුගස්වැව | 1,220 | 55 | -29% |
| තම්බපණ්ණි | 910 | 34 | -43% |






## ජානමය වශයෙන් උසස් කරනු ලැබූ පොල් පැළ නිෂ්පාදනය හා අත්පරාගනය

පොල් ගස පර-පරාගනය වනු ලබන ශාකයකි. එබැවින් පරාගනයේදී අසල ඇති අඩු ඵලදායිතාවයකින් යුතු දුර්වල පරාග හටගන්නා ගස් හි එම පරාග සමග පරාගනය වීම මත නීරෝගිමත් හා ඉහළ නිෂ්පාදන විභයක් ඇති මවු ශාකයකින් වුවද හටගන්නා බීජ පොල් හි එම ජානමය විභවය නොපැවතිය හැකිය.

එම තත්ත්වය සැලකිල්ලට ගනිමින් හලාවත වැවිලි සමාගම පොල් පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින් සමග එක්ව පළුගස්වැව වත්තෙහි තෝරා ගන්නා ලද මවු ශාක සමග අත්පරාගන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. එහිදී පොල් පර්යේෂණ ආයතනයෙන් රැගෙන එනු ලබන සැන්රාමන් පරාග සමග උස පොල් ප්‍රභේදය මුහුම් කිරීම තුළින් ඉහළ නිෂ්පාදනයක් ඇති, ජල හිගයට ප්‍රතිරෝධී, ඉහළ කොප්පාරා ප්‍රමාණයක් හා වැඩි තෙල් ප්‍රතිශතයක් ඇති ප්‍රභේදයන් ඇති කරයි.

තවාන් පාලනයේදී පලමු මාස 05 තුළදී ප්‍රරෝහණය නොවන බීජ ඉවත් කර (15% පමණ) පුළුස්සා දැමීම කරනු ලැබේ.එමෙන්ම පළමු මාස 07 තුළදී ප්‍රරෝහණය වී ඇති පැළ ප්‍රමාණයෙන් දුර්වල පැළ (10% පමණ) තෝරා ඉවත් කර පුළුස්සනු ලැබේ. පසුව ලැබෙන ජානමය වශයෙන් උසස් පොල් පැළ පළුගස්වැව වත්ත ඇතුළු අනෙකුත් වතුවල සිටුවනු ලබන අතර එමගින් ඉහළ නිෂ්පාදනයක් ඉදිරි අනාගතයේදී අපේක්ෂා කරනු ලැබේ.

පොල් කර්මාන්තයේදී ඉහළ ලාභයක් හා නිෂ්පාදනයක් ලබා ගැනීමට ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් ඇති නීරෝගී ශාක අවශ්‍ය වේ. ඒ සඳහා නීරෝගී, ඉහළ නිෂ්පාදන විභවයක් ඇති හා නියං ප්‍රතිරෝධී පොල් පැළ සිටුවීම වැදගත් වේ.

අත්පරාගන ව්‍යාපෘතිය තුළින් නිෂ්පාදිත බීජ පළුගස්වැව වත්ත තුළ තවාන්කර පැළ නිෂ්පාදනය කරන අතර, එම පැළ යටි වගාවන් තුළ මේ වන විට සිටුවා ඇති අතර, ශක්තිමත්ව නීරෝගීව වර්ධනය වන අතර, නිෂ්පාදනයේදී ඉහළ නිෂ්පාදන විභවයක් ඇති බවට සහතික කළ හැකිය.





අත්පරාගනය මගින් ජානමය වශයෙන් උසස් කරනු ලැබූ පොල් පැළ නිෂ්පාදනය

| වර්ෂය | සැල්රාමන් මල් | බීජ අස්වැන්න ගෙඩි ප්‍රමාණය | තවාන් කර ඇති බීජ ප්‍රමාණය (TSR) |
|---|---|---|---|
| 2012 | 2,556 | 4,847 | Not laid |
| 2013 | 4,098 | 16,121 | 20,968 |
| 2014 | 1,976 | 17,452 | 17,112 |
| 2015 | 1,956 | 13,446 | 11,634 |
| 2016 | 1,816 | 11,273 | 10,017 |
| එකතුව | **12,402** | **63,139** | **59,731** |

### බීජ උයන (කීණියම ''කප්රුවන'' බීජ උයන)

පොල් පර්යේෂණ ආයතනය හා හලාවත වැවිලි සමාගම අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස "කප්රුවන" දෙමුහුන් බීජ උයන කිණියම වතු යායේ පවත්වා ගෙන යයි.

වැඩෙමින් පවතින පොල් පැළ මගින් ශක්තිමත් සාර්ථක ව්‍යාපෘතියක් බවට ලකුණු පෙන්වයි. (2012 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. )

## ආයෝජන ප්‍රමාණය

### නව වගා හා යටි වගා

පොල් ගස් වයස්ගත වීමත් සමග එහි ඵලදාව ක්‍රමිකව අඩුවීම නව වගාවකට හා නැවත වගාවක් ප්‍රමාදයකින් තොරව ආරම්භ කළ යුතු වීම පෙන්නුම් කරනු ලබයි. එහි සාධයක් ලෙස ගස්වල වයස, ඵලදාව, උස වගාවේ ආවරණය තරගකාරීත්වය හා අක්කරයක පවතින පොල් ගස් ප්‍රමාණය වගාවක් ආරම්භ කිරීමේදී විශේෂයෙන් සැලකිය යුතු වේ.

නැවත වගාවක් ආරම්භ කිරීම සඳහා බලපාන එකම සාධකය වයස නොවන අතර වතු ඒකකයන්හි පවතින පොල් ගස් ඝණත්වය අතු ආවරණය හා සෙවන පස හා භූ විශමතාවය සලකමින් හලාවත වැවිලි සමාගම නව පොල් යටි වගා ආරම්භ කිරීමට පියවර ගෙන ඇත.

මහා පරිමාණයෙන් නව හා යටි වගා කෙරෙහි අවධානය පෙර නොතිබූ බැවින් හලාවත වැවිලි සමාගමෙහි ප්‍රධාන ආයෝජනය ලෙස යටි වගාවන් හා නව වගාවන් නැවත ආරම්භ කිරීමට මූලිකත්වය දෙන ලදී. සමස්ත වගාවෙන් පොල් ගස් 157,956ක් වයස අවුරුදු 50ට වැඩි ගස් වන අතර එය ප්‍රතිශතයක් ලෙස සමස්ත වගාවෙන් 29% කි. එහෙයින් ඵලදායීතාවය අඩුවූ අතර 2016 වර්ෂ අවසානය වන විට හලාවත වැවිලි සමාගම විසින් හෙක්ටයාර 1,026.37 ක පොල් යටි වගාවන් හා නව වගාවන් ආරම්භ කරන ලදී. මෙම වගාවන් ඉදිරි වර්ෂ පහ හය තුළදී ඵලදරන අවදියට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කරමු.

31/12/2016 දිනට නව / යටි වගා සඳහා උපචිත ආයෝජන

| වතු කොට්ඨාසය | නව / යටි වගා ප්‍රමාණය (හෙක්.) | 2016 දෙසැම්බර් අවසනට සමස්ථ ආයෝජනය (රු.) |
|---|---|---|
| පලුගස්වැව වත්ත | 175.00 | 70.1 |
| හලාවත වතු කලාපය | 116.37 | 52.7 |
| දිවුලපිටිය වතු කලාපය | 114.00 | 52.3 |
| තම්බණ්ණි වතු කලාපය | 138.31 | 67.8 |
| බිංගිරිය වතු කලාපය | 365.99 | 154.6 |
| මාදම්පේ වතු කලාපය | 116.70 | 56.4 |
| **එකතුව** | **1,026.37** | **453.9** |




2016 දෙසැම්බර් 31 දිනට නව/යටි වගා ප්‍රමාණය

| වර්ෂය | නව/යටි වගා ප්‍රමාණය (හෙක්.) |
|---|---|
| 2009 | 101.10 |
| 2010 | 107.93 |
| 2011 | 128.17 |
| 2012 | 266.84 |
| 2013 | 183.76 |
| 2014 | 124.57 |
| 2015 | 68.00 |
| 2016 | 46.00 |
| එකතුව | **1,026.37** |



## අතුරු බෝග වගාව හා පශු සම්පත්

### මී ගව ව්‍යාපෘතිය

පලුගස්වැව වත්තේ පිහිටා ඇත.

මී ගවයන් සංඛ්‍යාව - 330
මී දෙනුන් සංඛ්‍යාව (දෙසැම්බර් මස අවසානයට) - 45
මුළු කිරි නිෂ්පාදනය ලීටර් - 37,371.58 L

| නිෂ්පාදන තොරතුරු | ඒකක ගණන |
|---|---|
| මුදවපු කිරි - 1000 ml | 19,580 |
| මුදවපු කිරි - 500 ml | 6,547 |
| මුදවපු කිරි - 175 ml | 6,580 |
| යෝගට් - 80 ml | 50,266 |





මී ගව / බැටළු සංගණනය

| වතු කොට්ඨාසය | මී ගවයින් (ගණන) | බැටළුවන් (ගණන) |
|---|---|---|
| පලුගස්වැව | 330 | - |
| හලාවත | 32 | - |
| මාදම්පේ | 10 | 115 |
| බිංගිරිය | - | 487 |
| **එකතුව** | **373** | **602** |





### බහුවාර්ෂික අතුරු බෝග සිටුවීම

තිරසර ක්‍රමවේදයන් යටතේ ඉහළ ආයෝජන ප්‍රතිලාභයන් ලබා ගැනීමට ගැටළු ලෙසින් පවතින වෙළඳපොළ තත්ත්වය, කම්කරු හිඟතාවය, අස්වනු එකතු කිරීම, සොරකම් කිරීම් යනාදිය මෙන්ම කෘෂි-දේශගුණික හා භූ විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් සුදුසු අතුරු බෝග වගා කිරීම කරනු ලැබේ.

ඒ අනුව දිවුලපිටිය වතු කලාපයේ පොල් සමඟ ඉහළ ප්‍රතිලාභ ඇති අතුරු බෝග වගාකර ඇති අතර, පළුගස්වැව වත්ත තුළ පොල් වගාව ආශ්‍රිත මී ගව පාලන කටයුතු සිදුකරනු ලබයි.

## රඹුටන් වගාව



ගම්පහ දිසත්‍රික්කය මූලික කර ගනිමින් රඹුටන් වගාව ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත අතර, රඹුටන් සඳහා වෙළඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් පවතී. වර්ෂයේ ජුනි ජූලි මාසයන් ආරම්භයත් සමඟ රඹුටන් වාරය ආරම්භ වන අතර, එම කාලයේදී උපරිම අස්වැන්නක් ලබා දීමට සමත් වන අතර වර්ෂයන් හි මුල් මාස දෙක තුළදී ද අවාර අස්වැන්නක් සුළු වශයෙන් ද හට ගැනේ.

ආර්ථිකමය වශයෙන් ඉහළ ආදායමක් ලබාගත හැකි බෝගයක් වන බැවින් හලාවත වැවිලි සමාගමෙහි දිවුලපිටිය වතු කලාපයේ කෝපිවත්ත තුළ ආසන්නව අක්කර 50ක වගාවක් 1996 හා 2005 යන වර්ෂයන් තුළදී පොල් සමඟ අතුරු බෝගයක් ලෙස වගාකර ඇත. වගාව සඳහා උපරිම යෝග්‍යතාවයක් ඇති පස කෝපිවත්ත තුළ පිහිටා ඇති මෙන්ම දිවුලපිටිය වතු කලාපයේ අනෙකුත් වතු කොට්ඨාසයන්හි පස රඹුටන් වගාවට වඩාත් සුදුසු නොවීම හා වගාවට සුදුසු හිස් අවකාශ ප්‍රමාණවත් පරිදි නොපැවතීම තවදුරටත් වගාව ව්‍යාප්ත කිරීමට ඇති ප්‍රධාන බාධකය වේ.



## ගම්මිරිස් වගාව



ප්‍රධානව තෙත් හා අතරමැදි කෘෂි දේශගුණික කලාපයන් තුල සශ්‍රීකව වගා කල හැකි බෝගයක් ලෙස ගම්මිරිස් වගාව හැඳින්විය හැකිය. හලාවත වැවිලි සමාගමෙහි වතු කොට්ඨාස බොහොමයක් අතරමැදි කලාපයට අයත් වූවද වගාව සඳහා ලෝම් මිශ්‍ර පසක් අවශ්‍ය බැවින් හා වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 1,750 ඉක්මවිය යුතු වීම වගාවට වඩාත් හිතකර පරිසරය ගොඩනගන බැවින් හලාවත වැවිලි සමාගමෙහි දිවුලපිටිය වතු කලාපයට පමණක් මෙය සීමා වී ඇත. වර්ෂ 1998 සිට 2014 කාලසීමාව තුළ අක්කර 74 ක ගම්මිරිස් වගාව පොල් වගාව සමඟ අතුරු බෝගයක් ලෙස තනි පේළි ක්‍රමයට වගාකර ඇත. එමෙන්ම සෑම වර්ෂයකම සැලකිය යුතු ආදායමක් මෙමඟින් ඉපැයීම සිදු කරයි. කෙසේ වෙතත් වර්ෂ කිහිපයක සිට ගම්පහ දිස්ත්‍රික්යට පෙර වර්ෂයන්ට සාපේක්ෂව අඩු වර්ෂාපතනයක් ලැබීම වගාවේ නඩත්තුවට හා ව්‍යාප්තියට දැඩි තර්ජනයක් වී ඇත.



### කුරුඳු වගාව





වෙළඳපොළ තුළ කුළු බඩු අංශයෙන් ඉහළම ඉල්ලුමක් පවතින නිෂ්පාදනයක් ලෙස කුරුඳු හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ මීගමු මුහුදු සීමාවේ සිට මාතර වෙරළබඩ කලාපය දක්වා මුහුදු බඩ සීමාව තුල හා කලුතර හා රත්නපුරය දක්වා රට අභ්‍යන්තරයට මෙම වගාව ව්‍යාප්ත වී ඇත. දිවුලපිටිය වතු කලාපයේ සශ්‍රීකත්වයෙන් අඩු වතු කලාපයන් හා ස්ථාන හඳුනාගනිමින් හලාවත වැවිලි සමාගම තුළද පළමු වරට 2011 වර්ෂයේදී කුරුඳු වගාව ආරම්භකරන ලදී. වර්තමානය වන විට අක්කර 27 ක පමණ ප්‍රමාණයක මූලිකව දිවුලපිටිය දොඹවින්න වත්ත, සරස්වතී වත්ත තුළ අක්කර 23.22 ක් ද බිංගිරිය වතු කලාපයේ කොළමුණුඔය හා සියඹලාවැව වත්ත තුළ අක්කර 2.98 ක්ද හා හලාවත වතු කලාපය තුළ වර්ෂ 2015 දී අක්කරයක ප්‍රමාණයක කුරුඳු වගාව ස්ථාපිත කර ඇත.

දිවුලපිටිය වත්ත තුළ ස්ථාපිත වගාව අස්වනු නෙළන අවධියට පැමිණ ඇති අතර, අනෙකුත් වගාවන් තවමත් නොමේරූ අවස්ථාවේ පවතී. කෙසේ වෙතත් අනාගතයේදී කුරුඳු වගාව තුළින් හලාවත වැවිලි සමාගමට ඉහළ ආදායමක් ලබාගැනීමට මෙය මහඟු අවස්ථාවක් වනු ඇත.

### ඩ්‍රැගන් ෆෘට් වගාව





වියළි හා අතරමැදි කෘෂි දේශගුණික කලාපයන් තුළ හොඳින් වැඩෙන මෙම බෝගය ප්‍රථම වරට 2008 වර්ෂයේදී බිංගිරිය කිණියම වත්ත තුළ සිටුවීමෙන් වගාව ආරම්භකරන ලදී. එතැන් පටන් වර්ෂ 2016 අවසන් වන විට අක්කර 31 කින් සමන්විත වගාවක් ලෙස බිංගිරිය, දිවුලපිටිය, මාදම්පේ හා පළුගස්වැව වත්ත තුළ හොඳින් නඩත්තු වෙමින් පවතී. මෙම වගාව ස්ථාපිත කිරීමේ විශාල ප්‍රාග්ධනයක් වැය කිරීමට සිදු වුවද, පසුව නඩත්තුව ඉතාමත් පහසු මෙන්ම ඉහළ ආදායමක් ඉපැයීමට වගාව සමත් වේ.

මෙම බෝගය ශ්‍රී ලංකාවට හඳුන්වාදී මුල් කාලය තුළදී ව්‍යාප්තිය අවම වීම මත අස්වනු සඳහා ඉහළ ඉල්ලුමක් හා ඉහළ වටිනාකමක් පැවතියද අද වන විට වෙළඳපොළ තුළ සුලභ වීම මත කිලෝවක් සඳහා රුපියල් 200 - 250/- දක්වා මිල පහළ ගොස් ඇත. එය වගාව තවදුරටත් ව්‍යාප්ත කිරීමට සීම සාධකයක් වී ඇත.

අතුරු බෝග ආදායම (රු.) රු.

| වතු කොට්ඨාසය | කජු | ගම්මිරිස් | රඹුටන් | ඩ්‍රැගන් ෆෘට් | කුරුඳු |
|---|---|---|---|---|---|
| තම්බපණ්ණි | 17,609,101.87 | - | - | - | - |
| බිංගිරිය | 1,061,028.93 | - | - | 741,635.00 | - |
| හලාවත | 1,415,976.07 | - | - | 7,360.00 | - |
| මාදම්පේ | - | - | - | 3,750.00 | - |
| දිවුලපිටිය | - | 937,260.00 | 375,000.00 | 225,420.00 | 391,975.00 |
| පළුගස්වැව | 686,821.00 | - | - | - | - |
| එකතුව | **20,772,927.87** | **937,260.00** | **375,000.00** | **978,165.00** | **391,975.00** |

**නිෂ්පාදන, නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම හා අලෙවිකරණය**

## කජු ව්‍යාපෘතිය

**තම්බපණ්ණි පළාත් වතුවල පිහිටි ඇති කජු සැකසීමේ මධ්‍යස්ථානය**

තම්බපණ්ණි පළාත් වතුවල පිහිටා ඇති බද්ධ කජු පැළ තවාන මඟින් කජු වගාකරුවන් හට වැඩි අස්වැන්නක් ලබා දෙන පැළ ලබා දීම අඛණ්ඩව සිදුවේ.

2016 වසරේ දී නෙළන ලද සමස්ත කජු ප්‍රමාණය කිලෝ 67,266 ක් වූ අතර, ලෙලි කජු සඳහා වෙළඳ පොලේ සැලකිය යුතු මිලක් ලැබිණි. කජු අස්වැන්නෙන් කොටසක් තම්බපණ්ණි පළාත් වතු කජු සැකසුම් මධ්‍යස්ථානයේ සකස් කර නිමි භාණ්ඩයක් ලෙස පාරිභෝගිකයන්ට අලෙවි කර ඇත.




හලාවත වැවිලි සමාගම සතු කජු හෙක්ටයාර් ප්‍රමාණය හෙක්ටයාර් 827.63 කට ආසන්න වේ. දැනට විශේෂයෙන් පුත්තලම් දිස්ත්‍රික්කයේ තම්බපණ්ණි වතු කොට්ඨාසය, පලුගස්වැව, හලාවත වතු කොට්ඨාසවල කජු වගාව වැඩි වශයෙන් ව්‍යාප්තව ඇත. ශ්‍රී ලංකාව තුළ කජු වගාව සඳහා විශේෂිත ස්ථානයක් වශයෙන් පුත්තලම් දිස්ත්‍රික්කය හඳුන්වා දිය හැකි අතර හලාවත වැවිලි සමාගමේ කජු වගාවෙන් වැඩි වපසරියක් පිහිටා ඇත්තේ පුත්තලම් දිස්ත්‍රික්කයේ වීම සමාගමක් වශයෙන් අපට වඩාත් වාසිදායක වේ.

දැනට ශ්‍රී ලංකාව තුළ කජු සඳහා ඇත්තේ අද්විතීය ඉල්ලුමකි. ශ්‍රී ලංකාව තුළ දැනට නිපදවෙන වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 10000කට ආසන්න වන අතර සමාගමක් වශයෙන් අප එයට දායකත්වය ලබාදෙන්නේ 0.8%ක ප්‍රමාණයකිනි. මෙම ප්‍රමාණය 2020 වන විට 1.5% පමණ වර්ධනයකර ගැනීමට සමාගමේ ඉදිරි සැලසුම් සකස්කර ඇත.

2012 වර්ෂයට ප්‍රථම හලාවත වැවිලි සමාගම සතු අස්වැන්න බාහිර වෙළඳුන් සඳහා ලබාදුන් අතර 2012 වර්ෂයේ සිට අප සතු අස්වැන්න අපගේ නිෂ්පාදන ලෙසම පිරිසැකසුම්කර වෙළඳපලට එක් කිරීමට කටයුතු කර ඇත. 2012 වර්ෂයේ තම්බපණ්ණි වතු යායේ කජු පිරිසැකසුම් කර්මාන්ත ශාලාව බිහිවූ අතර එය වඩාත් ඵලදායී ලෙස හා වඩාත් වාසිදායක අන්දමට පවත්වා ගෙන යාමට කළමනාකාරිත්වය තීරණයකර ඇත.

මෙම පිරිසැකසුම් ව්‍යාපෘතිය පහත සඳහන් පරමාර්ථ පෙරදැරිකර ගෙන ආරම්භකර ඇත.

1. සමාගමේ ලෙලි කජු නිෂ්පාදනය සඳහා වැඩි මිලක් ලබා ගැනීම
2. වටිනාකම වැඩි නිෂ්පාදන එළිදැක්වීම
3. සමාගමේ නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළඳපල සොයා ගැනීම
4. සමාගමේ නිෂ්පාදන සඳහා SLS/GMP/ISO තත්ව ලබාගැනීම

කජු ව්‍යාපෘතිය හා පිරිසැකසුම තුළින් අනාගත ඉලක්ක පහත සඳහන් පරිදි සපුරා ගැනීම ආයතනික බලපොරොත්තුවේ.

1. නිෂ්පාදනය වාර්ෂිකව පිරිසැකසුම් මද කිලෝ ග්‍රෑම් 5000 සිට කිලෝ ග්‍රෑම් 30,000ක් දක්වා වර්ධනය කරවීම.
2. මේ සඳහා ආයතනික දායකත්වය හෝ බාහිර පාර්ශවවල දායකත්වය ලබාගැනීම
3. අපනයන වෙළඳපල සඳහා නිෂ්පාදන අලෙවි කිරීම
4. ආයතනයේ අලෙවි ජාලය පුළුල් කිරීම
5. පාරිභෝගිකයින්ට වඩාත් හොඳ ප්‍රමිතියෙන් යුත් තෘප්තිමත් නිෂ්පාදනයන් පිළිගැන්වීම

## පොල් තෙල් ව්‍යාපෘතිය (නිෂ්පාදන තොරතුරු)

හලාවත වැවිලි සමාගමේ නවෝත්පාදන ප්‍රතිපත්තිය වශයෙන් ආයෝජන ප්‍රතිලාභ වෙළඳපොළ තත්ත්වය අවදානම් තත්ත්ව විශ්ලේෂණය හා කම්කරු ශ්‍රමය වැනි සාධක සලකමින් පොල් හා අතුරු බෝග ආශ්‍රිත අගය එකතු කරනු ලැබූ නිෂ්පාදන සඳහා යොමු වී ඇත.




පළුගස්වැව වත්තේ පවතින ඉහළ ගුණාත්මක කොප්පරා භාවිතා කරමින් පොල් තෙල් නිෂ්පාදනය කිරීම 2012 වර්ෂයේදී සිදු කරන ලදී. අපගේ මෙහෙවර වශයෙන් ශ්‍රී ලාංකිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම උදෙසා පිරිපහදු කිරීම්, අවර්ණ කිරීම හා දුර්ගන්ධ නාශන ක්‍රියාවලියෙන් තොර අඩු පිරිවැය යටතේ ආනයන එළවළු තෙල් හා තාපාංක අඩු කරන ලද මිශ්‍ර තෙල් වෙනුවට ස්වාභාවික ඉහළ ගුණාත්මක අමිශ්‍ර පොල් තෙල් තරඟකාරී මිල යටතේ වෙළඳපොලට ඉදිරිපත් කිරීම වේ.

**2016 වර්ෂ අවසානයට හලාවත වැවිලි සමාගමේ පොල් තෙල් නිෂ්පාදන තොරතුරු**

| ධාරිතාවය | බෝතල් ගණන |
|---|---|
| මිලි ලීටර 1,000 | 2,739 |
| මිලි ලීටර 750 | 352 |
| මිලි ලීටර 500 | 1,352 |
| මිලි ලීටර 250 | 360 |

## වැසි ජලය එක් රැස් කිරීම







අවදානම් කළමනාකරණ පියවරක් ලෙස හා පසේ තෙතමන ප්‍රතිශතය වර්ධනය කිරීම අරමුණු කොට වැසි ජලය එක් රැස් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

## මූල්‍ය සමාලෝචනය

### සමාගමේ මූල්‍ය ප්‍රගතිය ලුහුඬින්

| අයිතමය | 2016 රු.මි. | 2015 රු.මි. | විචලනය (2015-2016) | | |
|---|---|---|---|---|---|
| | | | රු.මි. | % | ප්‍රධාන සාධකය |
| අයභාරය | 383 | 399 | (16) | (4) | ශුද්ධ විකුණුම් සමාන්‍ය (NSA) අඩුවීම හා ඉහළ අවසන් තොගයක් පැවැතීම |
| විකුණුම් පිරිවැය | 234 | 250 | (16) | (6) | අඩු ආරම්භක තොගයක් සහ විශාල අවසන් තොගයක් පැවැතීම |
| අනෙකුත් අදායම් | 66 | 80 | (14) | (18) | වටිනා දැව ගස් අලෙවි ආදායම් අඩුවීම |
| පරිපාලන වියදම් | 103 | 106 | (3) | (3) | ක්ෂය වීම සඳහා වෙන් කිරීම් අඩුවීම |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 9 | 13 | (4) | (30) | අනෙකුත් මෙහෙයුම් වියදම් අඩුවීම |
| මූල්‍ය ආදායම් | 14 | 11 | 3 | 27 | ස්ථාවර තැම්පත්වල පොළී අනුපාතය වැඩිවීම |
| මූල්‍ය පිරිවැය | 33 | 32 | 1 | 3 | දල දේශීය නිෂ්පාදන අවධමනකයේ වෙනස්වීම හේතු කොට ගෙන කල් බදු පොලිය වැඩිවීම. |

### පොල් අස්වැන්න

2016 වර්ෂයේ දී සමාගම පොල් ගෙඩි මිලියන 16.5 ක් නිෂ්පාදනය කර ඇත. එය පසුගිය 2015 වර්ෂයේ නිෂ්පාදිත පොල් ගෙඩි මිලියන 12.5 ක අස්වැන්න සමඟ සංසන්දනාත්මකව ගත් කල 32% ක වැඩිවීමකි. කෙසේ වෙතත් පොල් ගෙඩියක සාමාන්‍යය ශුද්ධ විකුණුම් මිල (NSA) පසුගිය වර්ෂයට සාපේක්ෂව 17% කින් අඩු විය. මෙම වර්ෂයේ පොල් ගෙඩියක සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිල රුපියල් 25.00 ක් විය .




### අයභාරය

වර්ෂය තුළදී සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිලෙහි (NSA) අඩු වීම හා ඉහළ අවසන් තොගයක් පැවැතීම හේතුවෙන් අයභාරය රුපියල් මිලියන 399 සිට 383 දක්වා අඩුවිය .







### විකුණුම් පිරිවැය

පසුගිය වර්ෂයේ පැවති රුපියල් මිලියන 250 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් පිරිවැය රුපියල් මිලියන 231 ක් විය .

| | 2016 | 2015 |
|---|---|---|
| **නිෂ්පාදන පිරිවැය රු.මිලි.** | **268** | **227** |
| + ආරම්භක තොගය රු.මිලි. | 22 | 45 |
| - අවසන් තොගය රු.මිලි. | (56) | (22) |
| **විකුණුම් පිරිවැය රු.මි.** | **234** | **250** |

- 2015 වර්ෂයේ පැවති රුපියල් මිලියන 227 ට සාපේක්ෂව 2016 වර්ෂයේ නිෂ්පාදන පිරිවැය රුපියල් මිලියන 268 ක් වූ අතර, එය රුපියල් මිලියන 41 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම පිරිවැය වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක පහත පරිදි විස්තර කළ හැක.:

- 4/2016 පනතට අනුව (අය වැය යෝජනා 2016) 22% කින් කම්කරු වැටුප ඉහළ යාම. 2016 වර්ෂය සඳහා කම්කරු වැටුප රුපියල් මිලියන 106 ක් විය. 2015 වර්ෂයේදී එය රුපියල් මිලියන 87 කි .

  4/2016 පනතට අනුව, හිඟ කම්කරු වැටුප ලෙස රුපියල් මිලියන 8 ක් 2015.05.01 සිට 2015.12.31 කාලය සඳහා වතු කම්කරුවන් වෙත 2016 වර්ෂය තුළ දී ගෙවා ඇත .

- 2016 වර්ෂය තුළදී සමාගම සිවිල් ආරක්ෂක සේවාව ලබාගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 13 ක අමතර පිරිවැයක් දරා ඇත.
- 2016 ජනවාරි සිට මාසිකව පොල් කැඩීම නිසා (වර්ෂයකට අමතර පොල් කැඩුම් වාර 06 ක්) අස්වනු නෙළීමේ පිරිවැය රුපියල් මිලියන 28 සිට රුපියල් මිලියන 48 දක්වා වැඩිවී ඇත.
- 2016 වර්ෂයේ අවසාන කාර්තුව තුළ පැවති අහිතකර කාලගුණ තත්ත්වය හේතුවෙන් පොහොර යෙදීම සීමිත ප්‍රදේශයකට පමණක් සීමා වීම නිසා පොහොර යෙදීමේ පිරිවැය 2015 රුපියල් මිලියන 30 සිට 2016 රුපියල් මිලියන 19 දක්වා අඩු වී ඇත.
- කෙසේ වෙතත් අඩු ආරම්භක තොගය හා ඉහළ අවසන් තොගය නිසා විකුණුම් පිරිවැය රුපියල් මිලියන 250 සිට රුපියල් මිලියන 234 දක්වා අඩු වී ඇත .

### දළ ලාභය

2015 වර්ෂයේ පැවති රුපියල් මිලියන 148.7 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභය රුපියල් මිලියන 148.7 ක් විය.

පසුගිය වර්ෂයේ 37.2 % ක් ව පැවති දළ ලාභ අනුපාතිකය ප්‍රවර්ථන වර්ෂයේදී 38.8% ක් විය.




### අනෙකුත් මෙහෙයුම් ආදායම්

කජු, පොල් ලෙලි, දැව ගස්, පශු සම්පත්, කුඹුරු, මැරුණු වැටුණු පොල් ගස් අලෙවියෙන් සමන්විත අනෙකුත් මෙහෙයුම් ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 80.3 සිට රුපියල් මිලියන 65.9 දක්වා 18% කින් පහත වැටී ඇත.

පසුගිය වර්ෂය තුළදී සමාගම රුපියල් මිලියන 24.5 ක් පරිභෝජ්‍ය ජෛව වත්කම් (වටිනා දැව ගස්) වලින් උපයා ඇත. කෙසේ වෙතත් 2016 වර්ෂයේදී එය රුපියල් මිලියන 5.1 ක් පමණි. එය අනෙකුත් අදායම් අඩුවීම කෙරෙහි බලපා ඇති ප්‍රධාන සාධකය වේ. (වටිනා දැව අලෙවි ආදායම අඩුවීම කෙරෙහි අධිකාරී ආයතනවලින් නිසි අනුමැතිය නොලැබීම දැක්විය හැක.)

අනෙකුත් අදායම්වලට අදාළ විස්තර ගිණුම්කරණ සටහන් අංක 20 තුළ පෙන්වයි.

### පරිපාලන හා අනෙකුත් මෙහෙයුම් වියදම්

පරිපාලන වියදම 2015 වර්ෂයේ රුපියල් මිලියන 106 සිට 2016 වර්ෂයේදී රුපියල් මිලියන 102 දක්වා 4 % කින් අඩුවී ඇත.

2016 වර්ෂයේ දී අනෙකුත් මෙහෙයුම් වියදම රුපියල් මිලියන 8.6 ක් වේ. 2015 වර්ෂයේදී එය රුපියල් මිලියන 13.4 ක් විය. රුපියල් මිලියන 4.8 ක අඩුවීමක් පෙන්නුම් කරයි .

### මූල්‍ය අදායම

කෙටිකාලින තැම්පත් (ස්ථාවර තැම්පත්, භාණ්ඩාගාර බිල්පත්) මත උපයන පොළී ආදායම මූල්‍ය ආදායම නියෝජනය කරයි. 2015 වර්ෂය සමග සසඳන විට ප්‍රධාන වශයෙන් ස්ථාවර තැම්පත් පොළී අනුපාතය වැඩිවීම නිසා මූල්‍ය ආදායම රුපියල් මිලියන 10.7 සිට රුපියල් මිලියන 14.1 දක්වා වැඩිවී ඇත.

### මූල්‍ය පිරිවැය

ජනවසම කල්බදු වත්කම් මත රජයට ගෙවූ පොලිය හා අසම්භාව්‍ය බදු කුලිය මූල්‍ය පිරිවැය තුළ ප්‍රධාන වශයෙන් දක්වයි. එම පිරිවැය 2016 වර්ෂයේදී රුපියල් මිලියන 32 ක් දක්වා 3% කින් පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවී ඇත. දළ දේශීය නිෂ්පාදන අවධමනකය පදනම් කර ගනිමින් වාර්ෂිකව මෙම වැඩිවීම සිදුවේ.




### ශුද්ධ ලාභය

පසුගිය වසරේ ලාභය වන රුපියල් මිලියන 81.4 ට සාපේක්ෂව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ මූල්‍ය වාර්තා වලට අනුව සමාගම රුපියල් මිලියන 70.7 ක ශුද්ධ ලාභයක් උපයා ඇත. මෙම අඩුවීම කෙරෙහි විකුණුම් මිලෙහි පහත වැටීමක් දැක්විය හැක .

### ලාභාංශ

බොහෝ රාජ්‍ය ආයතන රජයේ මුදල් මත රඳා පවතී. එහෙත් හලාවත වැවිලි සමාගම එහි කළමනාකාරීත්වය 2008 මැයි මස නැවත රජයට පවරා ගැනීමෙන් පසුව ස්වර්ණමය කොටස් හිමිකරු වන මහා භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 265 ක මුදලක් ලාභාංශ ලෙස ගෙවා ඇත.

2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ උපයන ලද ලාභය සමග ගත් කල මෙය සැලකිය යුතු ඉහළ වටිනාකමකි. 2016 වර්ෂය අවසන් වන විට හලාවත වැවිලි සමාගම විසින් ගෙවන ලද මුළු ලාභාංශ ප්‍රමාණය රුපියල් මිලියන 426 කි.

### මානව සම්පතේ සේවාව අගය කිරීම.

මානව සම්පත ආයතනයක ඉතාම වැදගත් වත්කම වන බවට ඇති දැඩි විශ්වාසය හේතුවෙන් සමාගම සිය සේවකයින් දිරිමත් කිරීම සඳහා ගන්නා ලද පියවරක් ලෙස පෙර වර්ෂයේ ගෙවන ලද රු.මිලියන 15.2 ට සාපේක්ෂව 2016 වර්ෂයේදී රු.මිලියන 14.5 සිය සේවකයින්ගේ කාර්ය සාධන දිරි දීමනා ලෙස ගෙවා ඇත.

එයට අමතරව 1995 වර්ෂයේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේද (PMMD) අනුමැතිය අනුව හඳුන්වා දුන් 10% සේවක ලාභ කොටස වෙනුවෙන් රුපියල් මිලියන 7.8 ක් සේවකයින් හට 2016 වර්ෂයේ මෙහෙයුම් ලාභයෙන් ගෙවා ඇත.

### කොටසක ඉපයීම

පසුගිය වසරේ පැවති රු.3.93 ට සාපේක්ෂව 2016 වසරේ කොටසක ඉපයීම රු.3.48ක් විය.




### යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය (ROCE) සහ ස්කන්ධ ප්‍රතිලාභ අනුපාතය (ROE)

යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය 11% සිට 10.3% දක්වා සහ ස්කන්ධයට ප්‍රතිලාභ අනුපාතය 10% සිට 8% දක්වා අඩුවී ඇත. මෙම අඩුවීම කෙරෙහි පසුගිය වසරට සාපේක්ෂව ලාභයේ අඩුවීම හේතු විය.




### වත්කම් සමුදාය

මූල්‍ය වර්ෂය අවසානයේ සමාගමේ වත්කම් සමුදාය රුපියල් මිලියන 1,278 ලෙස වාර්තා වී ඇත. පසුගිය වසරට සාපේක්ෂව එය රුපියල් මිලියන 135 ක වැඩිවීමකි.

| වත්කම් සමුදාය | 2016 රු.මිලි. | 2015 රු.මිලි. |
|---|---|---|
| ජනවසම වතුවල හිස් භූමිවල කල්බදු හිමිකම | 76 | 79 |
| ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම | 1 | 2 |
| ජනවසම වතුයායන්වල ජෛව වත්කම්වල කල් බදු හිමිකම | 27 | 31 |
| ජෛව වත්කම් (කල් බදු ජෛව වත්කම් හැර ) | 723 | 632 |
| පරිභෝජ්‍ය ජෛව වත්කම් | 42 | 37 |
| සින්නක්කර දේපල පිරියත හා උපකරණ | 97 | 105 |
| ජංගම වත්කම් | 312 | 257 |
| මුළු වත්කම් | **1,278** | **1,143** |

සමාගමේ වත්කම් සමුදාය ප්‍රධාන වශයෙන් ධාරක ජෛව වත්කම්වලින් සමන්විතය. එය මේරූ නොමේරූ පොල් වගා, කජු වගා සහ අනෙකුත් බහු වාර්ෂික වගාවන් නියෝජනය කරයි. එය මුළු වත්කම්වලින් 3% කි.

### ජංගම නොවන වත්කම්

ප්‍රධාන වශයෙන් තබා ගන්නා ජීව විද්‍යාත්මක වත්කම් වැඩිවීම නිසා වර්ෂය තුළ ජංගම නොවන වත්කම් 9% කින් වැඩි වී ඇත. තබා ගන්නා ජීව විද්‍යාත්මක වත්කම්වල වැඩිවීම කෙරෙහි නව වගා / යටි වගා ස්ථාපිත කිරීම වෙනුවෙන් ආයෝජනය කිරීම සහ දැනට පවත්නා නොමේරූ වගා නඩත්තු කිරීම වෙනුවෙන් දරන පිරිවැය ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2016 වර්ෂය තුළදී සමාගම පොල් වගා / යටි වගා හා නොමේරූ වගා නඩත්තු කිරීම වෙනුවෙන් හෙක්ටයාර් 1036 සඳහා රුපියල් මිලියන 86 ක් ආයෝජනය කර ඇත. අනාගතයේදී ලාභය ජනනය කිරීමට සමාගමට ඇති හැකියාව මෙයින් අවධාරණය කරයි.

සමාගම රුපියල් මිලියන 17 ක් දේපල පිරියත හා උපකරණ වෙනුවෙන් ආයෝජනය කර ඇත.(2015-රු.මිලි.18)

### ස්කන්ධය

2015 වර්ෂයේ රු.මිලියන 854.9 සිට 2016 රුපියල් මිලියන 895.7 දක්වා ස්කන්ධය 5% කින් වැඩිවී ඇත.

කොටස් ප්‍රාග්ධනය රුපියල් මිලියන 200 කින් හා සංචිත රුපියල් මිලියන 695.7 කින් ස්කන්ධය සමන්විත වේ.

### කොටස් හිමියන්ගේ අරමුදල් අනුපාතය.

සමාලෝචිත වර්ෂය තුළ කොටස් හිමියන්ගේ අරමුදල් මුළු වත්කම්වලින් 70% කට සමාන වේ.




### කාරක ප්‍රාග්ධනය.

මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම නිසා 2015 වර්ෂයේ රුපියල් මිලියන 202.1 ක් වූ කාරක ප්‍රාග්ධනය 2016 වර්ෂයේදී රුපියල් මිලියන 177.89 ක් දක්වා අඩු වී ඇත.

### ජංගම අනුපාතය.

පසුගිය වර්ෂයේ වාර 4.7 ලෙස පැවති ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 2.3 දක්වා පහළට චලනය වීමක් පිළිබිඹු කරයි. මේ සඳහා ජංගම වගකීම්වල වැඩිවීම හා මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ වගකීම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු විය.

කෙසේ වෙතත්, වර්ෂයේ පැවති 2.3 ක් වූ ජංගම අනුපාතය සමාගමට කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවන් ඉටුකරගැනීමට හැකි ප්‍රමාණවත් අර්ථාන්විත මට්ටමක් පෙන්නුම් කරයි.




### මුදල් ප්‍රවාහ.

පසුගිය වර්ෂයේ උපයාගත් රුපියල් මිලියන 146.3 ට සාපේක්ෂව මෙම වර්ෂයේදී සමාගම සිය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් රුපියල් මිලියන 90.6 ක ශුද්ධ මුදල් ප්‍රමාණයක් ජනනය කර ඇත. මෙම මෙහෙයුම් මුදල් ප්‍රවාහයේ අඩුවීම කෙරෙහි සමාගමේ ප්‍රධාන ආදායම් උපයන ප්‍රභවය වන පොල් මිල අඩුවීම නිසා ආදායම අඩුවීම මෙන්ම මෙහෙයුම් පිරිවැය වැඩිවීම දැක්විය හැක.

පසුගිය වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් ශුද්ධ මුදල් ගලායාම රුපියල් මිලියන 99.9 ට සාපේක්ෂව ප්‍රවර්ථන වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් ශුද්ධ මුදල් ගලායාම රුපියල් මිලියන 102.7 ක් ලෙස වාර්තා වේ.

සමාලෝචිත වර්ෂය තුළ සමාගම රුපියල් මිලියන 86.3 ක් නව/යටි වගා වෙනුවෙන් ද රුපියල් මිලියන 16.3 ක් දේපළ පිරියත උපකරණ වෙනුවෙන් ද ආයෝජනය කර ඇත. ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් ශුද්ධ මුදල් පිටතට ගලායාම සඳහා අවසාන වශයෙන් මෙය හේතු වී ඇත.

සමස්ථයක් වශයෙන් ප්‍රතිඵල ලෙස කාලච්ඡේදය තුළදී සමාගමේ මුදල් හා මුදල් සමාන දෑ සඳහා වූ ශුද්ධ බලපෑම් ලෙස රුපියල් මිලියන 14 ක් ගලායාම දැක්විය හැක.

කෙසේ වෙතත්, ප්‍රවර්ථන වර්ෂය අවසානය වන විට මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 145.9 ක් විය. එය ලංකා බැංකුවේ ඇති ස්ථාවර තැම්පතු, භාණ්ඩාගාර බිල්පත්, මුදල් හා බැංකු ශේෂයෙන් සමන්විතය.




වතු වලින් අස්වැන්න සඳහා දායකත්වය - වර්ෂ

| වතු කලාපය | අස්වැන්න ගෙඩි වලින් |
|---|---|
| හලාවත | 2,279,409 |
| පලුගස්වැව | 5,029,634 |
| තම්බපණ්ණි | 2,186,778 |
| බිංගිරිය | 2,798,682 |
| දිවුලපිටිය | 1,735,347 |
| මාදම්පේ | 2,492,440 |
| **එකතුව** | **16,522,290** |



## ආයතනික පාලන ප්‍රකාශනය

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුළ ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා හේතුවී ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස් කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියා පටිපාටින්, ක්‍රියා පිලිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්ය සාධනය සඳහා වගකීව යුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳි සිටින්නේය.

### වගකීම්

මූලික ප්‍රතිපත්තීන් හා උපායශීලි අරමුණ සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳි සිටී. සමාගමේ මූල්‍ය තොරතුරු වල විශ්වාසනියත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සඳහා ද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

### සංයුතිය

සභාපති සහ විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය 2016 වර්ෂයේ අධ්‍යක්ෂවරුන් හත්දෙනෙකුගෙන් යුක්ත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියලු කාර්යයන්වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්ථන වියදම් සමාලෝචනයට ලක් කිරීම මෙම රැස්වීමේදී සිදුවේ. සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

2016 වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 17 ක් පවත්වා ඇත.

### විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් යුක්තය.

විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන පී.බී.එස්.සී. නෝනිස් මහතා විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුළ ඇගයීම් 04 ක් සිදුකර ඇත. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියකු නිරීක්ෂකයෙකු වශයෙන් විගණන කමිටු රැස්වීම් වලට සහභාගි වි ඇත.

සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි, විධායක අධ්‍යක්ෂක, නියෝජ්‍ය සමාන්‍යාධිකාරි වැවිලි, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි විමසීම් කරන අවස්ථාවලදී මෙම කමිටු රැස්වීම්වලට සහභාගි වේ.

### නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංගමික සංස්ථා පත්‍රය, සංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත් වන අනෙකුත් නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබන බවට සහතික වේ. එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි පිළියෙල කරන බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු වේ.

## අවදානම් කළමනාකරණය

විශේෂයෙන් කෘෂි ක්ෂේත්‍රයේ පවතින සමාගමක් ලෙස පරිසරය තුල විකාශය වීම හා විවිධ මට්ටමේ අවදානම් කෙරෙහි නිරාවරණය වී ඇති අතර කාලගුණ රටාව හා වෙළඳපළ උච්චාවචනයන් කෙරෙහි ඉහළ සංවේදීබවක් දක්වයි. අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තුලින් දැනුවත්ව හා දූරදර්ශීභාවයෙන් අවදානම් දැරීම කෙරෙහි සහතික වීම බලාපොරොත්තු වේ.

### අවදානම් පාලන ක්‍රමෝපායන්

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| දේශගුණික වෙනස්වීම් | මාස ගණනක් අඛණ්ඩව පවතින අනපේක්ෂිත නියඟ වැනි අයහපත් කාලගුණික තත්වයන් නිසා පොල්, කජු සහ අනෙකුත් බහු වාර්ෂික බෝගවල අස්වැන්න උච්චාවචනය. | වගාවේ පස් අතර වර්ෂා ජලය රඳවා තබා ගැනීම සඳහා විශාල අගල් කපා පොල් ලෙලි වළලා පසේ තෙතමනය වැඩිකර ගැනීමට කටයුතු කිරීම හා ගිනිසීරියා, පියුරේරියා වැනි ආවරණ බෝග වැවීම.<br><br>පසු කාලීනව වාරි සම්පාදනය සඳහා භාවිතා කිරීමට හා පාංශු තෙතමනය ආරක්ෂා කිරීම තුලින් මුල් මගින් ශාක වලට අවශ්‍ය ජලය සැපයීම සඳහා වර්ෂා ජලය එක් රැස් කර ගැනීමට වැව් වැඩි සංඛ්‍යාවක් පිළිසකර කිරීම. |
| නිෂ්පාදනය අඩුවීම | වයස අවුරුදු 50 ට වැඩි මේරූ ගස් ඉහළ ප්‍රතිශතයක් පැවතීම නිසා එම ගස් වියපත්, ඵල නොදරන තත්ත්වයට පත්වීම.<br><br>ඊට අමතරව, අනපේක්ෂිත රෝග හා ස්වාභාවික හේතු ශාකවලට සහ වගාවට බලපෑම. | වයස් ගත ශාක ගහණය වෙනුවට යටි වගා හා නව වගා ඇති කිරීම.<br><br>මයිටා මර්ධනය සඳහා රසායනාගාර 02 ක් පළුගස්වැව වතුයායේ සහ දිවුලපිටිය වතුයායේ ස්ථාපිත කිරීම. |
| භාණ්ඩ වෙළඳ චක්‍රය | ආහාර සඳහා ගනු ලබන පොල් හා ආශ්‍රිත නිෂ්පාදන වෙනුවට ආදේශක භාණ්ඩ පැවතීම තුළින් පාරිභෝගික ඉල්ලීම අඩු වීමෙන් මිල පහත වැටීම සහ අස්ථාවර අලෙවිය නිසා විශාල පොල් ගෙඩි ප්‍රමාණයක් වතුයායන් තුළ ගොඩ ගැසී තිබීම තුළින් විකල්ප ක්‍රියා මාර්ග නොගත හොත් නරක් වීමට හා විනාශ වීමට ඉඩ තිබීම.<br><br>පාම් තෙල් වැනි තරඟකාරී ආදේශක භාණ්ඩ වල මිල අඩුවීම නිසා වැඩි පාරිභෝගික ආකර්ෂණයකට ලක් වීම තුළින් පොල් මිල හා ඉල්ලුම කෙරෙහි බලපෑම. | පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසියට අමතරව එහිදී අලෙවි නොවන පොල් ප්‍රධාන කාර්යාලයේ සෑම සති දෙකකට වරක් පවත්වනු ලබන පොල් පොළේ දී අලෙවි කිරීම.<br><br>අගය එකතු කළ නිෂ්පාදන සඳහා යොමු වීම.<br><br>වෙන්දේසියේ දී අලෙවි නොවන පොල් මගින් කොප්පරා නිෂ්පාදනය කර කොටසක් කොප්පරා ලෙස වෙන්දේසියේ දී අලෙවි කිරීම හා ඉතිරිය පලුගස්වැව වතුයායේ ස්ථාපිත කර ඇති තෙල් මෝලේ දී පිරිසිදු පොල්තෙල් නිෂ්පාදනය කිරීම |
| ප්‍රාග්ධන ආයෝජන අවදානම | අපේක්ෂිත ලාභ නොලැබීමේ අවදානම සහ ආයෝජනවලින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම. | ආයෝජන මට්ටම් අනුව හා අපේක්ෂිත ආපසු ගෙවීම් පදනම් කර ගනිමින් ප්‍රාග්ධන වියදම් අනුමත කිරීම සඳහා දැඩි පාලන ක්‍රමවේද අනුගමනය කිරීම. |

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන් |
|---|---|---|
| ණය අවදානම | නීති රෙගුලාසි වලින් බැඳීමට අපොහොසත් වීම මත ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් අයවීමට ප්‍රමාද වීමේ ඉඩකඩ තිබීම. | සමීප ගෙවීම් සුපරීක්ෂණ ක්‍රමවේද මගින් ගැනුම්කරුවන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම පිළිබඳ සහතික කිරීම.<br><br>ගෙවීම් කල්ගත වී ඇති හෝ ප්‍රතිචාර නොදක්වන ගැනුම්කරුවන්ගෙන් මුදල් පියවා ගැනීම සඳහා නීතිමය මැදිහත් වීම ලබා ගැනීම.<br><br>රජයේ කල්බදු ගෙවීම සුපරීක්ෂාකාරීව සොයා බලා ප්‍රමාදයකින් තොරව ගෙවා දැමීම. |
| සේවක කළමනාකරණය | අඩු ඵලදායීතාවයක් හා නිමැවුමක් ඇති වීමට හේතු වන රැකියාව පිළිබඳ දැනුම හා අභිප්‍රේරණය නොමැතිකම.<br><br>වැඩි වැටුප් හා ඉහළ තනතුරු අපේක්ෂාවෙන් සේවකයන් වෙනත් ක්ෂේත්‍රයන් හෝ සමාගම් වෙත යාම. | වැඩමුළු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br><br>මූල්‍ය දිරිදීමනා හා සුභසාධන ක්‍රියාමාර්ග මගින් සේවක ප්‍රතිලාභ වැඩි කිරීම.<br><br>නිතිපතා සංවාද මගින් සේවක වෘත්තීය සංගම් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.<br><br>සේවකයින්ට අදාළ වන ප්‍රතිලාභවලට අදාලව පාලන අවශ්‍යතා සියල්ලම ඇති කිරීමට කටයුතු කිරීම.<br><br>වෘත්තීමය යෝග්‍යතාවය අනුව ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා හැකි තරම් දුරට අභ්‍යන්තරිකව රැකියා උසස්වීම් ලබා දීමට ක්‍රියාකිරීම. |
| වත්කම් අවදානම | ගිනි, සොරකිය සහ යන්ත්‍රෝපකරණ ක්‍රියා විරහිත වීමේ අවදානම.<br><br>කෘමීන්, සතුන්ගෙන් වන හානි සහ අකුණුසැර, ගංවතුර වැනි ස්වාභාවික ආපදා. | සියලු ස්පෘශ්‍ය වත්කම් සඳහා රක්ෂණ ආවරණ ලබා ගැනීම.<br><br>එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට වත්කම් රැගෙන යාමේ දී දැඩි පාලන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.<br><br>ගිනි බාධක ඇති කිරීම මගින් පිටත සිට ආයතනයේ වතුවලට ගින්න පැතිරීම වලක්වා ගැනීම හා අනෙකුත් පූර්ව ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම.<br><br>අඛණ්ඩව හානි වළක්වා ගැනීමේ නඩත්තු වැඩසටහන් ක්‍රියාවට නැංවීම.<br><br>යහපත් කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කිරිම. |
| කීර්තිනාම අවදානම | ආයතනය පිළිබඳව හා වෙළඳාම, සේවා නියුක්තිය, කාර්ය පටිපාටියට අදාළ මූලධර්ම, ක්‍රියාපටිපාටින්, ප්‍රමිතීන්, නීති හා රෙගුලාසි පිළිබඳ ප්‍රමානවත් අවබෝධයක් නොමැති වීම.<br><br>පාරිභෝගික හෝ වෙළඳපොළ අවශ්‍යතා හා ප්‍රමිති වලට නොගැලපෙන නිෂ්පාදන.<br><br>කාර්ය සාධනය, ඉලක්ක හා ප්‍රමිති පිළිබඳ දැනුම නොමැතිකම. | කාර්ය මණ්ඩලය, බැංකුකරුවන්, පාරිභෝගිකයන් වැනි විවිධ උනන්දුවක් දක්වන පාර්ශව සමඟ ඵලදායී සන්නිවේදනයක් ඇති කිරීම.<br><br>නිෂ්පාදන ප්‍රමිතිය, නිෂ්පාදන ක්‍රමවේදය ප්‍රමිතිගත මට්ටමින් පවත්වාගෙන යාම.<br><br>අයවැය ක්‍රියාවලියේ හා අයවැය පාලන ක්‍රමවේදයක් මාසිකව අනුගමනය කිරීම මගින් සමාගමේ කාර්යසාධනය එහි ඉලක්ක සමඟ අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කිරීම.<br><br>භාණ්ඩ හා සේවාවල ගුණාත්මක භාවය පිළිබඳ පාරිභෝගික ප්‍රතිචාර ලබා ගැනීම. |

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තා

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ විගණන හා කළමනාකරණ කමිටුව 2003 ජුනි මස 02 වන දින දරණ යහ පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශකය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේනතුවේ 2010 දෙසැම්බර් මස 14 වන දින දරණ PED/55 චක්‍රලේඛය අනුව මෙහෙය වන ලදී.

2016 වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු 4 ක් පහත සඳහන් දින වලදි පැවැත් වු අතර ඒ සඳහා විගණන හා පරික්ෂණ වාර්තා 182 ක් ඉදිරිපත් කරන ලදී.

| විගණන කමිටු රැස්වීම් දිනය | සාකච්ඡාව සඳහා ගන්නා ලද විගණන හා පරීක්ෂණ වාර්තා ගණන |
|---|---|
| 2016 මාර්තු 30 වන දින | 47 |
| 2016 මැයි 17 වන දින | 48 |
| 2016 සැප්තැම්බර් 29 වන දින | 72 |
| 2016 දෙසැම්බර් 22 වන දින | 15 |

විගණන කමිටුවේ සාමාජිකයින් පහත පරිදි වේ. (2016/09/29 වන දින සිට)

| නිලධාරියාගේ නම | තනතුර |
|---|---|
| 1. පී.බී.එස්.සී. නෝනිස් මහතා | සභාපති - විගණන හා කළමනාකරණ කමිටු |
| 2. ඒ. ලක්කතාස් මහතා | සමාජික - විගණන හා කළමනාකරණ කමිටු |
| 3. ආනන්ද පුෂ්පකුමාර මහතා | සමාජික - විගණන හා කළමනාකරණ කමිටු |
| 4. රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව | නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටු |

පෙර පැවති විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වේ. (2016/09/29 දක්වා)

| නිලධාරියාගේ නම | තනතුරු |
|---|---|
| 1. එම්.ආර්.වී.ආර්. මීපුර මහතා | සභාපති - විගණන හා කළමනාකරණ කමිටු |
| 2. එච්.එම්.එන්.සී. හේරත් මහතා | සමාජික - විගණන හා කළමනාකරණ කමිටු |
| 3. අයියර් සහ සමාගම (බාහිර විගණකවරු) | නිරීක්ෂක - විගණන හා කළමනාකරණ කමිටු |

## අධ්‍යක්‍ෂ මණ්ඩල වාර්තාව

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

### නෛතික තත්ත්වය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදි) සහ 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමෙන් සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 07, ධර්මපාල මාවත, අංක 191, ජේ ආර් ජයවර්ධන මධ්‍යස්ථානය යන ලිපිනයෙහි පිහිටා ඇත. වතු යායන් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්කවල පිහිටා ඇත.

පහත සඳහන් ආකාරයට වතු කලාප 06 ක් යටතේ පාලනය කෙරේ.

පලුගස්වැව වත්ත

බිංගිරිය වතු කලාපය

හලාවත වතු කලාපය

දිවුලපිටිය වතු කලාපය

මාදම්පේ වතු කලාපය

තම්බපන්නි වතු කලාපය

### ප්‍රධාන ක්‍රියාකාරකම්

ප්‍රධාන වැවිලි භෝගය ලෙස පොල් සහ වෙනත් කෘෂි භෝග වගා කිරීම, නිෂ්පාදනය, පශු සම්පත් හා අනෙකුත් නිෂ්පාදන අලෙවි කිරීම.

### මූල්‍ය වාර්තා

2017 අගෝස්තු මස 24 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද මූල්‍ය වාර්තා පිටු අංක 36 සිට 67 දක්වා සඳහන්ව ඇත.

### විගණන වාර්ථා

සමාගමේ මූල්‍ය වාර්තා මත විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව පිටු අංක 33 සිට 35 හි සඳහන්ව ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 40 සිට 51 දක්වා සඳහන්ව ඇති අතර, පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී ගිණුම් කරණ ප්‍රතිපත්ති වල වෙනසක් සිදු කර නොමැත.

### අඛණ්ඩ පැවැත්ම

සමාගමේ කටයුතු පුරෝකථනය කළ හැකි අනාගතයක් සඳහා ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්ව ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව" යන සංකල්පය මත සකසා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

2016 වර්ෂයේ සමාගමෙහි  අධ්‍යක්ෂ මණ්ඩලය සංක්ෂිප්තව පහත පරිදි වේ.

### 2016 අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| වී.කේ.සී. හේරත් මහතා (2016/07/14 සිට) | සභාපති/ප්‍රධාන විධායක නිලධාරි |
| එම්.කේ.බී. සෙනවිරත්න මහතා (2015/05/08 සිට) | විධායක අධ්‍යක්ෂ |
| පී.බී.එස්.සී. නෝනිස් මහතා (2016/09/05 සිට) | අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත |
| ඒ. ලක්කතාස් මහතා (2016/05/19 සිට) | අධ්‍යක්ෂ |
| කේ.ජී.ඒ. පුෂ්පකුමාර මහතා (2016/07/14 සිට) | අධ්‍යක්ෂ 2016/07/14 වන දින දක්වා ක්‍රියාකාරි අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි කරන ලදි. |
| එච්.එම්.එන්.සී.හේරත් මහතා (2015/03/20 සිට) | අධ්‍යක්ෂ |

2016 ජනවාරි 1 සිට 2016 දෙසැම්බර් 31 අතර කාලය තුළ ඉවත් වූ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| රවින්ද්‍ර හේරත් මහතා | සභාපති/ප්‍රධාන විධායක නිලධාරි (2016/01/25 දක්වා) |
| එම්.ආර්.වී.ආර්.මීපුර මහතා | අධ්‍යක්ෂ / මහා භාණ්ඩාගාර නියෝජිත (2016/09/05 දක්වා) |
| ඩී.එම්.එල්.බණ්ඩාරනායක මහතා | අධ්‍යක්ෂ (2016/04/26 දක්වා) |
| එස්.එම්.ඒ. පුන්‍යකුමාර මහතා | අධ්‍යක්ෂ (2016/07/14 දක්වා) |

### විගණන කමිටුව

පහත සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන කමිටුව නියෝජනය කළ අතර වසර තුළ ඇගයීම් 4 ක් සිදු කර ඇත.

### විගණන කමිටුව -2016 (2016/09/29 දින සිට)

| | |
|---|---|
| පී.බී.එස්.සී. නොනිස් මහතා | සභාපති |
| ඒ. ලක්කතාස් මහතා | සාමාජික |
| කේ.ජී.ඒ. පුෂ්පකුමාර මහතා | සාමාජික |
| රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව | නිරීක්ෂක |

**පෙර පැවති විගණන කමිටුව - (2016/09/29 දක්වා)**

| | |
|---|---|
| එම්.ආර්.වී.ආර්.මීපුර මහතා | සභාපති |
| එස්.එම්.ඒ. පුන්‍යකුමාර මහතා | සාමාජික |
| එච්.එම්.එන්.සී.හේරත් මහතා | සාමාජික |
| අයියර් සහ සමාගම - බාහිර විගණකවරු | නිරීක්ෂක |

**කාර්ය සාධනය**

වර්ෂය තුළ සමාගමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සහ වැදගත් කළමනාකරණ සහ සංවර්ධන වැඩසටහන් පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය හා කළමනාකරණ හා මූල්‍ය සමාලෝචනය යටතේ දක්වා ඇත.

**අයභාරය**

2016 වසර තුළ සමාගමේ අයභාරය රුපියල් මිලියන 383 ක් වන අතර (2015 රු. මිලියන 399) වර්ෂය තුළ වෙනත් මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 66 ක් විය.

වර්ෂය තුළදී මූල්‍ය අදායම රු. මිලියන 14 ක් වූ අතර විගණනය කරන ලද මූල්‍ය වර්තාවල එය දක්වා ඇත.

**මූල්‍ය ප්‍රතිඵල**

සමාගම සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 70.7ක බදු පසු ශුද්ධ ලාභයක් ලබාගෙන ඇත (2015 - රුපියල් මිලියන 81.4). විස්තරාත්මක මූල්‍ය ප්‍රතිඵල විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශනය තුළ ඇතුළත් වේ.

**ස්ථාවර වත්කම්**

2016 වර්ෂය තුළදී සමාගම රු. මිලියන 86 ක් (2015 වර්ෂයේදී රු. මිලියන 87) නව වගාවන් යටි වගාවන් හා නොමේරූ වගාවන් නඩත්තුව වෙනුවෙන්ද රු. මිලියන 17 ක් ද දේපල පිරියත උපකරණ වෙනුවෙන්ද අයෝජනය කරන ලදි. (2015 රු. මිලියන 18)

2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයට අනුව ජංගම නොවන වත්කම් (දේපල, පිරියත, උපකරණ, ජෛව වත්කම්, කල්බදු වත්කම්) වල ශුද්ධ පොත් අගය රුපියල් මිලියන 966 කි (2015 රු. මිලි. 886). විස්තර විගණිත මූල්‍ය වාර්තාවේ සටහන් තුළ දක්වා ඇත.

**කෙටි කාලීන ආයෝජන**

2015 වර්ෂයේ රු. මිලියන 152.6 ට සාපේක්ෂව 2016 වර්ෂයේදී සමාගමේ කෙටි කාලීන අයෝජන රු. මිලියන 140.8 ක් විය. මෙම ආයෝජන රු. මිලියන 112.8 ක් ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතුවලද මිලියන 28 ක් භාණ්ඩාගාර බිල් පත්වලින් ද සමන්විත වේ.

**සංචිත**

2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ ඇති සම්පූර්ණ සංචිත රු. මිලියන 633.8 ක් වූ සමුච්චිත ලාභයෙන් හා රු. මිලියන 61.8 ක් වූ දැව සංචිතයෙන් සමන්විත වේ. සංචිත වල වෙනස් වීම සහ සංයුතිය විගණනය කරන ලද මූල්‍ය වාර්තා වල ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයෙන් දැක්වේ.

**කොටස් ප්‍රාග්ධනය**

2016 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනය රු. 200,000,010 ක් විය. සමාන්‍ය කොටස් 20,000,000 කින් සහ එක් ස්වර්ණමය කොටසකින් සමන්විත විය. කිසිදු ආකාරයක කොටස් නිකුත් කිරීමක් 2016 වසර තුළ සිදු කර නොමැත.

**ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්**

අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් විගණන වාර්තාවේ සටහන් අංක 27 හි අන්තර්ගත කර ඇත.

**මූල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම**

මෙම වාර්තාවේ හෙළිදරව් කර ඇති කරුණු හැර සමාගම කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදු කළ හැකි ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් කිසිවක් නොමැත.

**අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්**

සමාගමේ ගිණුම් වාර්තාවල සටහන් අංක 26 හි ප්‍රකාශ කර ඇති බැඳීම් හැර අධ්‍යක්ෂවරුන්ගේ ඍජු හෝ වක්‍ර වෙනත් බැඳීම් නොමැත.

**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම**

සමාගමේ කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ ඔහුගේ / ඇයගේ කාලත්‍රයෙකු සමාගමේ කොටස් හිමිකම් දරන්නේ නැත.

**සේවා නියුක්තිය**

සමාගමේ තිරසාර උන්නතිය සඳහා රජයේ නීති වලට අනුකූලව කටයුතු කරන අතර සේවකයින් සම්බන්ධයෙන් පුහුණුව, උසස්වීම්, විනයානුකූල තීරණ ආදි කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට කුසලතාව පදනම්ව එක හා සමාන අවස්ථාවන් සලසනු ලබයි. එසේම සමාගම සේවකයන්ට සම තැන පදනම මුලික කර ගනිමින් සෑම සේවා නියුක්තිකයෙකු හටම ලිංග බේදය, ජාති බේදය, ආගම, විවාහක තත්ත්වය, දේශපාලන පසුබිම හෝ කායික දුබලතාවයන් නොසලකා සම අවස්ථාවන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

**ව්‍යවස්ථාපිත දීමනා**

සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු සහ සමාගමේ සේවා නියුක්තියන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

**විගණකවරු**

2016 වසර සඳහා වූ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරන ලදී.

**වාර්ෂික මහා සභා රැස්වීම**

හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2017 දෙසැම්බර් 19 වන දින පස්වරු 1.30 ට නො.2 යෝක් වීදිය, කොළඹ 01 ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේදී පැවැත්වීමට නියමිතය, මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය මේ සමඟ අමුණා ඇත.

මෙම වර්තාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

වී.කේ.සී. හේරත් මහතා
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

එම්.කේ.බී. සෙනවිරත්න
විධායක අධ්‍යක්ෂ

කෝපරේට් ඇඩ්වයිසරි සර්විස් (පුද්) සමාගම
ලේකම්වරු, හලාවත වැවිලි සමාගම
කොළඹ.

## අධ්‍යක්‍ෂ මණ්ඩල වගකීම් පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳව වගකීම හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි. සමාගමේ විගණක වන විගණකාධිපතිතුමාගේ වගකීම පිළිබඳ සිය වාර්තාවෙන් සංක්ෂිප්තව දක්වා ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් කර ඇති 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු එමගින් දක්වා ඇත.

සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇති බවටත් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ සියලු ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිතා කළ බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙම ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් වන අවස්ථා ඇතොත්, ඒවා නිසියාකාරයෙන් අනාවරණය කර ඇති අතර ඊට හේතු පැහැදිලි කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා භාවිතා කරන ලද විනිශ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ හා විචක්ෂණශීලි වෙයි. සමාගම තම මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයන් හා සාධාරණ ලෙස නිර්වචනය කිරීම සඳහා නිසි ලෙස මූල්‍ය වාර්තා පවත්වාගෙන යාමේ වගකීම පිළිබඳ අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ කාර්යයන් පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටියි.

සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව සමස්ත වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වාලන අභ්‍යන්තර පාලන ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ස්ථාපිත කරන ලද අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගෙන් සමන්විත අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මූල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මගින් ගනුදෙනු නිසි අධිකාරියට අනුව සිදු වන බවට හා නිසි පරිදි වාර්තා වන බවටත් සියලු වත්කම් ආරක්ෂා විය හැකි ප්‍රමාණාත්මක අවප්‍රකාශ හා වංචා වලක්වා හෝ සාධාරණ කාලයක් තුළ දැන ගැනීමට හැකි වන පරිදි සකසා ඇති බව සනාථ කරයි.

ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අඛණ්ඩ පැවැත්ම නොවෙනස්ව අනුගමනය කරනු ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරීක්ෂණයන් හා සමාලෝචනයන් කිරීමට සියලුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සියලුම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තා, අදාල දත්ත සමග පරීක්ෂා කර ඔවුන් ගේ නිදහස් අදහස් පළ කර ඇති අතර, එම වාර්තාද වාර්ෂික වාර්තාව තුල ඇතුලත් කර ඇත.

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු හා සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවීම් සිදු කිරිම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සිමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විස් (පුද්) සමාගම

ලේකම්වරු, හලාවත වැවිලි සමාගම

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ඒ/ඒ/සීපීඑල්/01/16/26    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2017 සැප්තැම්බර් 30 දින

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ

කොටස්හිමිකරුවන් වෙත,

**සීමාසහිත හලාවත වැවිලි සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.**

---

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

(අ) අනවසරයෙන් අත්පත්කරගත් ඉඩම් හා එම පුද්ගලයින්ගේ නම් ලැයිස්තු, ඉඩම් නිදහස් කිරීමේ අරමුණු, ඉඩම් සැලසුම් හා පිඹුරුපත් ආදී සාක්ෂි නොමැති වීම හේතුවෙන් අනවසර ඉඩම් අත්පත්කරගැනීම් හා නිදහස් කිරීම ඇතුළුව වටිනාකම රු.142,502,287 ක් වූ කල්බදු ඉඩම් හෙක්ටයාර 5,733 ක් සන්නිරීක්ෂණය කිරීම හෝ විගණනයට පිළිගැනීම ප්‍රමාණවත් පරිදි සිදුකළ නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි වගන්ති අංක 51 අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.7,302,940 ක් වූ මෝටර් රථ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත හලාවත වැවිලි සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව**

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය මඟින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) ඉහත මතය සඳහා පදනම, විෂය පථය සහ සීමාවන්

(ආ) මා දරන්නාවූ මතය

- තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා ලබාගත් අතර මා විසින් සිදුකරන ලද පරීක්ෂාවෙන් පෙනී යන පරිදි, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල වේ.

**වාර්ෂික වාර්තා සභාගත කිරීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

**අ/ක. එච්. එම්. ගාමිණී විජේසිංහ**
**විගණකාධිපති**

**එච්.එම්.ගාමිණී විජේසිංහ**

**විගණකාධිපති**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන් | 2016 | 2015 සංශෝධිත |
|---|---|---|---|
| | | රු. | රු. |
| අයභාරය | 19 | 383,089,914 | 399,365,998 |
| විකුණුම් පිරිවැය | | (234,382,941) | (250,617,694) |
| **දළ ලාභය** | | **148,706,973** | **148,748,305** |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ප්‍රතිලාභ | 20 | 65,941,736 | 80,380,044 |
| පරිපාලන වියදම් | | (102,545,104) | (106,461,392) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (8,692,761) | (13,492,529) |
| **මෙහෙයුම් තුළින් ජනනය වූ ලාභය** | | **103,410,843** | **109,174,428** |
| මූල්‍ය ලාභය | 21 | 14,193,632 | 10,734,205 |
| මූල්‍ය පිරිවැය | 21.A | (32,787,852) | (31,616,099) |
| බදු පෙර ලාභය | 22 | **84,816,623** | **88,292,534** |
| බදු වියදම් (වෙන්කිරීම්) | 23 | (15,144,615) | (9,610,612) |
| **වර්ෂය සඳහා ලාභය** | | **69,672,008** | **78,681,922** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභය/අලාභය | 08 | 1,091,543 | 2,761,980 |
| **වර්ෂයට මුළු විස්තීර්ණ ආදායම් බදු පසු** | | **70,763,551** | **81,443,902** |
| කොටසක ඉපැයුම | 24 | **3.48** | **3.93** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීමය.

පිටු අංක 40 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

හලාවත,
2017, අගෝස්තු මස 24 වන දින.

## හලාවත වැවිලි සමාගම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2016 රු. | 2015 සංශෝධිත රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ජනවසම වතුවල හිස් ඉඩම්වල කල්බදු හිමිකම් | 04 | 76,488,705 | 79,177,427 |
| ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම් (භාවිතයට ගැනිමට අයිතියක් ඇති ඉඩම් කල්බදු ජෛව හිමිකම් හැර) | 05 | 1,434,812 | 2,484,859 |
| ජනවසම වතුයායන්වල ජෛව වත්කම්වල කල්බදු හිමිකම | 06 | 26,893,743 | 30,441,473 |
| ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර) | 07 | 722,636,467 | 632,136,502 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් | 7.3 | 42,245,501 | 37,096,469 |
| සින්නක්කර දේපල පිරියත හා උපකරණ හිමිකම් | 08 | 96,643,719 | 104,957,876 |
| | | 966,342,948 | 886,294,608 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 09 | 104,999,422 | 47,613,234 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 10 | 48,435,673 | 36,496,447 |
| රාජ්‍ය ව්‍යවසායන්වලට සපයන ලද මූල්‍ය පහසුකම් | 11 | | |
| වෙනත් මූල්‍ය වත්කම් | 11.1 | 11,011,936 | 8,256,427 |
| වෙනත් ජංගම වත්කම් | | 1,929,727 | 4,453,242 |
| කෙටි කාලීන ආයෝජන | 12 | 140,868,261 | 152,646,142 |
| මුදල් හා බැංකු ශේෂයන් | | 5,087,898 | 7,416,487 |
| | | 312,332,917 | 256,881,980 |
| **මුළු වත්කම්** | | **1,278,675,864** | **1,143,176,587** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| කොටස් ප්‍රාග්ධනය | 13 | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ඉපැයීම් | | 633,885,863 | 598,276,777 |
| දැව සංචිත | | 61,840,917 | 56,686,452 |
| **මුළු ස්කන්ධය** | | 895,726,790 | 854,963,239 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්භිත ආදායම්** | | | |
| විලම්භිත බදු බැරකම | 14 | 61,850,251 | 49,092,652 |
| විලම්භිත ආදායම් - ප්‍රදාන හා ආධාර | 15 | 6,791,464 | 7,190,426 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් | 16 | 72,493,267 | 67,834,120 |
| කල්බදු ගිවිසුම් යටතේ ඇති බැඳියාවන් -ජනවසම | 17 | 107,223,139 | 109,356,591 |
| | | 248,358,121 | 233,473,789 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ | 18 | 135,832,364 | 54,880,651 |
| ආදායම් බදු බැරකම් | | (3,374,863) | (2,192,488) |
| කල්බදු ගිවිසුම් යටතේ ඇති බැඳියාවන් - ජනවසම | 17 | 2,133,452 | 2,051,396 |
| | | 134,590,953 | 54,739,559 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **1,278,675,864** | **1,143,176,587** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීමය

පිටු අංක 40 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**සනාථ කිරීම.**

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර ඇති බව සහතික කරමි.

**ආර්. එම්. ආර්. බී. රත්නායක**
ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

මෙම මූල්‍ය වාර්තා සැකසීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරනු ලැබේ.

**වී.කේ.සී. හේරත්**
සභාපති

**එම්.කේ.බී. සෙනවිරත්න**
විධායක අධ්‍යක්ෂ

**හලාවත,**
**2017, අගෝස්තු මස 24 වන දින.**

**ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය**
2016 දෙසැම්බර් 31 දිනට

| විස්තරය | කොටස් ප්‍රාග්ධනය | දැව සංචිත | සමුච්චිත ලාභය | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 200,000,010 | 32,151,932 | 543,861,623 | 776,013,565 |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් (සටහන - A) | | | (2,494,228) | (2,494,228) |
| වර්ෂයේ ලාභය/(අලාභය) (සටහන - B) | | | 78,681,922 | 78,681,922 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | | 2,761,980 | 2,761,980 |
| දැව සංචිතයට මාරු කිරීම | - | 24,534,520 | (24,534,520) | - |
| මුළු විස්තීර්ණ ආදායම් | - | 56,686,452 | 54,415,154 | 78,949,674 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **56,686,452** | **598,276,777** | **854,963,239** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | | 69,672,008 | 69,672,008 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | 1,091,543 | 1,091,543 |
| දැව සංචිතයට මාරු කිරීම | | 5,154,465 | (5,154,465) | - |
| මුළු විස්තීර්ණ ආදායම් | 200,000,010 | 61,840,917 | 663,885,863 | 925,726,790 |
| දැව සංචිතයට මාරු කිරීම | | | | |
| 2015 ලාභාංශ | | | (30,000,000) | (30,000,000) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **61,840,917** | **633,885,863** | **895,726,790** |

**සටහන (ඒ) - පෙර වර්ෂය සඳහා කරන ලද නිවැරදි කිරීම්**

| | |
|---|---|
| 2012 සිට 2014 දක්වා ගම්මිරිස් ව්‍යාපෘතිය සඳහා කරන ලද වියදම් නොමේරු වගාවට මාරු කිරීම. | 958,918 |
| 1992 සිට 2014 දක්වා අලෙවි කරන ලද පොල් ගස් වටිනාකම ගිණුම් වලින් ඉවත් කිරීම | (3,453,146) |
| | **(2,494,228)** |

**සටහන - (බි) 2015 වර්ෂයේ ලාභ සැසඳුම් ප්‍රකාශය**

| | |
|---|---|
| 2015 වර්ෂය සඳහා වර්තා කරන ලද ලාභය | 76,171,897 |
| ගම්මිරිස් ව්‍යාපෘතිය සඳහා කරන ලද වියදම් නොමේරු වගාවට මාරු කිරීම. | 277,588 |
| අඹ ව්‍යාපෘතිය සඳහා කරන ලද වියදම් නොමේරු වගාවට මාරු කිරීම. | 202,696 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් අගය කිරීම මත වන බලපෑම දැව විකුණුම් වටිනාකම | (22,355,425) |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම්වල සාධාරණ අගය වෙනස් වීම මත ජනිත වු ප්‍රතිලාභය | 24,534,520 |
| අලෙවි කරන ලද ජෛව වත්කම්වල අගය ගැලපීම | (149,353) |
| **2015 වර්ෂයේ සංශෝධිත ලාභය** | **78,681,922** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීම්ය

පිටු අංක 40 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**හලාවත,**
**2017, අගෝස්තු මස 24 වන දින.**

## හලාවත වැවිලි සමාගම

### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ / (යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු පෙර ලාභය | 84,816,623 | 88,292,534 |
| **ගැලපීම්** | | |
| - ක්ෂයවීම /ක්‍රමක්ෂය වීම | 39,174,417 | 40,139,139 |
| - සේවක ලාභ කොටස් සඳහා වෙන් කිරීම | 7,828,181 | 8,868,397 |
| - ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂයවීම් | (398,962) | (429,158) |
| - රාජ්‍ය කල්බදු සඳහා මූල්‍ය ගාස්තු | 32,115,849 | 31,090,320 |
| - බොල් ණය ප්‍රතිපාදන | (421,258) | 546,258 |
| - මූල්‍ය ආදායම් | (14,193,632) | (10,734,205) |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය හා වෙන්කිරීම් | 12,983,458 | 12,432,089 |
| - දේපල, පිරියත, හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් ලාභය | 30,187 | (294,015) |
| - පොල් ගස් අලෙවි කිරීමෙන් ලද ලාභය | (17,356,052) | (19,532,788) |
| | 144,578,811 | 150,378,571 |
| වෙනස්වීම් | | |
| - තොගවල (අඩුවීම) / වැඩිවීම | (57,386,187) | 25,818,339 |
| - කිරි පශු සම්පත් | (11,490,500) | (1,672,000) |
| - පාරිභෝජ්‍ය ජෛව වත්කම් | (5,149,032) | (2,194,122) |
| - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | (9,994,653) | (2,808,477) |
| - වෙනත් ජංගම වත්කම් | 2,523,515 | (3,193,463) |
| - වෙනත් මූල්‍ය වත්කම් | (2,755,509) | |
| - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 51,991,929 | (5,105,917) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | 112,318,375 | 161,222,930 |
| - නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් | (7,232,768) | (6,956,474) |
| - සේවක ලාභ කොටස් සඳහා ගෙවීම් | (8,868,397) | (5,713,435) |
| - මූල්‍ය කල්බදු ගෙවීම් | (32,115,849) | (31,090,320) |
| - මූල්‍ය ආදායම් ලැබීම් | 12,670,316 | 11,488,388 |
| - ආදායම් බදු ගෙවීම් | (3,569,391) | (2,273,223) |
| - පොල් ගස් අලෙවියෙන් ලද ආදායම | 17,465,910 | 19,682,141 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 90,668,196 | 146,360,007 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| - දේපල, පිරියත හා උපකරණ එකතු කිරීමෙන් | (16,344,955) | (12,830,427) |
| - ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | (86,348,127) | (87,397,326) |
| - දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලැබීම් | (30,187) | 294,040 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (102,723,270) | (99,933,713) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| - ලාභාංශ ගෙවීම් | - | - |
| - රාජ්‍ය කල්බදු සඳහා ප්‍රාග්ධන පියවීම් | (2,051,396) | (1,972,497) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (2,051,396) | (1,972,497) |
| **මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | (14,106,470) | 44,453,797 |
| වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම (සටහන අ) | 160,062,629 | 115,608,832 |
| වසර අවසානයේ මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම (සටහන ආ) | **145,956,159** | **160,062,629** |
| **සටහන (අ)** | | |
| මුදල් හා මුදල්වලට සමාන දෑ වසර ආරම්භයේ | | |
| කෙටි කාලීන ආයෝජන | 152,646,142 | 113,275,930 |
| මුදල් හා බැංකු ශේෂයන් | 7,416,487 | 2,332,902 |
| | 160,062,629 | 115,608,832 |
| **සටහන (ආ)** | | |
| මුදල් හා මුදල්වලට සමාන දෑ වසරාවසානයේ | | |
| කෙටි කාලීන ආයෝජන | 140,868,261 | 152,646,142 |
| මුදල් හා බැංකු ශේෂයන් | 5,087,898 | 7,416,487 |
| | **145,956,159** | **160,062,629** |

වරහන් තුළ ඇත්තේ අඩුකිරීමය.
පිටු අංක 40 සිට 67 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ.

**හලාවත,**
**2017, අගෝස්තු මස 24 වන දින.**

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

## 1 සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්තාකරණ ස්ථිතිය

#### 1.1.1 පිහිටුවීම සහ නෛතික ආකෘතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යලි ලියාපදිංචි කරන ලදී) සහ 1987 අංක 23 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමෙන් සීමාසහිත සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 07, ධර්මපාල මාවත, අංක 191, ජේ ආර් ජයවර්ධන මධ්‍යස්ථානය යන ලිපිනයෙහි පිහිටා ඇත. වතු යායවල් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්කවල පිහිටා ඇත.

#### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

පොල් වගා කිරීම, කොප්පරා නිෂ්පාදනය හා අමු පොල් හා කොප්පරා අලෙවිය වසර තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

#### 1.1.3 පරිපාලකය සහ අවසන් පරිපාලකය

සමාගමේ පරිපාලකය වනුයේ ශ්‍රී ලංකා රජයයි.

### 1.2 නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

2017 අගෝස්තු මස 24 වන දින දරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව 2016 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදි.

## 2 සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ 1995 අංක 15 දරන පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (CASL) විසින් නිකුත් කරන ලද ණප්‍රමිත (SLFRS/LKAS) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානවලට අනුකූලව සකසා ඇත.

### 2.2 ඇගයීම් පදනම

මූල්‍ය ප්‍රකාශනවල අංක 04, 05 සහ 06 දරන සටහන්වල විස්තර කර ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් එනම්, කල්බදු ගිවිසුම් යටතේ ඇති JEDB වතු හැරුණු කොට ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. සුදුසු පරිදි විශේෂ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල විස්තර කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශනවල ඇති උද්ධමනීය සාධක සඳහා ගැලපීමක් සිදු කර නැත.

### 2.3 භාවිතා කරන සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

සමාගමේ භාවිතා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මඟින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට දක්වා ඇත.

### 2.4 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලවන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අදාළ කර ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් යනාදියට බලපාන ඇස්තමේන්තු විනිශ්චය සහ උපකල්පිතයන් තීරණය කිරීමට කළමනාකරණයට සිදු වේ. විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ වාතාවරණ යටතේ සාධාරණ වන බවට විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු ඓතිහාසික අත්දැකීම් හා අනෙක් සාධක මත පදනම්වය. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන පවත්නා පදනම මත සමාලෝචනය කර ඇත. ඇස්තමේන්තු සංශෝධනය එම කාලපරිච්ඡේදයට හා අනාගත කාල වකවානුවට බලපාන්නේ නම් එම කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනය ද සිදු කරනු ලැබේ.

### 2.5 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගමේ හැකියාව සමාගමේ කළමනාකාරීත්වය විසින් ඇගයීමට ලක් කර ඇති අතර නුදුරු අනාගත කාලයක් දක්වා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගමට තිබෙන බවට සෑහීමකට පත්විය. තව ද ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැකයක් ඇති කළ හැකි කිසියම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වයට වාර්තා වී නොමැත. අඛණ්ඩ බව පිළිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව සකස් කරනු ලැබේ.

### 2.6 සංසන්දනාත්මක තොරතුරු

ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගෙන යන අතර ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට ගැලපෙන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර ඇත.

### 2.7 වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සිද්ධීන්

වාර්තාකරණ දිනයෙන් පසු හටගත් සියලුම ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 වත්කම් හා ඒවායේ අගය කිරීම් සඳහා පදනම්

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් යනු මුදල් හා සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ වාර්තා කරන දිනයේ සිට වසරක කාල පරිච්ඡේදයක් ඇතුළත යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කරනු ලබන වත්කම් වේ. වාර්තා කරන දිනයේ සිට වසරක කාලයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් සඳහා සමාගමට රඳවා ගැනීමට සිදුවන වත්කම් ජංගම නොවන වත්කම් වේ.

#### 3.1.1 දේපළ, පිරියත හා උපකරණ

#### 3.1.1.1 හඳුනා ගැනීම සහ ඇගයීම

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්ෂය වෙන් කිරීම් හා අපහරණයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

**(අ) සන්තක දේපළ**

දේපළ, පිරියත හා උපකරණ ඒවා අත්පත් කර ගැනීමේ දී දැරූ සෘජු පිරිවැයයි. සමාගම විසින් ඉදිකරන ලද වත්කමක් නම් එම වත්කම අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒම දක්වා දැරූ සියලු පිරිවැය, එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා ඒ සඳහා සෘජුව දායකවිය හැකි වෙනත් වියදම් ඇතුළත් වේ. උපකරණ ක්‍රියාකාරීත්වයට අදාළව මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපළ, පිරියත හා උපකරණවල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාල සීමාවල දී මාරු කිරීම් සිදුකරන අවස්ථාවල දී පිළිවෙලින් එම කොටස් එලදායී ආයු කාලයක් හා ක්ෂය කළ හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම සැලකිය යුතු අන්දමින් පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී හඳුනා ගැනීමේ නිර්ණායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය දේපල පිරියත හා උපකරණවල ප්‍රතිෂ්ඨාවක් ලෙස ධාරණ අගයට එකතු කිරීමක් ලෙස හඳුනා ගනු ලැබේ. අනිකුත් සියලුම අලුත්වැඩියා හා නඩත්තු විස්තීරණ ප්‍රකාශනයේ වියදම් ලෙස දැක්වේ. නොනිමි ප්‍රාග්ධනය, ඊට අදාළ

වත්කම්වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය. ප්‍රාග්ධන නොනිමි වැඩ පළමු උපයෝජනයේ දී හෝ වත්කම ආරම්භ කරන වේලාවේ දී එක් එක් වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

**(ආ) කල්බදු වත්කම්**

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපළ, පිරියත හා උපකරණ ( බදු ගත් භාණ්ඩය හිමිකර ගැනීමෙන් සමාගමට අවධානමක් හෝ වාසියක් සෘජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම කල්බදු ගෙවීම් වල කල් බද්ද ආරම්භයේ තීරණය කරන ලද වර්තමාන වටිනාකමට සමාන අගයන්ගෙන් අඩු අගය මත ප්‍රාග්ධනිතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි.

බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොළී ප්‍රමාණය එක් එක් වර්ෂයේ වියදමක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ දක්වයි. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොළී ගණනය වීම සිදුවේ.

බදු දේපළ වැඩි දියුණු කිරීම සඳහා කරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාල පරිච්ඡේදය තුළ ක්ෂය කරනු ලබයි.

**3.1.1.2 පසුකාලීන පිරිවැය**

දේපළ, පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදී දරණ පිරිවැය එම කොටස පවත්වාගෙන යන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය විශ්වාසනීය ලෙස මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ඇත. ප්‍රතිෂ්ඨාපනය කරන ලද කොටස් වල ධාරණ අගය පහත දක්වා ඇති ප්‍රතිපත්තීන්ට අනුව හඳුනා ගැනීම ඉවත් කිරීම ලෙස හඳුන්වයි. දේපළ, පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

**3.1.1.3 හඳුනා ගැනීම ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීමේ දී හෝ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නැතැයි හැගෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනී. ඒ තුළින් ලැබෙන ලැබීම් හා පාඩු, ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයහාරය ලෙස වර්ගීකරණය නොකරයි.

**3.1.1.4 ක්ෂයවීම සහ ක්‍රමක්ෂය**

**(අ) ක්ෂයවීම්**

ක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගන්නා අතර දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ඒ එක් එක් දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂය ගණනය කරනු ලැබේ. වර්තමානයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.50 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 15 | 6.67 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10 | 10.00 |
| මෝටර් රථ | 05 | 20.00 |
| උපකරණ | 08 | 12.50 |
| ස්ථිර ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වැටවල් | 03 | 33.33 |
| ජල සැපයුම | 20 | 5.00 |

වත්කම් ක්ෂයවීම එය භාවිතය සඳහා ගත් අවස්ථාවේ ආරම්භ වී එය අලෙවි සඳහා තබා ඇති බවට හෝ වත්කමක් ලෙස හඳුනා නොගන්නා බවට වර්ගීකරණය කර ඇති දිනයේ දී අවසන් වේ. ක්ෂය ක්‍රමය ඵලදායී ජීවිත කාලය හා ශේෂ වටිනාකම් වාර්තාකරන දිනයේ දී අවශ්‍ය වන්නේ නම් නැවත තක්සේරු කරනු ලබයි

**(ආ) ක්‍රමක්ෂය**

කල්බදු කාලය අවසන් වීමත් සමගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දන්වා විට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. ජනවසමෙන් බදු ගත් වත්කම්වල බදු කාලය 2045 න් අවසන් වනු ඇත.

ජනවසම මඟින් අත්කර ගත් වත්කම්වල බදු අයිතිය ඉතිරි බදු කාලය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකෙන් අඩු කාලය තුළ සමාන කොටස්වලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර වර්තමාන ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය සංසන්දනාත්මකව පහත දැක්වෙන පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| හිස් ඉඩම් සඳහා කල් බදු අයිතිය | 53 | 1.89 |
| ඉඩමේ වැඩි දියුණු කිරීම | 30 | 3.33 |
| වෙනත් හිමි වූ වත්කම් | 30 | 3.33 |
| ගොඩනැගිලි | 25 | 4.00 |
| යන්ත්‍රසූත්‍ර | 15 | 6.67 |
| ජල සැපයුම | 20 | 5.00 |

**3.1.2 ජීව විද්‍යාත්මක වත්කම්**

**3.1.2.1 නොමේරූ හා මේරූ වගාවන්**

**(අ) නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගා)**

වැවිලි වතු පෞද්ගලීකරණය කරන අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ UITF රීති නියමයන්ට අනුව ජනවසම වතුයායවල මූල්‍ය කල්බදු යටතේ නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගාවන්) 1992 ජූනි 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ගිණුම්වලට ගෙන ඇත.

කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් සරල මාර්ග පදනම යටතේ විස්තීරණ මූල්‍ය ප්‍රකාශනය තුළ වර්තමාන සහ ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය පුරා සංසන්දනාත්මකව පහත සඳහන් ආකාරයට ක්‍රමක්ෂය කර ඇත.

| | වසර ගණන | අනුපාතිකය (%) |
|---|---|---|
| මේරූ වගාව | 30 | 3.33 |

**(ආ) කල්බදු දේපළ සංවර්ධනය කිරීම (නොමේරූ හා මේරූ වගා)**

වගා කරන කාලය තුළ එනම්, භූමිය සකස් කිරීම, පුනරුත්ථාපනය, අලුත් වගා කිරීම, නැවත වගා කිරීම, අන්තර් වගා කිරීම් සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙළීම දක්වා (වගා කර ඇති ප්‍රදේශ වසර 8 කට පසු මේරූ තත්ත්වයට පත් වන තුරු) වූ පිරිවැය නොමේරූ වගා යටතට ගැනේ. මෙම නොමේරූ වගා ඍජු පිරිවැය සහ අන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්ය පිරිවැයවලින් සමන්විත වේ. පවත්වාගෙන යන ජීව විද්‍යාත්මක වත්කම් (උදා: පොල්) වෙනුවෙන් දරණ ලද වියදම ඵල දරණ බවට පත් වන වර්ෂයේදී මේරූ වගාවන්ට මාරු කරනු ලබයි.

කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලය අවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායී ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙස හඳුනා ගනු ඇත.

ඇස්තමේන්තු ගත වර්තමාන සහ සංසන්දනාත්මක ඵලදායී ආයු කාලය පහත දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

| | වසර ගණන | අනුපාතිකය % |
|---|---|---|
| පොල් | 50 | 2.00 |
| කජු | 25 | 4.00 |
| වෙනත් | 20 | 5.00 |

**(ඇ) පාරිභෝජ්‍ය ජෛව වත්කම්**

පරිභෝජනය කළ හැකි දැව ගස් හඳුනා ගැනීමේදී මිණුම් කරන අතර එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 අනුව විකිණීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස් වල සාධාරණීය වටිනාකම ගණනය කරනු ලබන්නේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය (DCF) යොදා ගනිමිනි.

නොමේරූ ගස්වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි.

| | |
|---|---|
| මුදල් ඒකකය | ශ්‍රී ලංකා රුපියල් |
| දැව පරිමාව | විවිධ ප්‍රදේශයන්හි එක් එක් දැව විශේෂයන් හි දැඩි බව උස සහ වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදු කරයි. |
| ආර්ථික ඵලදායි කාලය | සමාගමේ වන වගා සැලසුම අනුව එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ආයු කාලය තීරණය කරනු ලබයි. |
| විකුණුම් මිල | පවතින ශ්‍රී ලංකා වෙළඳපොළ මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. |
| වට්ටම් අනුපාතය | අනාගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වෙන වට්ටම් අනුපාතයන් අනුව වට්ටම් ගත කෙරේ. දැව ගස් 14% |

**3.1.2.2 ගව පශු සම්පත**

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය තීරණය කරනු ලැබේ.

**3.1.3 විකිණීමට ඇති ජංගම නොවන වත්කම්**

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් එසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගයසේ සැලකේ. පවතින තත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාවිතාවක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත.

"විකිණීමට වෙන්කර ඇති දෑ" ලෙස වර්ගීකරණය කළ දේපළ, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

**3.1.4 තොගය**

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත යල්පැනුම් හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්ත්වයෙන් විකිණිය හැකි තත්ත්වයට පරිවර්තන සිදු කර සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

තොගය වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒම සඳහා දැරූ පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කර ගණනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට

| පාරිභෝජන සහ අමතර ද්‍රව්‍ය යෙදවුම් | පෙර ලැබීම් පෙර නිකුත් පදනම මත සත්‍ය පිරිවැය |
|---|---|
| පැළ තවාන් සහ බෝග වැවීම | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය පිරිවැය හා සෘජුව ආරෝපණය කළ හැකි පොදු කාර්යය පිළිබඳ යෝග්‍ය සමානුපාතික පිරිවැය. |
| නෙළාගත් අස්වැන්න | ජීව විද්‍යාත්මක වත්කම්වලින් නෙලා ගත් කෘෂි නිෂ්පාදන ඒවායේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර නෙලාගත් අවස්ථාවේ අගය කරයි.<br><br>අර්ධ නිමි සහ නිමි කෘෂිකාර්මික තොග අගය කිරීමේදී කෘෂි නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කර අගය  කරයි. |
| පශු සම්පත් | කිරි පශු සම්පත් තොග මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කිරීමෙනි.<br><br>කිරි පශු සම්පතේ සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නිකුත් කරනු ලබන චක්‍රෙල්බ අනුව තීරණය කරනු ලැබේ. |

### 3.1.5 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS39) යටතට ගැනෙන මූල්‍ය වත්කම් ලෙස, ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්, ණය හෝ ලැබිය යුතු දෑ හෝ, කල්පිරෙන තෙක් තබා ගෙන ඇති ආයෝජන හෝ විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස දැක්විය හැක. සමාගම එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මුල් හඳුනාගැනීමේ දී තීරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම මත ද ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම අනුව නොමැති වත්කම් සම්බන්ධව වන විට සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය හරහා හඳුනා ගනු ලැබේ.

මුදල්, කෙටි කාලීන තැන්පතු හා ආයෝජන, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය ආයතනවලට ලබා දුන් ණය සමාගමේ මූල්‍ය වත්කම්වලට ඇතුළත් වේ.

#### 3.1.5.1 ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

වෙළඳාම සඳහා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූලිකව හඳුනාගත් මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම්වලට ඇතුළත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කර්යය සඳහා අත්කර ගත්තේ නම් හෝ ආසන්න කාලයකින් නැවත මිලදී ගත්තේ නම් ඒවා වෙළඳාම සඳහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම යටතේ සාධාරණ වටිනාකමට සුදුසු වෙනස්කම් හඳුනාගන්නා අතර සාධාරණ වටිනාකම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වේ.

සමාගම ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම අනුව මූලික අවස්ථාවේ දි කිසිදු මූල්‍ය වත්කමක් නම් කර නැත.

#### 3.1.5.2 ණය හා ලැබිය යුතු ද

ණය හා ලැබිය යුතු දෑ යනු ස්ථාවර හෝ නිශ්චිත වාරික ගෙවීම් සහිත ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ මිල තීරණය නොවූ, ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වේ.

මූලිකවම සාධාරණ වටිනාකම හා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම මත සෘජුව හඳුනා ගන්නා ගනුදෙනු පිරිවැය සමඟ හඳුනා ගනී. පසුව සඵල පොළී අනුපාත ක්‍රමය මත අපහායනයන් අඩු කර ක්‍රමක්ෂය කර පවත්වා ගනී.

ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ වට්ටම් අත්පත් කර ගන්නා අවස්ථාවේ වූ අධි මිල ගාස්තු හෝ යම් වියදමක් වුයේ නම් ඒවා සඵල පොළී අනුපාත ක්‍රමයේ සංගටනීය කොටස ලෙස සැලකිල්ලට ගැනීමෙනි.

සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය ආදායම්වල ඇතුලත් වේ. හානිකරණය වීමෙන් මතුවන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය පිරිවැයවල හඳුනා ගෙන ඇත.

වෙළඳ ලැබිය යුතු දෑ, සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු මුදල්, තැන්පතු, අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු දෑ, මුදල් හා සමාන දෑ වලට ඇතුලත් වේ.

**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ පහත සඳහන් අවස්ථාවන් හැර, ප්‍රථමයෙන් එහි සාධාරණ අගය මත හඳුනා ගනී. පසුව ක්‍රමක්ෂය වටිනාකමෙන් හානිකරණයක් සිදුවී ඇත්නම් ඒ සඳහා වෙන් කිරීම් සිදු කර පවත්වා ගනී.

සම්බන්ධිත පාර්ශවයන්ට, පොළී රහිත හා නැවත ගෙවීමේ දී නිශ්චිත කොන්දේසි රහිතව ලබා දෙන ලද ණය පිරිවැයෙන්, හානිකරණයන් සිදුවී ඇත්නම් ඒ සඳහා අඩමාන හා බොල් ණය ප්‍රතිපාදනය සිදු කර මනිනු ලබයි.

ප්‍රකාශිත පොළී පදනමක් රහිත සහ වට්ටම් බලපෑමකින් තොරව කෙටි කාලීන ලැබිය යුතු දෑ ඉන්වොයිස් වටිනාකම මත හානිකරණය සඳහා වෙන් කිරීම් සිදු කළ යුතු වීම බොල් හා අඩමාණ ණය සඳහා වූ ප්‍රතිපාදනයන්ට යටත්ව මනිනු ලබයි.

**මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුළ මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල්, බැංකුවේ ඇති මුදල් , ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පතු ද ඇතුළත් වේ.

**3.1.5.3 කල්පිරීමට තිබෙන ආයෝජන**

සමාගමට ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත හා ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් කල්පිරීම් වන තෙක් තබා ගැනීමට අදහසක් හා හැකියාවක් තිබෙන්නේ නම් ඒවා කල්පිරීමට තබාගත් මූල්‍ය වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. මූලික ඇගයීමෙන් පසු කල්පිරීමට තබාගත් ආයෝජන සඵල පොළී ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂය පිරිවැයෙන් හානිකරණයන් වී ඇත්නම් අඩු කර ඇගයීම් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ දක්වා ඇත. හානිකරණය තුළින් ඇති වන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනා ගෙන ඇත. 2016 වර්ෂය සඳහා කල්පිරීමට නියමිත ආයෝජන ලෙස රු. 140,868,261/- කෙටිකාලීන ආයෝජන යටතේ පෙන්වා ඇත. (2015 වර්ෂයේ රු. 152,646,142/-)

**3.1.5.4 අලෙවියට ඇති මූල්‍ය ආයෝජන**

අලෙවියට ඇති මූල්‍ය වත්කම් යනු අලෙවියට ඇති ලෙස නම් කර ඇති හා ඉහත වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් නොවන ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව ඒවායේ වෙනස්වීම් හා සාධාරණ වටිනාකම මත අගයනු ලබයි. ඒ හැර හානිකරණය වීම වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගන්නා අතර සධාරණ වටිනාකමේ වැඩිවීම ස්කන්ධය සහ සංචිත යටතේ ඉදිරිපත් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන අලෙවියට ඇති ණය සුරකුම්පත්වල පොළී ආදායම ගණනය කරනු ලබන අතර ලාභ හෝ අලාභ මත හඳුනාගනු ලැබේ. ආයෝජන හඳුනා ගැනිමෙන් ඉවත් කරන විට ස්කන්ධය තුළ ඇති සමුච්චිත ලාභ හෝ අලාභ, ලාභ අලාභ ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබේ. 2016 වසර තුළ සමාගමේ අලෙවියට ඇති මූල්‍ය ආයෝජන නොමැත (2015 - ශුන්‍ය).

#### 3.1.5.5 මූල්‍ය වත්කම් හානිකරණය වීම

මූල්‍ය වත්කම් හානිකරණය වී තිබේ ද යන්න පිළිබඳ කිසියම් විෂය මූලික සාක්ෂි තිබේදැයි සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ඇගයීම් කරනු ලබන අතර එවැන්නක් සිදු වී ඇත්තේ නම් වත්කම ධාරණ අගය සහ අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය අතර වෙනස අනුව අලාභය ගණනය කරයි.

## 3.2 වගකීම් හා වෙන් කිරීම්

මූල්‍ය තත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනයේ සිට වසරක කාලයක් ඇතුළතදී ගෙවිය යුතු හෝ ඉල්ලූ විටදී ගෙවිය යුතු හෝ බැරකම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට වසරකට පසුව ගෙවිය යුතු බැරකම් ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනා ගත් සියලුම දන්නා වගකීම් සහ බැරකම් ගිණුම් ගත කර ඇත. අතීත හේතූන් මත සමාගම වෙත පැවරී ඇති නෛතික හා සාධනීය බැඳීම් හඳුනා ගෙන ඒවා පියවීම සඳහා මූල්‍ය කැප කිරීමක් අවශ්‍ය වන නීතිමය බැඳීම් පවතින්නේ නම් ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය වෙන් කිරීම් සිදු කරයි.

### 3.2.1 මූල්‍ය වගකීම්

**මූලික හඳුනා ගැනීම හා ඇගයීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 39 ට අනුව මූල්‍ය වගකීම් ලෙස ලාභ හෝ අලාභ අලාභ මත සාධාරණ අගයට ඇති මූල්‍ය වගකීම, ණය හා ණයට ගැනීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගම එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය මුල් හඳුනා ගැනීමේ දී තීරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වගකීම් මුල් අවස්ථාවේ දී සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර ණය හා ණයගැනීම් ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනී. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ.

සමාගමේ මූල්‍ය වගකීම් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ තුළ ඇතුලත් වේ.

#### 3.2.1.1 සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වගකීම්

ගනුදෙනු කිරීම සඳහා ඇති මූල්‍ය වගකීම් හා සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා මූලිකව හඳුනාගත් මූල්‍ය වගකීම් සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා ඇති මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ. මූල්‍ය වගකීම් ආසන්න කාලයකින් අලෙවි කාර්යය සඳහා රඳවා ගත්තේ නම් ඒවා ගනුදෙනු සඳහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ගනුදෙනු සඳහා රඳවා ගත් වගකීම්වල ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී. සාධාරණ අගය මත ලාභ හෝ පාඩු මත මූල්‍ය වගකීම් කිසිවක් සමාගම සතුව නැත.

#### 3.2.1.2 ණය හා ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසුව පොළී සහිත ණය හා ණයට ගැනීම් සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂ පිරිවැයට අගයනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රම ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා ගන්නා විට මෙන්ම ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනෙකුත් මූල්‍ය වගකීම් තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදු ඇතුළත් වේ.

### 3.2.2 මූල්‍ය අවදානම් කළමනාකරණ පරමාර්ථ හා ප්‍රතිපත්ති

වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදු සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම් වලට ඇතුලත් වේ. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීමයි. සමාගම විසින් රජයේ ව්‍යාපාර සඳහා ණය ලබා දී ඇති අතර වෙළෙඳාම හා අනෙකුත් ලැබිය යුතු දෑ හා මුදල් හා කෙටි කාලීන තැන්පතු සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සෘජුවම ලගාවී ඇත.

ඒ අනුව සමාගම මූල්‍ය මෙවලම් භාවිතයේදී ණය අවදානම්, ද්‍රවශීලතා අවදානම්, ව්‍යවහාර මුදල් අවදානම් සහ පොළී අනුපාත අවදානම් ආදියට මුහුණ පානු ඇත. මෙම සටහන සමාගම මුහුණපාන එම අවදානම් ගැන තොරතුරු සපයන අතර ඒවා කළමනාකරණය පිණිස සමාගමේ අරමුණු සහ ප්‍රතිපත්ති මගින් පැහැදිලි කරයි.

**3.2.2.1 ණය අවදානම**

ණය අවදානම යනු සමාගම විසින් ණය සපයා ඇති පාරිභෝගිකයෙක් හෝ පාර්ශවයක් සාධන පත්‍ර තම ගිවිසුම්, බැඳීම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ විට සමාගමට ලැබිය යුතු දෑ නොලැබීමෙන් ඇති වන මූල්‍ය අලාභයයි.

**3.2.2.2 ද්‍රවශීලතා අවදානම**

සමාගමට මුදල් හෝ අනෙකුත් මූල්‍ය වත්කම් මගින් පියවීමට ඇති එහි මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් ඉටු කිරීමේ දී මතු වන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම් වේ.

සමාගමට සාමාන්‍ය හා පීඩාකාරී තත්වයන් තුළ සමාගමේ කීර්තියට හානියක් නොමැතිව වෙනත් අලාභ ඇති නොවන ආකාරයෙන් හැකි තාක් දුරට සෑම විටම සිය වගකීම් පියවිය හැකි ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සතුව තිබීම මෙම අවදානම කළමනාකරණය කිරීමේ ප්‍රවේශයක් වේ.

**3.2.3 සේවක ප්‍රතිලාභ**

**(අ) නිර්වචිත දායක සැලසුම් - අර්ථ සාධක අරමුදල හා භාරකාර අරමුදල**

නිර්වචිත දායක සැලසුම් යනු අස්තිත්වයක් විසින් වෙනත් අස්තිත්වයකට (අරමුදලකට) ස්ථාවර දායක මුදල් ගෙවනු ලබන සහ තව දුරටත් දායක මුදල් ගෙවීමට නිතිමය හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් ඇති නොවන පශ්චාත් සේවා සැලසුම් වේ. සේවකයින් විසින් ලබා දෙන සේවය වෙනුවෙන් අදාළ කාලයට සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා භාරකාර අරමුදලට සියලුම සේවකයින් සඳහා කරනු ලබන ගෙවීම් වියදමක් සේ ලාභ අලාභ ප්‍රකාශනයේ සැලකේ.

සමාගම සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක් හා 3% පිළිවෙලින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා භාරකාර අරමුදලට මාසිකව දායකත්වය දරනු ලබයි.

**(ආ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම**

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම යනු නිර්වචිත දායක සැලසුම් හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වේ. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ගණනය කිරීමේ දී ආයු ගණන අගය කිරීම (Actuarial Valuations) පදනම භාවිත කරයි. ආයු ගණක අගය කිරීමේ දී වට්ටම අනුපාතය අනාගත වැටුප් වැඩිවීම වැනි කල්පිතයන් ඇති කර ගනී. මෙම බැඳීම් දිගුකාලීන නිසා එවැනි ඇස්තමේන්තු සැලකිව යුතු අවිනිශ්චිත තාවයකට ලක්වේ. භාවිත කළ කල්පිතයන් පිළිබඳ විස්තර 16 වැනි සටහනේ දැක්වේ. ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු මඟින් අරමුදල් වෙන්කර ඇත.

## 3.3 විලම්බිත ආදායම

**ප්‍රදාන හා සහනාධාර**

නිශ්චිතව ලැබෙතැයි විශ්වාස කළ හැකි රාජ්‍ය ප්‍රදාන ඊට අදාළ කොන්දේසි සහිත වනු ඇත. ප්‍රදාන වියදමකට සම්බන්ධ විට දැරීමට බලාපොරොත්තු වන පිරිවැය අනුව ක්‍රමානුකූල පදනමක් මත අදායමක් සේ ගැනේ එම ප්‍රදානය වත්කමකට අදාළ නම් එය වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුළ සමාන වාරික විලම්භීත ආදායමක් සේ වෙන් කෙරෙනු ඇත.

ප්‍රදාන, දේපළ, පිරියත හෝ උපකරණ සඳහා නම් එම ප්‍රදානය දේපළ, පිරියත හෝ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය පුරා විලම්භීත ආදායමක් සේ ක්‍රමානුකූල පදනමක් මත ගනු ලබයි.

වත්කම් ඒවායේ ඵලදායී ආයු කාලය හෝ පියවීමට ඇති කල්බදු කාලය යන දෙකෙන් අඩු එකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| ජල සැපයුම් | වසර 20 |
| මෝටර් රථ | වසර 05 |
| ගෘහ භාණ්ඩ හා මෙවලම් | වසර 10 |
| උපකරණ | වසර 08 |

## 3.4 ආදායම හා වියදම්

ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ අරමුණ සඳහා වියදම් ශ්‍රිතය මගින් සමාගමේ කාර්ය සාධනය පිළිබඳ මූලිකාංග වැඩියෙන් නියෝජනය කරනු ලබන බැවින් එම ක්‍රමය යොදා ගනු ලැබීය.

### 3.4.1 ආදායම

අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒම නිශ්චිත වන විට හා විශ්වසනීය ලෙස මැනිය හැකි විට වේලාව නොසලකා අයභාරය හඳුනා ගනී. ලැබු ප්‍රතිෂ්ඨාවේ හෝ ලැබිය යුතු දෑ වල සාධාරණ වටිනාකම මත බදු හැර ගිවිසුම්ගත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගෙන ආදායම මැනිය හැකිය.

(අ) භාණ්ඩ අලෙවියෙන් ලබන අයභාරය හඳුන්වන්නේ යම්කිසි භාණ්ඩයක හිමිකම සහ ළඟ තබා ගැනීමේ ප්‍රතිලාභය සහ අවදානම භාණ්ඩ විසර්ජනය තුළින් ගැණුම්කරු වෙත මාරු කිරීමෙනි. අයභාරය වාර්තා කරන්නේ ඉන්වොයිස් වටිනාකමින් තැරුව් ගාස්තු අලෙවි වියදම් හා අයභාරයට අයත් වෙනත් ගාස්තු අඩු කිරීමෙනි.

(ආ) දේපළ, පිරියත හා උපකරණ අපහරණයෙන් ලැබෙන ලාභ හා අලාභ ගණනය කරන්නේ ශුද්ධ විකුණුම් අගය හා දේපළ, පිරියත හා උපකරණ ධාරණ අගය සංසන්දනය කිරීමෙනි. වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගනී.

(ඉ) පොළී ආදායම LKAS 39 යටතේ සඵල පොළී ක්‍රමය භාවිතයෙන් හදුනාගනි.

(ඊ) වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනී.

### 3.4.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී දරන සියලු වියදම් හා සියලු දේපළ, පිරියත හා උපකරණ කාර්යක්ෂම මට්ටමේ පවත්වාගෙන යාම සඳහා දැරූ සියලු වියදම් වර්ෂයේ ලාභ/අලාභ ගණනය කිරීමේ දී අයභාරයට එරෙහිව පෙන්වයි.

## 3.5 ආදායම් බදු

අයබදු, වර්තන බදු, සහ විලම්භිත බදු යන දෙකොටසකින් සමන්විතයි. ස්කන්ධයට සම්බන්ධිත ස්කන්ධය මත හඳුනා ගන්නා අයිතමය හැර ආදායම් බදු වියදම් ලාභ අලාභ ප්‍රකාශයේ හඳුනා ගනියි.

(අ) වර්තන බදු

වර්තන බදු යනු වාර්තාකරණ දිනයේ දී බදු අනුපාතිකය යොදා ගෙන වසර සඳහා බදු ගෙවිය යුතු ආදායම මත ගෙවිය යුතු බද්ද හා පසු ගිය වර්ෂ වලට අදාලව ගෙවිය යුතු බද්දට කළ කිසියම් ගැලපුම් වේ. මූල්‍ය වාර්තාවල සඳහන් ආදායම් වියදම් මූලිකාංග පදනම් කර ගනිමින් හා දේශීය ආදායම් පනතේ හා එහි සංශෝධනයන්ට අනුව ආදායම් බදු සඳහා වෙන් කිරීම සිදුකරයි.

**(ආ) විලම්බිත බදු**

ශේෂ පත්‍ර ක්‍රමය භාවිතයෙන් මූල්‍ය වාර්තාකරන කාර්යයන් සඳහා වත්කම් සහ වගකීම් වල පවත්වාගෙන යන වටිනාකම සහ බදුකරණ කාර්යය සඳහා යොදා ගත් වටිනාකම් අතර තාවකාලික වෙනස සැලකිල්ලට ගෙන විලම්බිත බදු හඳුනාගනී. පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා නොගනී. ව්‍යාපාර ඒකාබද්ධ වීමක් නොවන හා ගිණුම්කරණ හෝ බදු අයකරන ලාභයට බලපෑමක් නොකරන ගනුදෙනුවක වත්කම් හා වගකීම් මූලික හඳුනා ගැනීම සහ පරිපාලිත වල කරනු ලබන ආයෝජන අනාගතයේ දී අවලංගු නොකරනතාක් දුරට ඒවායේ වෙනස්කම්. මෙයට අමතරව කීර්තිනාමය මූලික හඳුනා ගැනීම මත පැන නගින බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා නොගැනේ. පනවා ඇති නීති හෝ වාර්තාකරන දිනය මඟින් හරවත්ව පනවනු ලබන නීති පාදකව තාවකාලික වෙනස්කම් අවලංගු වන විට ඒවාට අදාළ වන බවට අපේක්ෂිත බදු අනුපාතික මත විලම්බිත බදු මනිනු ලැබේ. වර්තන බදු වගකීම් හිලව් කිරීමට නෛතික බලාත්මක අයිතියක් ඇත්තේ නම් හා එම බදු අයකළ හැකි සාමාන්‍ය ආදායම මත බදු අයකරනු ලබන අධිකාරිය විසින්ම පැනවූ ආදායම් බදු වලට ඒවා සම්බන්ධ වන්නේ නම් විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කරනු ලැබේ. තාවකාලික වෙනස උපයෝජනය කළ හැකි ඒවා සම්බන්ධව අනාගත බදු අයකළ හැකි ලාභ ලබාගත හැකි වන ප්‍රමාණයට පමණක් විලම්බිත බදු වත්කමක් හඳුනාගනී. සෑම වාර්තා කරන දිනයක දීම විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර අදාල බදු ප්‍රතිලාභ හඳුනාගත නොහැකි වන තාක් දුරට අඩු කරනු ලැබේ.

පරිපාලිත සමාගම් වල හා ආශ්‍රිත සමාගම්වල ලාභාංශ ආදායම මත රඳවාගත් බදු අදාළ ලාභාංශය ගෙවීමට ඇති වගකීම හඳුනාගන්නා වෙලාවේදීම ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

### 3.6 ඛණ්ඩ වාර්තාකරනය

සමාගමේ ව්‍යාපාර ඛණ්ඩ පිළිබඳ තොරතුරු ඛණ්ඩ වාර්තාකරණයෙන් පෙන්වයි. වගාවන් පිහිටා ඇති භූගෝලීය පිහිටීම පදනම් කර ව්‍යාපාර ඛණ්ඩනය කිරීම තීරණය කර ඇත. ඛණ්ඩන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 19 මඟින් දක්වා ඇත. වැවිලි භූගෝලීය පිහිටීම පහතින් දක්වා ඇත.

| **සමූහ 01 වතු** | **සමූහ 02 වතු** |
|---|---|
| හලාවත වතු කලාපය | බිංගිරිය වතු කලාපය |
| පලුගස්වැව වතු කලාපය | දිවුලපිටිය වතු කලාපය |
| තම්බපණ්නි වතු කලාපය | මාදම්පේ වතු කලාපය |

### 3.7 වාර්තා කරන දින වනවිට නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන ප්‍රමිතීන්

වාර්තා කරන දින වනවිට නිකුත් කරන ලද නමුත් බලාත්මක නොවන ප්‍රමිතීන් පහත දක්වා ඇත. ඒවා බලාත්මක වූ විට සමාගම ඒවා අනුගමනය කරනු ඇත. විස්තරාත්මක සමාලෝචනයක් කරන තුරු එහි මූල්‍ය බලපෑම, මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැක.

I) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 - මූල්‍ය සාධන පත්‍ර**

LKAS 39 දැනට පවතින මූල්‍ය සාධන පත්‍ර SLFRS 09 මඟින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

**හඳුනාගැනීම සහ ඇගයීම**

මූල්‍ය සාධන පත්‍ර වර්ගීකරණය හා මැනීම, මූල්‍ය වත්කම් හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ අකෘතිය, සහ නව පොදු ලෙජර් ගිණුම් කරන අවශ්‍යතා පිළිබඳ සංශෝධිත මග පෙන්වීමක් SLFRS 09 තුළ අන්තර්ගතය. එසේම LKAS 39 හි මූල්‍ය මෙවලම් හඳුනාගැනීම හා හඳුනා නොගැනීම පිළිබඳව තව දුරටත් මග පෙන්වීමක් සිදුකර ඇත. කලින් අනුගත කිරීම සඳහා අවසර සහිතව 2018 ජනවාරි 01 දිනට හෝ ඊට පසු ආරම්භ වන ගිණුම්කරන කාලච්ඡේදය සඳහා SLFRS 09 බලපැවැත්වේ.

II) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 15 - ගනුදෙනු හඳුනා ගැනීම සමග ගිවිසුම් මත අයභාරය**

කොපමණ මුදලක් කවදා අයභාරය ලෙස තීරණය කරනවා ද පිළිබඳ හඳුනාගැනීම සඳහා විස්තීරණ රාමුවක් ලෙස SLFRS 15 ස්ථාපිත කර ඇත. වර්තමානයේ අයභාරය හඳුනා ගැනීමට මග පෙන්වීමක් ලෙස ඇති LKAS 18 අයභාරය LKAS 11 කොන්ත්‍රාත් ගිවිසුම සහ IFRIC 13 ගනුදෙනුකරුවන් පක්ෂපාතීත්ව වැඩ පිළිවෙල, වෙනුවට මෙය හඳුන්වා දී ඇත. මෙම ප්‍රමිතිය 2018 ජනවාරි 01 දින හෝ පසුව ක්‍රියාත්මක වේ.

III) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 41 - කෘෂිකර්මය සහ LKAS 16 දේපළ පිරියත උපකරණ**

LKAS 41 ගිණුම්කරණ ප්‍රමිතය වෙනුවට LKAS 16 විෂය පථය යටතේ දේපළ පිරියත උපකරණ ලෙස වගාවන් පවත්වා ගෙන යාම පිළිබඳ මෙම සංශෝධන සහිත අර්ථ කථනය කර ඇත. මෙම සංශෝධන 2016 ජනවාරි 01 දින සිට හෝ එදිනට පසු භාවිත කිරීම අවශ්‍යතාවක්ව පවතී.

කෙසේ වුවද හඳුනාගැනීම සහ ඇගයීම පිළිබඳ සමාගමේ වර්තමාන ගිණුම්කරණ පිළිපැදීම සඳහා මෙම සංශෝධිත බලපෑමක් නැත. සමාගම විසින් වර්තමානයේදී ඵලදරන ගස් හඳුනාගැනීම හා ඇගයීම LKAS 16 අනුව කරගෙන යනු ලබයි.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 04. ජනවසම ඉඩම්වල කල්බදු අයිතිය

සියලු වතුවලට අදාළ වසර 53 කාලයක් සඳහා කල්බදු ගිවිසුම් අත්සන් කර ඇත. මෙම සියලු කල්බදු 1992 ජුනි 22 දින එනම්, සමාගම ආරම්භක දිනයේ සිට බලපැවැත්වෙන ලෙස ක්‍රියාත්මක වේ. මෙම සියලු වතු වලට අදාල කල්බදු අයිතිය 1992 ජුනි 22 දින සමාගම පිහිටුවන ලද අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හදිසි කරුණු කාර්ය බලකාය මේ සම්බන්ධයෙන් ලබා දෙන නියමයන්ට හා විධිවිධානයන්ට අනුව සමාගමේ පොත් වලට ගෙන ඇත. මේ සඳහා 1995 මාර්තු 08 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් ඉඩම් සමාගම පිහිටුවීමට පෙර විශේෂඥ ඩී. ආර් වික්‍රමසිංහ සැකසූ වටිනාකම මත ප්‍රති ඇගයීමට තීරණය කර ඇත.

1992 ජුනි මස 22 දින මෙම වත්කම් ශේෂ පත්‍රයට ගෙන වසර 53 ක් පුරා සමාන වටිනාකමින් ක්‍රමක්ෂය කරනු ලැබේ. වාර්තාකරන දිනට ඉතිරි කල්බදු කාලය වසර 28.5 ක් වේ.

| | දළ පවත්වාගෙන යෑමේ අගය | |
|---|---|---|
| | දිනට 2016.12.31<br>රු. | දිනට 2015.12.31<br>රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 142,502,287 | 142,502,287 |

| | ක්‍රමක්ෂය වීම | | |
|---|---|---|---|
| | දිනට 2016.12.31<br>රු. | වසර සඳහා<br>රු. | දිනට 2016.01.01<br>රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 66,013,582 | 2,688,722 | 63,324,860 |

| | පවත්වාගෙන යෑමේ අගය | |
|---|---|---|
| | දිනට 2016.12.31<br>රු. | දිනට 2015.12.31<br>රු. |
| හිස් ඉඩම්වල කල්බදු අයිතිය | 76,488,705 | 79,177,427 |

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 05. ජනවසම වතවල නිශ්චල කල්බදු වත්කම් ( භාවිතයට අයිතිය ඇති ඉඩම් සහ කල්බදු ජෛව වත්කම් හැර)

ශ්‍රී ලංකා වරලත් ගාණකාධිකාරි ආයතනයේ හදිසි කරුණු කාර්ය සාධාක බලකායේ (UITF) නියමයට අනුව මෙම වතුවල ඇති මූල්‍ය කල්බදු යටතේ ඇති සියලුම නිශ්චල දේපල අතීතයේ සිට බල පැවැත්වෙන පරිදි 1992 ජුනි 22 වන දින සිට ක්‍රියාත්මක වන සේ සමාගමේ පොත් වලට ගෙන ඇත. වත්කම් ජනවසම පොත් වල සටහන් වටිනාකම් මත සමාගම ආරම්භ කළ දිනට පොත් වලට ගැනීමට 1995 මාර්තු 08 පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තිරණය කර ඇත. මෙම වත්කම් 1992 ජුනි මස 22 දින ශේෂ පත්‍රයට ගෙන ඇති අතර නිශ්චල වත්කම් හා ක්‍රමක්ෂය 2016 දෙසැම්බර් 31 වන දිනට පහත දක්වා ඇත.

| තක්සේරුවේදි | සංවර්ධන ඉඩම් රු. | වෙනත් අයිති වත්කම් රු. | ගොඩනැගිලි රු. | යන්ත්‍ර රු. | ජල සැපයුම රු. | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනිත වටිනාකම | 841,193 | 1,002,944 | 25,356,498 | 530 | 4,026,236 | 31,227,401 | 31,227,401 |
| **ක්‍රමක්ෂය වීම** | | | | | | | |
| ජනවාරි 01 දා ට | 56,312 | 786,813 | 23,872,651 | 530 | 4,026,236 | 28,742,541 | 27,692,494 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 2,390 | 33,397 | 1,014,260 | - | - | 1,050,047 | 1,050,047 |
| දෙසැම්බර් 31 දා ට | 58,702 | 820,210 | 24,886,911 | 530 | 4,026,236 | 29,792,588 | 28,742,541 |
| **පවත්වාගෙන යන වටිනාකම** | **782,491** | **182,734** | **469,587** | - | - | **1,434,812** | **2,484,859** |

## 06. කල්බදු යටතේ ඇති ජෛව වත්කම් (ජනවසම)

| ප්‍රත්‍යාගණනය | 2016 රු. | 2015 රු. | 2014 රු. |
|---|---|---|---|
| මේරූ වගාවන් | 83,676,574 | 84,487,616 | 103,239,426 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (596,565) | (811,042) | (18,751,810) |
| | **83,080,009** | **83,676,574** | **84,487,616** |
| ජනවාරි 01 දා ට | 53,235,101 | 50,458,917 | 62,319,708 |
| වර්ෂයට ක්‍රමක්ෂය වීම | 3,437,873 | 3,437,873 | 3,437,873 |
| ඉවත් කිරීම් සඳහා කරන ලද ගැලපීම් | (486,707) | (661,689) | (15,298,664) |
| දෙසැම්බර් 31 දා ට | **56,186,266** | **53,235,101** | **50,458,917** |
| පවත්වාගෙන යන වටිනාකම | **26,893,743** | **30,441,473** | **34,028,699** |

වතු කල්බදු යටතේ සමාගමට භාර දෙන අවස්ථාවේ නොමේරූ වගාවන් සඳහා කළ ආයෝජනය (1992-06-22 දිනට ප්‍රත්‍යාගණිත) නොමේරූ වගා ලෙස දක්වා ඇති අතර, වාර්තා කරන දින වන විට එවා සියල්ල මේරූ වගාවන්ට මාරු කර ඇත. තවද, සමාගම මේරූ සහ නොමේරූ වගාවන් වෙනුවෙන් සිදු කළ ආයෝජනයන් කල්බදු දේපල සංවර්ධන සටහන් අංක 7.2 යටතේ දක්වා ඇත. මෙම මේරූ/නොමේරූ වගාවන් LKAS 41 කෘෂිකර්ම නියමයන් යටතේ ජෛව වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 07. ජෛව වත්කම් ( කල්බදු ජෛව වත්කම් හැර)

| | | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|
| කිරි පශු සම්පත් | **07.1** | 20,997,000 | 9,506,500.00 |
| කල්බදු දේපල සංවර්ධනය (මේරූ සහ නොමේරූ වගා) | **07.2** | 701,639,467 | 622,630,002 |
| | | **722,636,467** | **632,136,502** |

### 7.1 කිරි පශු සම්පත්

| | නොමේරූ දෙනුන් පැටව් / වැස්සියන්<br>රු. | මේරූ දෙනුන් (කිරි දෙන සහ නොදෙන දෙනුන්)<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|---|---|
| ජනවාරි 01 දා ට | 385,500 | 9,121,000 | 9,506,500 | 7,834,500 |
| වර්ෂය තුළ එකතු වූ | 98,000 | 342,000 | 440,000 | 144,000 |
| වර්ෂය සධාරණ අගයට ලද ලාභය/පාඩු | 455,000 | 10,954,000 | 11,409,000 | 2,304,500 |
| මාරු කිරීම ඇතුළට/පිටතට | 112,500 | 173,000 | 285,500 | (24,500) |
| මරණ/විකුණුම් | (55,000) | (589,000) | (644,000) | (752,000) |
| දෙසැම්බර් 31 දා ට | **996,000** | **20,001,000** | **20,997,000** | **9,506,500** |

පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩුකිරීමෙනි. පශු සම්පත් සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නිකුත් කළ චක්‍රලේඛයට අනුව තීරණය කරනු ලබයි.

### 7.2 කල්බදු දේපල සංවර්ධනය (මේරූ සහ නොමේරූ වගා)

| | | මේරූ වගා | | | | |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | නොමේරූ වගා<br>රු. | පොල්<br>රු. | කජු<br>රු. | වෙනත්<br>රු. | 2016<br>රු. | 2015<br>රු. |
| වර්ෂය ආරම්භයේදී | 402,984,051 | 177,053,145 | 87,056,399 | 1,909,484 | 669,003,078 | 581,605,750 |
| එකතු කිරීම් | 86,348,127 | - | - | - | 86,348,127 | 87,397,326 |
| නොමේරූ වලින් මාරු කිරීම | - | 13,360,151 | - | 3,883,375 | 17,243,526 | 942,388 |
| මේරූ වලට මාරු කිරීම | (17,243,526) | - | - | - | (17,243,526) | (942,388) |
| ලියා හැරි ශේෂය | - | - | - | - | - | - |
| වර්ෂය අවසානයේ දී | **472,088,652** | **190,413,296** | **87,056,399** | **5,792,859** | **755,351,206** | **669,003,077** |
| | | | | | | |
| **ක්ෂයවීම** | | | | | | |
| වර්ෂය ආරම්භයේදී | | 23,076,690 | 23,055,848 | 240,539 | 46,373,076 | 39,261,172 |
| වර්ෂය සඳහා | | 3,541,062 | 3,530,478 | 267,122 | 7,338,662 | 7,111,902 |
| වර්ෂය අවසානයේ දී | | **26,617,751** | **26,586,326** | **507,661** | **53,711,738** | **46,373,075** |
| | | | | | | |
| පවත්වාගෙන යන අගය | **472,088,652** | **163,795,545** | **60,470,072** | **5,285,198** | **701,639,467** | **622,630,002** |

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

**සටහන.**

මේවා සමාගම ස්ථාපිත කළ දින සිට මේරූ සහ නොමේරූ වගා සඳහා කළ ආයෝජනයි. කල්බදු යටතේ අත්පත් කර ගත් වත්කම් (වැවිලි වත්කම් ඇතුලත්ව) සටහන් අංක 4,5 සහ 6 යටතේ විදහා පෙන්වයි. තවදුරටත් කල්බදු පදනම යටතේ පවරාගන්නා ලද වත්කම් වල නොමේරූ වගාවන් වෙනුවෙන් කළ ආයෝජනයන් මෙම සටහන තුළ ඇතුලත් වේ. එවැනි වගා මේරූ තත්ත්වයට පැමිණි විට, මේරූ තත්ත්වයට ගෙන ඒමට යෙදූ අමතර ආයෝජනය මෙම සටහන අනුව නොමේරූ සිට මේරූ කොටසට මාරු කර ඇත. ඒ අකාරයෙන්ම, ජනවසම කල්බදු පෙර කරන ලද ආයෝජනය වෙනුවෙන්ද නොමේරූ සිට මේරූ දක්වා මාරු වීම් වලට අදාල වෙනස්වීම සටහන් අංක 06 මගින් පෙන්වයි.

ජෛව වත්කම් ගිණුම්කරණ ප්‍රමිත අංක 41 හි දක්වා තිබූ පරිදි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කර අගය හඳුනා ගැනීමේ අවශ්‍යතාවය 2012 මාර්තු 02 දින වරලත් ගණකාධිකාරි ආයතනයෙන් නිකුත් කළ නිර්දේශයන් හා නියමයන් මගින් අවලංගු වේ. ඒ අනුව සමාගම ජෛව වත්කම් අගය කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 -දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතයට අනුව පිරිවැය මත සිදු කරනු ලබයි.

වගා වියදම් මූල්‍යනය කිරීම සඳහා විශේෂිත ණය පහසුකම් ලබාගෙන නොමැත. එම නිසා ණය පිරිවැය වර්ෂය තුළ නොමේරූ වගාවන් යටතේ ප්‍රග්ධනිත කර නොමැත. (2015/16 නොමැත)

### 7.3 පරිභෝජ්‍ය ජෛව වත්කම් - දැව වගාව

| | නොමේරූ | 2016 රු. මේරූ | එකතුව | නොමේරූ. | 2015 රු. මේරූ | එකතුව |
|---|---|---|---|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 2,765,443 | 34,331,027 | 37,096,469 | 2,750,415 | 32,151,932 | 34,902,347 |
| සංවර්ධනය/ආයේජනය මත සිදුවන වැඩිවීම | 19,108 | - | 19,108 | 15,027 | - | 15,027 |
| වටිනාකම අඩු වැඩිවීම තුළ හඳුනාගත් ලාභ හෝ අලාභ | - | 5,154,465 | 5,154,465 | - | 24,534,520 | 24,534,520 |
| දැව ගස් හෙලීම නිසාවූ වටිනාකමේ අඩුවීම | - | (24,542) | (24,542) | - | (22,355,425) | (22,355,425) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **2,784,551** | **39,460,950** | **42,245,501** | **2,765,443** | **34,331,027** | **37,096,469** |

ජෛව වත්කම් පරිවර්තනය මූල්‍යමය වටිනාකමක් දක්වා වර්ධනය වී නොමැති විට නොමේරූ දැව ගස් සඳහා වන පිරිවැය දළ සාධාරණ අගයක් වශයෙන් සැලකේ.

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමවේදය යොදා ගනිමින් ආරියතිලක ඇසෝසියේට් ආයතනය මගින් අදාල තක්සේරුකරනය සිදු කෙරිණි. දැව ගස් වල සධාරණ අගය නිශ්චය කිරීමේදී සියලු වතු ආවරණය කරමින් භෞතික නිශ්චය කිරීමක් සිදු කරන ලදී.

**තක්සේරුකරණයේදී යොදා ගැනුණ මූලික උපකල්පන**

1. රාජ්‍ය දැව සංස්ථාවේ දැව මිල ලේඛණය පදම් කරගෙන ඇත.
2. වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ විකුණුම් මිල ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත.
3. වට්ටම් අනුපාතිකය 14%
4. පරිනතවීමේ කාලසීමාව අවු 30 ක් ලෙස තක්සේරු කර ඇත.

ශුද්ධ වර්තමාන වටිනාකම මත පදනම්ව බාහිර තක්සේරුකරණය දැව ගස් වල දිගු කාලීන හානි වීම සැලකිල්ලට ගෙන ඇත. විචල්‍යන්ගේ වෙනස් වීම හේතුවෙන් සාධාරණ අගය මත ජෛව වත්කම් තක්සේරු කිරීමේදී පවතින ඒ හා බැඳුණු අස්ථාවරත්වය හේතුවෙන් ඒවායේ පවතින වටිනාකම තත්‍ය වටිනාකමින් වෙනස්විය හැක.

සමාගම සිය දැව ගස් සම්බන්ධයෙන් පහත දැක්වෙන අවදානම්වලට නිරාවරණය වේ.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

**නියාමන සහ පාරිසරික අවධානම**

සාමගම ශ්‍රී ලංකාවේ නීති රීති හා රෙගුලාසිවලට යටත්වේ. දේශීය පාරිසරික සහ වෙනත් නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීම සඳහා සමාගම පාරිසරික ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් පිහිටුවා ඇත. පාරිසරික අවදානම් හඳුනාගැනීම සඳහා කළමනාකාරිත්වය මගින් නිරන්තර විමර්ෂණයන් සිදුකෙරේ.

**සැපයුම් සහ ඉල්ලුම් අවදානම**

දැව වල අලෙවි පරිමාවන් සහ මිල උච්චාවචනයන් සම්බන්ධ අවදානම් වලට සමාගම නිරාවරණය වේ. හැකි අවස්ථාවන්හිදී සමාගම මගින් සිය නිෂ්පාදන පරිමාව වෙළඳපොල ඉල්ලුම සහ සැපයුමට අනුව සකසමින් මෙම අවදානම කළමනාකරණය කරයි. සමාගමෙහි මිල ව්‍යුහය වෙළඳපොළ මිල හා සමගාමී වන බවට සහ අපේක්ෂිත නිෂ්පාදන පරිමාව වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි පවතින බව තහවුරු කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් විශ්ලේෂණාත්මක අධ්‍යනයෙන් සිදුකරනු ලබයි.

**දේශගුණ සහ වෙනත් අවදානම්**

සමාගමෙහි දැව ගස් කාලගුණ වෙනස්වීම්, රෝග සහ වෙනත් ස්වාභාවික ආපදාවන්ගේ අවදානමට ලක් වේ.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 8. සින්නක්කර දේපළ, පිරියත හා උපකරණ

| | ගොඩනැගිලි රු. | පිරියත සහ යන්ත්‍ර රු. | මෝටර් රථ රු. | උපකරණ රු. | ගෘහ භාණ්ඩ සහ මෙවලම් රු. | වැටවල් රු. | ජල සැපයුම රු. | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය/ තක්සේරුව** | | | | | | | | | |
| ජනවාරි 01 දා ට | 40,274,718 | 7,839,761 | 145,977,528 | 39,398,776 | 9,302,457 | 4,898,427 | 8,461,353 | 256,153,021 | 239,948,180 |
| එකතු කිරීම් | 3,591,131 | - | 5,212,900 | 2,401,509 | 426,032 | 4,441,187 | 949,577 | 17,022,335 | 18,452,969 |
| මාරුකිරීම්/ඉවත් කිරීම් | - | - | - | 533,188 | - | - | - | 533,188 | 2,248,128 |
| දෙසැම්බර් 31 දා ට | 43,865,849 | 7,839,761 | 151,190,428 | 42,333,473 | 9,728,489 | 9,339,614 | 9,410,930 | **273,708,544** | **256,153,021** |
| **ක්ෂය වීම** | | | | | | | | | |
| ජනවාරි 01 දා ට | 6,400,601 | 1,578,568 | 105,283,209 | 27,440,865 | 6,057,190 | 2,486,424 | 3,278,859 | 152,525,715 | 128,923,224 |
| වසරට අදාල වියදම් | 1,009,293 | 489,667 | 18,252,506 | 2,852,683 | 618,562 | 1,056,020 | 380,382 | 24,659,113 | 25,850,595 |
| මාරුකිරීම්/ඉවත් කිරීම් | - | - | - | - | - | - | - | - | 2,248,103 |
| දෙසැම්බර් 31 දා ට | 7,409,894 | 2,068,235 | 123,535,715 | 30,293,549 | 6,675,751 | 3,542,444 | 3,659,241 | **177,184,829** | **152,525,715** |
| **ශුද්ධ අගය** | | | | | | | | **96,523,716** | **103,627,305** |
| **ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ** | | | | | | | | | |
| ජනවාරි 01 දා ට | | | | | | | | 1,330,571 | 6,953,113 |
| වසර තුළ එකතු කිරීම් | | | | | | | | 156,374 | 794,494 |
| වසර තුළ ප්‍රාග්ධනිත කිරීම්/මාරු කිරීම | | | | | | | | (1,366,942) | (6,417,036) |
| දෙසැම්බර් 31 දා ට | | | | | | | | **120,003** | **1,330,571** |
| **පවත්වාගෙන යන වටිනාකම** | | | | | | | | **96,643,719** | **104,957,876** |

**සටහන්**

ඉහත දක්වා ඇති වත්කම් යනු 1992 ජූනි මස 22 වන දින සමාගම අරඹන විට ගැසට් නිවේදනය මගින් සමාගමට පවරන ලද චංචල දේපළ හා සමාගම ආරම්භයේ සිට ස්පෘශ්‍ය වත්කම් වලට සමාගම කරන ලද සියලු ආයෝජන වේ. වතු කල්බදු ක්‍රමය යටතේ පවරාගත් වත්කම් සටහන් අංක 4, 5, 6 හි දැක්වේ.

තවද මූල්‍ය කල්බදු යටතේ ජනවසම නිශ්චල වත්කම් සහ ස්පෘශ්‍ය වත්කම් මේරූ සහ නොමේරූ වගා හැර 1992 ජූනි මස 22 දිනට ජනවසම ශුද්ධ වටිනාකම මත පදනම්ව පොත් වලට ගෙන ඇත. මෙම වටිනාකම තනි තනි වත්කම් වලින් ලබා ගත නොහැක.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 9. තොග

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| යෙදවුම් ද්‍රව්‍ය | 18,977,528 | 2,816,452 |
| වගා කරන භෝග - තවාන් | 2,389,310 | 4,038,701 |
| නෙලාගත් අස්වැන්න | 70,040,667 | 29,274,915 |
| පරිභෝජන භාණ්ඩ හා අනෙකුත් අමතර කොටස් | 9,366,747 | 7,221,568 |
| පශු සම්පත් | 4,240,670 | 4,277,098 |
| | 105,014,922 | 47,628,734 |
| යල් පැන ගිය තොග වල හානිකරණ සඳහා වෙන් කිරීම් | (15,500) | (15,500) |
| | **104,999,422** | **47,613,234** |

## 10. වෙළඳ හා වෙනත් ලැබීමට ඇති දෑ

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| වෙළඳ ණයගැතියෝ | 35,913,954 | 25,815,410 |
| සේවක ණයගැතියෝ | 1,907,618 | 2,272,919 |
| වෙනත් ණයගැතියෝ | 11,179,478 | 9,394,753 |
| වේ කොයාර් ව්‍යාපෘතිය | 13,325,233 | 13,325,233 |
| | 62,326,284 | 50,808,315 |
| වේ කොයාර් ව්‍යාපෘතියේ හානිකරණ සඳහා වෙන්කිරීම් | (13,325,233) | (13,325,233) |
| හානිකරණය සඳහා වෙන් කිරීම් - බොල් ණය | (565,378) | (986,636) |
| | **48,435,673** | **36,496,447** |

## 11. රාජ්‍ය ආයතන වෙත ලබා දී ඇති මූල්‍ය පහසුකම්

| | ලබා දී ඇති ණය මුදල රු. | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| **ලැබිය යුතු ණය** | | | |
| සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම | 20,000,000 | 23,519,452 | 23,519,452 |
| සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව | 10,000,000 | 10,000,000 | 10,000,000 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 20,000,000 | 23,610,959 | 23,610,959 |
| රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 15,000,000 | 15,000,000 | 15,000,000 |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 40,000,000 | 47,627,397 | 47,627,397 |
| | 105,000,000 | 119,757,808 | 119,757,808 |
| **අඩුකලා** | | | |
| හානිකරණ අලාභය | (105,000,000) | (119,757,808) | (119,757,808) |
| | - | - | - |

2010 වර්ෂයේදී සමාගම විසින් රාජ්‍ය ආයතන වෙත රුපියල් මිලියන 105 ක මුදලක් කෙටි කාලීන ණය ලෙස ලබා දී ඇත. කෙසේ වෙතත් 2014/12/31 දින වන විටත් අදාල ණය මුදල සහ ඊට අදාල පොලියද සමඟ රුපියල් 119,757,808 ක මුදලක් අදාල ආයතන වලින් අය කර ගත නොහැකිව පැවතිනි. අදාල ණය මුදල සහ පොලිය වෙනුවෙන් හානිකරණය සඳහා අඩමාන ණය ප්‍රතිපාදන 2014 වර්ෂයේ ගිණුම් වල වෙන් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

2010 වර්ෂයේ සිට 2012 වර්ෂය අතර කාලයට අදාල පොලී අදායම ඉහත රාජ්‍ය ආයතන වලින් අය කර ගැනීමට නොහැකි වීම පිළිබඳව සලකා බලා, 2013 වර්ෂයේ සිට අයකරගැනීමට නොහැකි පොලී අදායම ගිණුම්ගත නොකිරීමට හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. කෙසේ වෙතත් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පොලී ආදායම ගිණුම් ගත කලේ නම් මුලු ලැබිය යුතු ණය ශේෂය රු. 145,357,808 ක් වනු ඇත.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 11.1 වෙනත් මූල්‍ය වත්කම්

| | 2016.12.31 රු. | 2015.12.31 රු. |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| සේවකයින් සඳහා දුන් ණය | 7,084,015 | 4,844,575 |
| පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ | 514,643 | 355,582 |
| | **7,598,658** | **5,200,157** |
| **ජංගම වත්කම්** | | |
| සේවකයින් සඳහා දුන් ණය | 3,465,834 | 3,034,142 |
| පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ | (52,556) | 22,128 |
| | **3,413,278** | **3,056,270** |
| **එකතුව** | **11,011,936** | **8,256,427** |

## 11.1(අ) සේවකයින් සඳහා දුන් ණය

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භක දිනට ශේෂය | 8,256,427 | 7,011,461 |
| වර්ෂය තුළ ලබාදුන් ණය | 6,528,200 | 4,558,250 |
| වර්ෂය තුළ අයකරගත් ණය | (3,772,691) | (3,313,284) |
| | **11,011,936** | **8,256,427** |
| පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ වලට මාරු කිරීම | (462,087) | (377,711) |
| වර්ෂය අවසන් දිනට ශේෂය | **10,549,849** | **7,878,716** |
| | | |
| ජංගම නොවන වත්කම් | 7,084,015 | 4,844,575 |
| ජංගම වත්කම් | 3,465,834 | 3,034,142 |
| | **10,549,849** | **7,878,716** |
| **පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ** | | |
| ජංගම නොවන වත්කම් | 514,643 | 355,582 |
| ජංගම වත්කම් | (52,556) | 22,128 |
| | **462,087** | **377,711** |

5% ක සහනදායි වාර්ෂික පොලී පදනමක් මත සමාගම සේවකයින්ට ණය ලබා දෙනු ලබයි. පළමු ගිණුම් ගත කිරීමේදී එම ණය සාධාරණ අගයකට ගිණුම් ගත කරනු ලැබේ. සේවකයින්ට දෙනු ලබන ණය වලට අදාල සාධාරණ අගය ගණනය කරනු ලබන්නේ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය වර්තමාන වෙළඳපොල පොලී අනුපාතයෙන් වට්ටම් කිරීමෙනි. සේවකයින්ට ලබා දෙන ණය මුදලට අදාලව පෙර ගෙවූ සේවක ප්‍රතිලාභ ලෙස හඳුනාගනු ලබන්නේ ණය වල පිරිවැය සහ සාධාරණ අගය අතර වෙනසයි.

සේවකයින් වෙත ලබා දෙන ණය සුරක්ෂිත වන අතර, පහත දැක්වෙන අනුපාත අනුව පොලී අය කෙරේ.

| | 2016 | 2015 |
|---|---|---|
| හලාවත වැවිලි සමාගම අපදා ණය පොලී අනුපාතය | 5% | 5% |
| වෙළඳපොල පොලී අනුපාතය | 11% | 11% |

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 12. කෙටි කාලීන ආයෝජන

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | 112,868,261 | 58,646,142 |
| භාණ්ඩාගාර බිල්පත් | 28,000,000 | 94,000,000 |
| | **140,868,261** | **152,646,142** |

කොටි කාලීන තැන්පතු ක්ෂණික මූල්‍ය අවශ්‍යතා පදනම් කර ගනිමින් මාස 6 ත් 12 ත් අතර කාලසීමා වලට තැන්පත් කර ඇත, කෙටි කාලින තැන්පතු වලට අදාල පොලි අනුපාතයට අනුව පොලී ආදායම් උපයා ගැනේ.

ලංකා බැංකුවේ ඇති ඉහත සඳහන් ස්ථාවර තැන්පත් මගින් රු. 72,493,267/- ක පාරිතෝෂිත දීමනා බැරකමට අදාල සැලසුම් වත්කම් දක්වයි.

## 13. ප්‍රකාශිත ප්‍රාග්ධනය

| | 2016 | 2015 |
|---|---|---|
| **නිකුත් කළ සම්පූර්ණයෙන් ගෙවා නිම කළ කොටස් ප්‍රමාණය** | | |
| භාණ්ඩාගාරයට විශේෂ හිමිකම් ඇති | | |
| එක් ස්වර්ණමය කොටසක් ඇතුලුව නිකුත් කළ | | |
| සාමාන්‍ය කොටස් ප්‍රමාණය | 20,000,001 | 20,000,001 |
| **නිකුත් කළ සම්පූර්ණයෙන් ගෙවා නිම කළ කොටස් වටිනාකම** | | |
| භාණ්ඩාගාරයට විශේෂ හිමිකම් ඇති | | |
| එක් ස්වර්ණමය කොටසක් ඇතුලුව නිකුත් කළ | | |
| සාමාන්‍ය කොටස් වටිනාකම | **200,000,010** | **200,000,010** |

ප්‍රකාශිත ප්‍රාග්ධනය තුළ විශේෂ හිමිකම් ඇති එක් ස්වර්ණමය කොටසක් ඇතුළුව සාමාන්‍ය කොටස් 20,000,001 සමන්විත වේ. 2007 අංක 07 දරණ සමාගම් පනත 2007 මැයි මස 03 වන දින සිට බලාත්මක විමත් සමගම අනුදත් කොටස් ප්‍රාග්ධනය හා සම මිල තවදුරටත් අදාළ නොවේ.

## 14. විලම්බිත බදු

| | 2016 | 2015 |
|---|---|---|
| වසර ආරම්භයේ | 49,092,652 | 41,266,324 |
| වසරේ වෙන් කිරීම් | 12,757,599 | 7,826,328 |
| වසරාවසානයේ | **61,850,251** | **49,092,652** |

| | තාවකාලික වෙනස්වීම් රු. | බදු බලපෑම් රු. |
|---|---|---|
| තාවකාලික වෙනස් වවීම | | |
| - දේපළ පිරියත උපකරණ | (44,006,319) | (4,840,695) |
| - මේරූ හා නොමේරූ වගා | (701,639,467) | (70,163,947) |
| - පාරිභොජ්‍ය ජෛව වත්කම් | (42,245,501) | (4,647,005) |
| - යල් පැන ගිය භාණ්ඩ හානිකරණ වෙන් කිරීම | 15,500 | 1,705 |
| - හානිකරණයන් සඳහා අඩමාන ණය වෙන් කිරීම | 28,648,419 | 3,151,326 |
| - පාරිතෝෂික වෙන් කිරීම | 72,493,267 | 7,974,259 |
| ඉදිරියට ගෙන යන බදු අලාභය | 60,673,687 | 6,674,106 |
| ඉදිරියට ගෙන යන බදු බැර | - | - |
| **විලම්බිත බදු වත්කම් / (වගකීම්)** | **(626,060,415)** | **(61,851,251)** |

මේරූ නොමේරූ වගා හැර කෙටි කාලීන වෙනස්වීම් වෙනුවෙන් විලම්බිත බදු වගකීම ගණනය කිරීම සඳහා 2016 දෙසැම්බර් 31 දිනට භාවිතා කරන ලද සඵල බදු අනුපාතය 11% ලෙස දැක්විය හැක.

2016 දෙසැම්බර් 31 දිනට මේරූ නොමේරූ වගාවේ විලම්බිත බදු වගකීම ගණනය කිරීම සඳහා යොදා ගන්නා ලද සඵල බදු අනුපාතය 10% වේ.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 15. විලම්බිත ප්‍රදාන සහ සහනාධාර

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| වසර ආරම්භයේ | 7,190,426 | 7,619,584 |
| අඩුකළා : වසරේ ක්‍රමක්ෂය | (398,962) | (429,158) |
| වසරාවසානයේ | **6,791,464** | **7,190,426** |

"වතු නිවාස" වතු නිවාස වල වහල සෙවිලි කිරීම වැසිකිළි, ජල සැපයුම හා සනීපාරක්ෂක වැනි සේවක පහසුකම් වර්ධනය කරලීම සඳහා වැවිලි නිවාස හා සමාජ සුභසාධක භාරය වෙතින් සමාගමට අරමුදල් ලැබී ඇත.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ වියදම් කළ මුදල් ප්‍රාග්ධනිත කර ඇත. එම මුදල ප්‍රදාන හා සහනාධාර යටතේ පෙන්වා ඇති අතර වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

## 16. විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| වසර ආරම්භයේ | 67,834,120 | 65,120,485 |
| පොලී වියදම් | 6,783,412 | 6,512,049 |
| වර්තන සේවා පිරිවැය | 6,200,046 | 5,920,040 |
| වර්ෂය තුල පාරිතෝෂිත ගෙවීම් | (7,232,768) | (6,956,474) |
| ආයු ගණන ලාභ/(අලාභ) | (1,091,543) | (2,761,980) |
| වසරාවසානයේ | **72,493,267** | **67,834,120** |

සේවකයෙකු තම සේවා කාලය තුළ උපයා ඇති විශ්‍රාම ප්‍රතිලාභ නිවැරදිව ඇස්තමේන්තු කිරීමට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 යේ නියමයන්ට අනුව ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය භාවිතා කොට ආයු ගණක ශිල්ප ක්‍රමය භාවිතා කරමින් විශ්‍රාම පාරිතෝෂිත ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකම සහ වාර්තමාන සේවා පිරිවැය ගණනය කර ඇත. මෙහිදි යම් ස්ථිතියක් සඳහා කොතරම් ප්‍රතිලාභ ප්‍රමාණයක් අතීත සේවා කාලය හා වර්තමාන සේවා කාලය වෙනුවෙන් ආරෝපනය කරනවාද යන්න පිළිබඳ ඇස්තමේන්තු කිරීම සඳහා ජන විකාශන විචල්‍ය හා මූල්‍ය විචල්‍ය උපකල්පනයන් සිදු කරයි. ඉහත අගයන් ලබා ගැනිමේදී පහත උපකල්පනයන් සිදු කර ඇත.

ආයු ගණක තක්සේරුකරු විසින් සපයන ලද ආයුගණක තක්සේරු වාර්තාව අනුව පාරිතෝෂික විශ්‍රාම ප්‍රතිලාභ වල 2016 දෙසැම්බර් 31 වැනි දිනට පොරොන්දු වි ඇති විශ්‍රාම ප්‍රතිලාභ වල ආයුගණක වර්තමාන වටිනාකම රුපියල් 72,493,267/- ය. සමාගම පාරිතෝෂික ගණනය කිරීම සඳහා දින 14 ක වැටුප් සහ අර්ධ මාසික වැටුප අනුව ඇති පාරිතෝෂික වගකීම රුපියල් 85,190,059/- ක් වේ. ඒ අනුව රුපියල් 12,696,792/- ක අසම්භාව්‍ය වගකීමක් පවති. අඛණ්ඩ පැවැත්ම අවසාන වුවහොත් එය විද්‍යමාන වේ.

ඇක්චුරියල් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම භාවිතා කළ ප්‍රධාන කල්පිතයන් පහත දැක්වේ.

(i) පොලි අනුපාතය 10.5% වසරකට

(ii) වැටුප් වැඩිවීමේ අනුපාතය
- මාසික වේතන ලබන 8.0% වසරකට
- දෛනික වේතන ලබන 9.0% වසරකට

(iii) විශ්‍රාම යන වයස
- මාසික වේතන ලබන වසර 60
- දෛනික වේතන ලබන වසර 60

(iv) දෛනික වේතන ප්‍රමාණය රු. 555/-

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 17. ජනවසම / ශ්‍රීලරාවැස සඳහා කල්බදු බැඳීම

| | වසරක් තුළ ගෙවිය යුතු රු. | වසරකට පසු ගෙවිය යුතු | | අනු එකතුව රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| | | වසර 02 සිට වසර 05 දක්වා ගෙවිය යුතු රු. | වසර 05 න් පසු ගෙවිය යුතු රු. | | |
| දළ මූල්‍ය කල්බදු වගකීම් | 6,508,000 | 26,032,000 | 152,554,651 | 178,586,651 | 185,094,651 |
| අඩුකලා : අනාගත මූල්‍ය ගාස්තු | (4,374,548) | (16,609,987) | (54,753,525) | (71,363,512) | (75,738,060) |
| ශුද්ධ කල්බදු වගකීම් - 2016 | **2,133,452** | **9,422,013** | **97,801,126** | **107,223,139** | **109,356,591** |
| ශුද්ධ මූල්‍ය කල්බදු වගකීම් - 2015 | **2,051,396** | **9,059,628** | **100,296,963** | **109,356,591** | **111,407,987** |

වතු වෙනුවෙන් කල්බදු කුලිය 1996 ජුනි මස 22 වන දින සිට වසරකට එක් එක් වත්තකට අදාල පෙර කල් බදු කුලිය වූ රුපියල් 500/- කට වැඩි සාපේක්ෂිත මුදලකට සංශෝධනය කරන ලදී. සංශෝධිත පදනම යටතේ වසරක් සඳහා ගෙවිය යුතු කුලිය වනුයේ රුපියල් මිලියන 6.508 කි. මෙම ප්‍රමාණය දළ දේශිය නිෂ්පාදන අවධමනකය මගින් වාර්ෂිකව වැඩි කරනු ලබන අතර අසම්භාව්‍ය කුලී ආකාරයෙන් පෙන්වයි.

අසම්භාව්‍ය බදු කුලී ලෙස වර්ෂය තුළ රුපියල් 27,616,892/- මුදලක් ආදයම් ප්‍රකාශයේ වියදමක් ලෙස පෙන්වා ඇත. එය දළ දේශිය නිෂ්පාදන අවධමනකය වන 2.1% මත පදනම්ව ඇත. (2015 - 26,499,070/- 5.1%)

කල් බදු මත භූමිය භාවිතයට ඇති අයිතිය පිළිබඳ නිර්දේශිත භාවිතයන් පිළිබඳ ප්‍රකාශනය (SORP) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතන සභාව විසින් 2012 දෙසැම්බර් 19 වන දින අනුමත කර ඇත. පසුව වෙනස්වීම් සහිතව එය විකල්ප පිළිපැදිම් ප්‍රකාශය ලෙස සංශෝධනය කර සභාව විසින් අනුමත කර 2013 අගෝස්තු 21 වැනි දින නිකුත් කර ඇත. අනුගම්‍ය අවශ්‍යතාවයක් නොවන නිසා බදු දේපල භාවිතයට ඇති අයිතිය සමාගම විසින් යලි තක්සේරු කර නොමැත. කෙසේ වෙතත් විකල්ප පිළිපැදුම් ප්‍රකාශය අනුව (SOAT) කල්පිතයන් ලෙස බදු කුලිය දළ දේශිය අවධමනකය අනුව 4% වැඩි වන්නේ නම් හා වට්ටම් අනුපාතය 13% යන කල්පිතයන් වන බදු වගකිම යලි තක්සේරු කලහොත් එය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| දළ වගකීම | = | 1,804,770,000 |
| මූල්‍ය ගාස්තු | = | (1,198,002,007) |
| ශුද්ධ වගකීම | = | **606,767,994** |

## 18. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| වෙළඳ ණයහිමියෝ (ආපසු ගෙවීම්, CDA අලෙවි තොග ගාස්තු) | 1,893,321 | 1,967,193 |
| වෙනත් (පොහොර, කොන්ත්‍රාත්කරුවන්) | 78,237,600 | 32,019,132 |
| නිවාඩු පඩි | 3,462,585 | 3,068,655 |
| උපචිත වියදම් | 10,679,021 | 5,168,818 |
| විගණන ගාස්තු | 869,200 | 926,000 |
| 10% සේවක ලාභ කොටස (RPC ගිවිසුම) | 10,690,637 | 11,730,853 |
| මහා භාණ්ඩාගරයට ගෙවිය යුතු ලාභාංශ | 30,000,000 | - |
| | **135,832,364** | **54,880,651** |

ගිණුම්කරණ සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 19. අයභාරය

### 19.1 සාරාංශය

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| පොල් | 345,721,174 | 367,424,020 |
| කොප්පරා | 37,368,740 | 31,941,978 |
| | **383,089,914** | **399,365,998** |

### 19.2 ආංශික තොරතුරු

| | 01 කාණ්ඩය | | 02 කාණ්ඩය | | වෙන් නොකළ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 රු. | 2015 රු. | 2016 රු. | 2015 රු. | 2016 රු. | 2015 රු. | 2016 රු. | 2015 රු. |
| **භූගෝලීය ආංශික ප්‍රතිඵල** | | | | | | | | |
| අයභාරය | 216,735,614 | 226,281,163 | 166,354,300 | 173,084,835 | - | - | 383,089,914 | 399,365,998 |
| අයභාර වියදම් | (116,156,569) | (131,018,445) | (104,483,034) | (105,242,774) | - | - | (220,639,603) | (236,261,219) |
| ක්ෂයවීම් | (9,081,159) | (7,747,901) | (4,662,179) | (6,608,574) | - | - | (13,743,338) | (14,356,475) |
| ආංශික ප්‍රතිඵල | **91,497,886** | **87,514,817** | **57,209,087** | **61,233,487** | - | - | **148,706,973** | **148,748,305** |
| වෙනත් ආදයම් සහ ලැබීම් | | | | | | | 65,941,736 | 80,380,044 |
| වෙන් නොකල වියදම් | | | | | | | (111,237,865) | (119,953,921) |
| මූල්‍ය වත්කම් වල හානිකරන අලාභය | | | | | | | - | - |
| මූල්‍ය පිරිවැය | | | | | | | (32,787,852) | (31,616,099) |
| මූල්‍ය ආදායම් | | | | | | | 14,193,632 | 10,734,205 |
| බදු පෙර ලාභය | | | | | | | 84,816,623 | 88,292,534 |
| ආදායම් බදු වියදම | | | | | | | (15,144,615) | (9,610,612) |
| **වර්ෂයට ශුද්ධ ලාභය** | | | | | | | 69,672,008 | 78,681,922 |
| **දෙසැම්බර් 31 දිනට** | | | | | | | | |
| **ආංශික වත්කම්** | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | 476,338,158 | 428,999,405 | 468,594,458 | 425,080,936 | 21,410,332 | 32,214,267 | 966,342,948 | 886,294,608 |
| ජංගම වත්කම් | 96,333,431 | 54,969,186 | 53,839,158 | 25,875,597 | 162,160,328 | 176,037,197 | 312,332,917 | 256,881,980 |
| **මුළු වත්කම්** | **572,671,589** | **483,968,591** | **522,433,616** | **450,956,533** | **183,570,660** | **208,251,464** | **1,278,675,864** | **1,143,176,587** |
| **ආංශික වගකීම්** | | | | | | | | |
| ජංගම නොවන වගකීම් | 35,472,805 | 33,173,983 | 35,332,547 | 31,144,786 | 177,552,769 | 169,155,020 | 248,358,121 | 233,473,789 |
| ජංගම වගකීම් | 28,154,255 | 16,434,541 | 26,982,613 | 16,818,299 | 79,454,085 | 21,486,719 | 134,590,953 | 54,739,559 |
| **මුළු වගකීම්** | **63,627,060** | **49,608,524** | **62,315,160** | **47,963,085** | **257,006,854** | **190,641,739** | **382,949,074** | **288,213,348** |

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 20. වෙනත් ආදායම් සහ ලැබීම්

| | 2016 රු. | 2015 රු. |
|---|---|---|
| ප්‍රදාන ක්‍රමක්ෂය | 398,962 | 429,158 |
| පශු සම්පත් ව්‍යාපෘතියේ ලාභ | 9,434,603 | 1,512,581 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් - වටිනාකම අඩු වැඩිවීම තුළ හඳුනාගත් ලාභ හෝ අලාභ | 5,154,465 | 24,534,520 |
| වාහන සහ අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද ලාභය | | 294,015 |
| පොල් ගස් | 17,356,052 | 19,532,788 |
| පොල් ලෙලි සහ කටු | 7,617,682 | 7,030,610 |
| දඩ | 5,346,819 | 3,332,878 |
| පැල සහ තවාන් | 178,959 | 3,004,008 |
| කුඹුරු | 2,246,473 | 2,406,640 |
| දර | 2,228,857 | 1,475,821 |
| කජු | (924,385) | 135,336 |
| වැව් වල මඩ ඉවත් කිරීමෙන් | 11,160,170 | 12,644,387 |
| වෙනත් | 5,743,078 | 4,047,302 |
| | **65,941,736** | **80,380,044** |

### 20.1 කජු

| | 2016 | 2015 |
|---|---|---|
| කජු අලෙවි ආදායම | 14,046,760 | 20,166,427 |
| විකුණුම් පිරිවැය | (14,971,144) | (20,031,091) |
| ලාභ/අලාභ | **(924,385)** | **135,336** |

## 21. මූල්‍ය ආදායම

| | 2016 | 2015 |
|---|---|---|
| ස්ථාවර තැන්පතු තුළින් ජනනය වූ පොලිය | 6,932,319 | 6,499,873 |
| භාණ්ඩාගාර බිල්පත් වලින් ජනනවූ පොලිය | 5,855,542 | 3,199,614 |
| ඉතිරිකිරීමේ ගිණුම් වලින් ජනනවූ පොලිය | 214,888 | 104,273 |
| සේවක ණය වලින් ලද පොලිය | 518,880 | 404,666 |
| කලින් ගෙවූ සේවක ප්‍රතිලාභ | 672,003 | 525,779 |
| | **14,193,632** | **10,734,205** |

## 21.A මූල්‍ය පිරිවැය

| | 2016 | 2015 |
|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි (ජනවසම) මහා භාණ්ඩාගාරයේ PMD (MPI) ගෙවූ අසම්භව්‍ය බදු කුලී | 27,616,892 | 26,499,070 |
| ඉඩම් සහ ගොඩනැගිලි (ජනවසම) මහා භාණ්ඩාගාරයේ PMD (MPI) ගෙවූ බදු කුලී පොලි | 4,456,604 | 4,535,503 |
| බැංකු ගාස්තු | 42,353 | 55,747 |
| සේවක ණය ක්‍රමක්ෂයවීම | 672,003 | 525,779 |
| | **32,787,852** | **31,616,099** |

## 22. බදු පෙර ලාභය පහත වෙන් කිරීම් පසුව දක්වා ඇත.

| | 2016 | 2015 |
|---|---|---|
| **ක්ෂයවීම්** | | |
| - හිස් ඉඩම් වල කල්බදු අයිතිය | 2,688,722 | 2,688,722 |
| - නිශ්චල කල්බදු වත්කම් | 1,050,047 | 1,050,047 |
| - සින්නක්කර (දේපල පිරියත උපකරණ ) | 24,659,113 | 25,850,595 |
| ජෛව වත්කම් | 10,776,535 | 10,549,775 |
| අධ්‍යක්ෂ පරිශ්‍රමිකය | 3,377,160 | 3,405,223 |
| විගණක පරිශ්‍රමිකය | 869,200 | 926,000 |
| නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | 11,891,915 | 9,670,109 |
| නිර්වචිත දායක සැලසුම් පිරිවැය සේ. අ. අ. සහ සේ. භා. අ. | 25,582,172 | 21,456,264 |
| වැටුප් හා වේතන | 186,349,070 | 165,495,210 |
| සේවක 10% ලාභ පංගුව | 7,828,181 | **8,868,397** |
| | **275,072,115** | **249,960,342.12** |

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 23. ආදායම් බදු වියදම්

### 23.1 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා ආදායම් බදු වල ප්‍රධාන අංග පහත දක්වා ඇත.

| | | |
|---|---|---|
| **ප්‍රවර්ථන බදු වියදම්** | | |
| ප්‍රවර්ථන ආදායම් බදු (24.2) | 2,387,016 | 1,784,284 |
| පසු ගිය වසරේ ආදායම් බදු අධි වෙන් කරන ලද | - | - |
| විලම්බිත බදු අය කිරීම / වෙන් කිරීම | 12,757,599 | 7,826,328 |
| **ආදායම් ප්‍රකාශනයේ සටහන් ආදායම් බදු වියදම්** | **15,144,615** | **9,610,612** |

### 23.2 බදු වියදම් සහ ගිණුම්ගත ලාභ සැසඳීම

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| බදු පෙර ලාභය | 84,816,623 | 85,782,509 |
| අඩු කිරීමට ඉඩ නොදෙන අයිතමයන්ගේ එකතුව | 60,872,444 | 65,622,549 |
| අඩු කිරීමට ඉඩ දෙන අයිතමයන්ගේ එකතුව | (135,431,119) | (159,333,115) |
| ගැලපු ව්‍යපාරික ලාභය | 10,257,948 | (7,928,057) |
| පොලි ආදායම් | 13,002,749 | 9,803,760 |
| ව්‍යවස්ථාපිත ආදායම් | 23,260,697 | 9,803,760 |
| **අඩුකලා : සුදුසුකම් ලත් ගෙවීම්** | | |
| අඩුකිරීම් U.S. 32 | (8,141,244) | (3,431,316) |
| බදු ගෙවිය යුතු ආදායම | **15,119,453** | **6,372,444** |
| බදු අය කල හැකි ආදායම මත බදු - විශේෂ අනුපාතය 10% | 1,025,795 | - |
| සම්මත අනුපාතය - 28% | 1,361,221 | 1,784,284 |
| ප්‍රවර්ථන ආදායම් බදු වියදම් | **2,387,016** | **1,784,284** |

## 24. කොටසක ඉපයීම්

24.1 කොටසක මූලික ඉපයීම් ගණනය කිරීම වසරේ බදු පසු ලාභය අදාළ කාලය තුළ බරතැබූ සාමාන්‍ය කොටස් ප්‍රමණයෙන් බෙදූ විට ලැබෙන මුදලට සමාන වේ.

24.2 කොටසක මූලික ඉපයීම් ගණනය කිරීමට යොදා ගත් ආදායම හා කොටස් දත්තයන් පහතින් දක්වා ඇත.

| | | |
|---|---|---|
| **ලවය ලෙස භාවිතා කළ සංඛ්‍යාවන්** | | |
| කොටසක මූලික ඉපයීමට අදාළව සාමාන්‍ය කොටස්කරුවන්ට අදාළ වන ශුද්ධ ලාභය | 69,672,008 | 78,681,922 |
| | 69,672,008 | 78,681,922 |
| **හරය ලෙස භාවිතා කළ සංඛ්‍යාවන්** | **ගණන** | **ගණන** |
| නිකුත් කරන ලද බර තැබූ සාමාන්‍ය කොටස් ගණන | 20,000,001 | 20,000,001 |
| කොටසකට මූලික ඉපයීම්ට අදාලව | **20,000,001** | **20,000,001** |
| **කොටසකට මූලික ඉපයීම්** | **3.48** | **3.93** |

## 25. ශේෂ පත්‍ර දිනට පසුව ඇති වූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපීම් කිරීමට හෝ අනාවරණය කිරීමට හෝ අවශ්‍ය වන ආකාරයේ කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තාකරන දිනයෙන් පසු සිදුවී නොමැත.

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

## 26. සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම

සැලකිය යුතු සම්බන්ධිත පාර්ශ්ව හෙලිදරව් කිරීම් පහත දක්වා ඇත.

### 26.1 සමාගමේ හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සමග ඇති ගනුදෙනු

LKAS 24 "සම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම්" ප්‍රධාන කළමනාකරණ පාර්ශවයන්ට අස්තිත්වයේ කාර්යයන් සැලසුම් කිරීම, පාලනය, මග පෙන්වීම පිළිබඳ අධිකාරිත්වය හා වගකීම ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක හා විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළුව) සමාගමේ ප්‍රධාන කළමනාකරණ පාර්ශවය ලෙස වර්ග කර ඇත.

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 3,377,160 | 3,405,223 |

### 26.2. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මෙම මුල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 11 දක්වා ඇති ගනුදෙනු හැර වෙනත් ගනුදෙනු සම්බන්ධිත පාර්ශ්ව සමග නොමැත.

## 27. බැඳීම් සහ අවිනිශ්චිතයන්

### 27.1 ප්‍රාග්ධන බැඳීම්

වාර්තාකරන දිනට සමාගමේ කිසිදු සැලකිය යුතු ප්‍රාග්ධන බැඳීමක් නොමැත.

### 27.2 අසම්භාව්‍යන් බැඳීම්

වාර්තාකරන දිනට සටහන් අංක 16 හා පහතින් අනාවරණය කර ඇති දෑ හැර සමාගමේ වෙනත් අසම්භාව්‍ය බැඳීම් නොමැත.

### නඩු

| | නඩු අංක | විස්තරය | වර්තමාන තත්ත්ව |
|---|---|---|---|
| 1 | 350/RE<br>දිස්ත්‍රික් උසාවිය - මාරවිල | ඩිලාන් මැනුෆැක්චරස් පුද්ගලික සමාගමට එරෙහි ගොනු කළ නඩුව (ඉඩම් ආරවුල දිවුලපිටිය වත්ත) | තීන්දුව ලැබී නොමැති |
| 2 | SPL 2913<br>දිස්ත්‍රික් උසාවිය - මීගමුව | කටාන ප්‍රාදේශිය සභාවෙන් වන්දි ඉල්ලා ගොනු කළ නඩුව | තීන්දුව ලැබී නොමැති |
| 3 | DMR 03137/15<br>දිස්ත්‍රික් උසාවිය - අළුත්කඩේ | බී.පී. ඩෙවිඩ් සමාගම වෙතින් පොල් වල වටිනාකම වෙනුවෙන් රු. 2,963,522.15 ක් අලාභ ඉල්ලා ගොනු කල නඩුව | තීන්දුව ලැබී නොමැති |
| 4 | 28/2051/14<br>කම්කරු උසාවිය - හලාවත | හිටපු වතු අධිකාරි ඩබ්.එම්.පී. වීරසේකර මහතා නැවත සේවයේ පිහිටු වන ලෙස ඉල්ලා සිටීම. | තීන්දුව ලැබී නොමැති |
| 5 | 28/2052/14<br>කම්මරු උසාවිය - හලාවත | හිටපු සහකාර වතු අධිකාරි බී.එම්.එස්.එස්. බාලසූරිය මහතා නැවත සේවයේ පිහිටු වන ලෙස ඉල්ලා සිටීම. | තීන්දුව ලැබී නොමැති |
| 6 | 28/22183/16/V.D<br>දිස්ත්‍රික් උසාවිය - හලාවත | පී.ඒ. චන්ද්‍රසේන මහතා නැවත සේවයේ පිහිටු වන ලෙස ඉල්ලා සිටීම සහ හිඟ වැටුප් ඉල්ලා සිටීම. | තීන්දුව ලැබී නොමැති |
| 7 | 28/1852<br>කම්කරු විනිශ්චය - හලාවත | ආරුමුගම් මහතා හිඟ වැටුප් ඉල්ලා සිටීම | තීන්දුව ලැබී නොමැති (තීන්දුව බලාපොරොත්තුවෙන්) |

## හලාවත වැවිලි සමාගම

**ගිණුම්කරණ සටහන්**
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයට

| නඩු අංක | | විස්තරය | වර්ථමාන තත්ත්ව |
|---|---|---|---|
| **8** | A 3536<br>කම්කරු අධිකරණය - කොළඹ | එස්.සි. ජොර්ජ් මහතා සහ හිටපු සේවකයින් 8 දෙනෙකු විසින් වැටුප් සංශෝධනයට අනුව හිඟ වැටුප් ඉල්ලා ගොනු කල නඩුව | තීන්දුව ලැබී නොමැති |
| **9** | FR 343/2016<br>ශ්‍රේෂ්ඨාධිකරණය - කොළඹ | සේවය අත්හිටුවීම සම්බන්දයෙන් වතු අධිකාරි ජී.ඒ. දිසානායක මහතා විසින් වන්දි ඉල්ලා ගෙනු කල නඩුව | තීන්දුව ලැබී නොමැති |
| **10** | SC/FR/364<br>ශ්‍රේෂ්ඨාධිකරණය - කොළඹ | සහකාර සමානාාධිකාරි වැවිලි බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ ක්‍රම වේදය අභියෝගයට ලක් කරමින් එ.ඒ. ආනන්ද, ජී.එ. දිසානයක, එම්.ජී.සී.ඩයස් සහ ඩබ්.කේ.ප්‍රදීප් මහතුන් විසින් ගොනු කල නඩුව | තීන්දුව ලැබී නොමැති |
| **11** | IR/22/17/2013<br>කම්කරු දෙපාර්තමේන්තුව | කේ.එන්.ඩී. රාජපක්ෂ මහත්මිය විසින් හිඟ වැටුප් රු. 1,250/- ක් ඉල්ලා ගොනු කල නඩුව | තීන්දුව ලැබී නොමැති |
| **12** | IR/07/15/2013<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>- නාරාහේන්පිට | හලාවත වැවිලි සමාගමේ සේවකයින් කිහිප දෙනෙකුගේ සේවය ස්ථිර කිරීම සහ හිඟ වැටුප් සම්බන්දයෙන් ලංකා වතු සේවක සංගමය විසින් ගොනු කල නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **13** | IR/com/02/R/2014/102<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>-නාරාහේන්පිට | හලාවත වැවිලි සමාගමේ සමහර සේවකයින්ගේ හිඟ වැටුප් සම්බන්දයෙන් සේවක වතු සේවක සංගමය විසින් ගොනු කල නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **14** | IR/com/01/W/2016/21<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>-නාරාහේන්පිට | හිටපු සහකාර වතු අධිකාරි එස්.එල්.ජේ. පත්තිනිගේ මහතා වැටුප් තල වල ස්ථාපිත කිරීම සහ හිඟ වැටුප් සම්බන්දයෙන් ගොනු කරන ලද නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **15** | IR/com/03/W/2016/133<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>-නාරාහේන්පිට | හිටපු වතු අධිකාරි එස්.කේ.ඩී.ගුණවර්ධන මහතා විසින් දඬුවම ලිහිල් කිරීම සඳහා සහ අනුයුක්ත තනතුරේ ප්‍රතිලාභ සම්බන්දයෙන් ගොනු කරන ලද නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **16** | IR/Com/03/W/2016/123<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>-නාරාහේන්පිට | වැරදි ලෙස සේවය අත්හිටුවීම සම්බන්දයෙන් ලංකා වැවිලි කරුවන්ගේ සංගමය විසින් පවරන ලද නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **17** | IR/Com/04/2017/39<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>-නාරාහේන්පිට | අන්තර් සේවක සංගමය විසින් අසාධාරන කම්කරු ක්‍රියාකාරකම් සම්බන්දයෙන් ගොනු කරන ලද නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **18** | IR/com/03/2017/48<br>කම්කරු දෙපාර්තමේන්තුව<br>-නාරාහේන්පිට | නිවැරදි වැටුප් තලයේ පිහිටුවීම සම්බන්දයෙන් ලංකා වතු සේවක සංගමය විසින් ගොනු කරන ලද නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **19** | CHW/101/C/2016<br>කම්කරු කාර්යාලය - හලාවත | වතු කළමනාකාර එම්.එම්. මර්ලි මහතා විසින් වැටුප් වර්ධක සම්බන්දයෙන් ගොනු කරන ලද නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **20** | CHW/131/F/5/2013<br>කම්කරු කාර්යාලය - හලාවත | හිටපු සහකාර වතු අධිකාරි එස්.එල්.ජේ. පත්තිනිගේ මහතා විසින් පාරිතෝෂික ගණනය කිරීමේ වෙනස සම්බන්දයෙන් ගොනු කල නඩුව. | තීන්දුව ලැබී නොමැති |
| **21** | HRC/3858/16<br>මානව හිමිකම් කොමිෂන් සභාව | සේවය අත්හිටුවීම සම්බන්දයෙන් වතු අධිකාරි ජී.ඒ. දිසානායක මහතා විසින් ගෙනු කල නඩුව | තීන්දුව ලැබී නොමැති |

## පසුගිය වසර 10 තුළ සාරාංශගත ප්‍රතිඵල

| | 2016 | 2015 Re-Stated | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පොල් නිෂ්පාදනය ගෙඩි '000 | 16,522 | 12,517 | 12,969 | 9,595 | 15,808 | 14,528 | 18,256 | 18,632 | 16,280 | 17,815 |
| වෙළඳ ප්‍රතිඵල | Rs'000 | Rs'000 | Rs'000 | Rs'000 | Rs'000 | Rs'000 | Rs'000 | Rs'000 | Rs'000 | Rs'000 |
| ආදායම | 383,090 | 399,366 | 374,851 | 287,152 | 339,051 | 322,909 | 422,668 | 312,687 | 310,990 | 291,202 |
| දළ ලාභය | 148,707 | 148,748 | 152,726 | 112,890 | 123,733 | 163,228 | 172,166 | 115,805 | 171,458 | 141,612 |
| පොලිය සහ බදු පෙර ලාභය | 117,604 | 119,909 | (31,966) | 108,989 | 111,209 | 118,969 | 136,608 | 141,201 | 53,070 | 122,167 |
| බදු පෙර ලාභය | 84,817 | 88,293 | (61,273) | 81,820 | 86,225 | 95,771 | 114,163 | 120,693 | 35,271 | 106,869 |
| බදු පසු ලාභය | 70,764 | 81,444 | (61,680) | 72,919 | 77,975 | 77,670 | 75,256 | 98,097 | 10,509 | 105,403 |
| රඳවාගත් ලාභය | 633,886 | 598,277 | 543,862 | 625,542 | 587,623 | 584,648 | 585,895 | 510,639 | 442,542 | 432,033 |
| දැව සංචිතය | 61,841 | 56,686 | | | | | | | | |
| ගෙවූ ලාභාංශ | | 30,000 | | 20,000 | 35,000 | 75,000 | - | 75,000 | 30,000 | |
| සමුච්චිත ලාභාංශ | 426,650 | 426,650 | 396,650 | 396,650 | 376,650 | 341,650 | 266,650 | 266,650 | 191,650 | 161,650 |
| මූල්‍ය තත්ත්වය | | | | | | | | | | |
| ස්ථාවර වත්කම් | 966,343 | 886,295 | 792,832 | 737,497 | 602,610 | 560,326 | 483,117 | 436,721 | 392,322 | 374,790 |
| මේරූ/නොමේරූ වගා | 728,533 | 653,072 | 581,618 | 502,826 | 410,033 | 354,712 | 326,048 | 287,333 | 250,444 | 237,592 |
| ජංගම වත්කම් | 312,333 | 256,882 | 233,545 | 356,230 | 454,231 | 519,019 | 627,829 | 496,056 | 476,434 | 501,906 |
| තොග | 104,999 | 47,613 | 73,432 | 71,398 | 82,606 | 94,295 | 28,526 | 44,770 | 50,041 | 54,799 |
| කෙටි කාලින ආයෝජන (ස්ථාවර තැන්පත්) | 140,868 | 152,646 | 113,276 | 128,996 | 199,377 | 244,814 | 409,727 | 387,174 | 373,501 | 395,195 |
| මුළු වත්කම් | 1,278,676 | 1,143,177 | 1,026,376 | 1,093,727 | 1,056,841 | 1,084,615 | 1,110,946 | 932,777 | 868,756 | 876,696 |
| ජංගම වගකීම් | 134,591 | 54,740 | 57,100 | 45,452 | 60,149 | 90,605 | 127,215 | 60,125 | 61,675 | 84,699 |
| දිගු කාලීන වගකීම් | 248,358 | 233,474 | 225,414 | 222,734 | 209,070 | 204,092 | 197,836 | 162,012 | 164,539 | 159,964 |
| කොටස් ප්‍රාග්ධනය | 200,000 | 200,000 | 200,000 | 200,000 | 200,000 | 200,000 | 200,000 | 200,000 | 200,000 | 200,000 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | 895,727 | 854,963 | 743,861 | 825,542 | 787,623 | 784,648 | 785,895 | 710,639 | 642,542 | 632,033 |
| ජංගම අනුපාතය (වාර) | 2.32 | 4.69 | 4.09 | 7.83 | 7.55 | 5.77 | 4.94 | 8.25 | 7.72 | 5.93 |
| ක්ෂණික අනුපාතය (වාර) | 1.54 | 3.82 | 2.80 | 6.27 | 6.18 | 4.69 | 4.71 | 7.51 | 6.91 | 5.28 |
| දළ ලාභ අනුපාතය % | 38.82 | 37.25 | 40.74 | 39.31 | 36.49 | 44.71 | 40.73 | 37.04 | 55.13 | 48.63 |
| කොටසක ඉපැයීම රු. | 3.48 | 3.93 | (3.10) | 3.69 | 3.90 | 3.88 | 3.76 | 4.90 | 0.53 | 5.27 |
| සාමාන්‍ය ස්කන්ධයට ආපසු ලැබීම්(ROE)% | 8.08 | 10.19 | (7.86) | 8.80 | 9.92 | 9.86 | 10.06 | 14.50 | 1.65 | 18.19 |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE)% | 10.28 | 11.02 | (3.30) | 10.40 | 11.16 | 11.97 | 13.89 | 16.18 | 6.58 | 15.43 |
| මුළු වත්කම් වලට ජංගම වගකීම් | 0.11 | 0.05 | 0.06 | 0.04 | 0.06 | 0.08 | 0.11 | 0.06 | 0.07 | 0.10 |
| කොටස් කරුවන්ගේ අරමුදල් අනුපාතය | 70.05 | 74.79 | 72.47 | 75.48 | 74.53 | 72.34 | 70.74 | 76.19 | 73.96 | 72.09 |
| පොලී ආවරණය (වාර) | 3.59 | 3.79 | (1.09) | 3.98 | 4.45 | 5.13 | 6.09 | 6.89 | 2.98 | 7.99 |
| ණයගැති අනුපාතය | 0.30 | 0.25 | 0.28 | 0.25 | 0.25 | 0.27 | 0.29 | 0.24 | 0.26 | 0.28 |
| මුළු වත්කම් වලට දිගු කාලීන ණය හිමියෝ | 0.19 | 0.21 | 0.22 | 0.20 | 0.20 | 0.19 | 0.18 | 0.17 | 0.19 | 0.18 |

# හලාවත වැවිලි සමාගම

## වාර්ෂික මහා සභා රැස්වීම දැනුම් දීම

පහත සඳහන් කරුණු අරමුණු කරගෙන සීමාසහිත හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහ සභා රැස්වීම 2017 දෙසැම්බර් 19 වන දින ප.ව 1.30 ට කොළඹ 01, යෝක් වීදියේ අංක 2 හි ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේ දී පැවැත්වෙන බව මෙසේ දන්වා සිටිනු ලැබේ.

### න්‍යාය පත්‍රය

1. 2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශන හා ඒ පිළිබඳ අධ්‍යක්ෂ හා විගණන වාර්තා පිළිබඳ සලකා බැලීම.
2. 2017 වර්ෂයේ විගණකවරුන් ලෙස විගණකාධිපති දේපාර්තමේන්තුව පත්කිරීම.
3. 2016 වර්ෂය සඳහා අවසන් ලාභාංශ තීරණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත හලාවත වැවිලි සමාගම

කෝපරේට් ඇඩ්වයිසරි සර්විස් (පුද්) සමාගම

ලේකම්වරු - හලාවත වැවිලි සමාගම

දිනය. 2017 නොවැම්බර් 27 වන දින

### සටහන්

1. උක්ත රැස්වීමට සහභාගිවීමට හිමිකම් ඇති කොටස්කරුවකු / සාමාජිකයෙකු හට තමා වෙනුවෙන් ඊට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පෙරකලාසිකරුවෙකු පත් කිරීමේ අයිතිය ඇත.
2. පෙරකලාසිකරු සමාගමේ සමාජිකයෙකු වීම අවශ්‍ය නොවේ.
3. මේ සඳහා වූ පෙරකලාසි පත්‍රය අමුණා ඇත.

# හලාවත වැවිලි සමාගම

**පෙරකලාසි අයදුම්පත**

පහත අත්සන් කරන සීමාසහිත හලාවත වැවිලි සමාගමේ සාමාජිකයෙකු / සාමාජිකයන් වන ......................................
.............................................................................................................................................................මම / අප

1. වික්ටර් කුමාර චාල්ස් හේරත් මහතා හෝ ඔහු නොමැති නම්
2. මනිෂ කිත්සිරි බණ්ඩාර සෙනෙවිරත්න මහතා හෝ ඔහු නොමැති නම්
3. කුලියාපිටි ගමලත්ගේ ආනන්ද පුෂ්පකුමාර මහතා හෝ ඔහු නොමැති නම්
4. අසායි ලක්කතාස් මහතා හෝ ඔහු නොමැති නම්
5. හේරත් මුදියන්සේලාගේ නිලන්ත චන්දිමාල් හේරත් මහතා හෝ ඔහු නොමැති නම්
6. පත්තිනිකුට්ටිගේ බර්නාඩ් සරත් ක්‍රිස්ටොපර් නොනිස් මහතා හෝ ඔහු නොමැති නම්
7. පතිරනගේ චන්ද්‍රප්‍රිය විජේවර්ධන මහතා හෝ ඔහු නොමැති නම්

.............................................................................................................................................................

2017 දෙසැම්බර් 19 වෙනි දින ප.ව. 1.30 ට පැවැත්වෙන මෙම සමාගමේ මහ සභා රැස්වීමේදී මා /අප වෙනුවෙන්, මාව / අපව නියෝජනය කරමින්, මා/අප වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා මා නම් කරමි/මු.

**දී ඇති කොටු තුළ "X" සළකුණු කිරීමෙන් ඔබගේ කැමැත්ත පල කරන්න.**

| | | එකඟ වෙමි/මු | එකඟ නොවෙමි/මු |
|---|---|---|---|
| 1. | 2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා සකස්කල ගිණුම් ප්‍රකාශන හා ඒ පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණන වාර්තාව ලබාගැනීම හා සලකා බැලීම | ☐ | ☐ |
| 2. | 2017 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ විගණකවරුන් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව පත් කිරීම. | ☐ | ☐ |
| 3. | 2016 වර්ෂය සඳහා අවසන් ලාභාංශ තීරණය කිරීම. | ☐ | ☐ |

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකගේ අත්සන ..............................................................................

2017 ............................................................. මස ......................................................... දින අත්සන් තබන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකගේ ජා.හැ. අංකය ..................................................................................

**පෙරකලාසි අයදුම්පත සම්පූර්ණ කිරීමේ උපදෙස්**

1. පෙරකලාසි අයදුම් පතෙහි ඇති හිස් තැන් පුරවා නියමිත ස්ථානයේ අත්සන් සහ දිනය කරුණාකර සඳහන් කරන්න.
2. පෙරකලාසි අයදුම්පත ඇටෝර්නි බලයලත් පුද්ගලයෙකු විසින් අත්සන් කර ඇත්නම් සහ එම ඇටෝර්නි බල පත්‍රය මේ වන විටත් සමාගමේ ලියාපදිංචි කර නැත්නම් එම ඇටෝර්නි බලපත්‍රයද සම්පූර්ණ කරන ලද පෙරකලාසි අයදුම් පත සමඟ අමුණා එවිය යුතුයි.
3. රැස්වීම පැවැත්වීමට නියමිත වෙලාවට අඩුම වශයෙන් පැය 48ක ට පෙර සම්පූර්ණ කරන ලද පෙරකලාසි අයදුම්පත, කොළඹ 07 ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, නො 47, යන ස්ථානයේ ලේකම්වරුන්ගේ කාර්යාලයේ (කෝපරේට් ඇඩ්වයිසරි පුද්. සමාගම) තැන්පත් කිරීමට කටයුතු කළ යුතු වේ.

## ආයතනික විස්තරය

| | | |
|---|---|---|
| **සමාගමේ නාමය** | : | සීමාසහිත හලාවත වැවිලි සමාගම. |
| **ප්‍රධාන කාර්යාලය** | : | "කප්රුක සෙවන", අංක 165, පුත්තලම් පාර, හලාවත, 61000. |
| **කොළඹ කාර්යාලය** | : | ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො. 191, ධර්මපාල මාවත, කොළඹ 07. |
| **සංස්ථාපනය කළ දිනය** | : | 1992 ජූනි මස 11 වැනි දින. |
| **සමාගමේ ලියාපදිංචි අංකය** | : | PB 703 ( නව අංකය 2007 අංක 07 දරන නව සමාගම් පනත) |
| **නෛතික තත්ත්වය** | : | 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානවලට අනුකූලව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපනය කරන ලද පූර්ණ රජයට අයිති සමාගමකි. (පසුව 2007 අංක 7 දරන නව සමාගම් පනතට අනුව යළි ලියාපදිංචි කරන ලදී) |
| **කොටස් හිමිකම** | : | සමාගමේ සියලු කොටස්වල අයිතිය (100%) එහි ස්වර්ණමය කොටස සමඟ හිමිකරුවන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ මහා භාණ්ඩාගාර ලේකම් විසින් උසුලනු ලබයි. |
| **කොටස් ප්‍රාග්ධනය** | : | විශේෂ වරප්‍රසාද සහිත ස්වර්ණමය කොටස ද ඇතුළත්ව රුපියල් දහයේ (රු:10/-) කොටස් 20,000,001 ක් මහා භාණ්ඩාගාරය සතුය. |

**අධ්‍යක්ෂ මණ්ඩලය 2016 දෙසැම්බර් 31 දිනට,**

| | | |
|---|---|---|
| වී.කේ.සී. හේරත් මහතා | - | සභාපති / ප්‍රධාන විධායක නිලධාරි |
| එම්.කේ.බී. සෙනවිරත්න මහතා | - | විධායක අධ්‍යක්ෂ |
| පී.බී.එස්.සී. නෝනිස් මහතා | - | අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත) |
| ඒ. ලක්කතාස් මහතා | - | අධ්‍යක්ෂ (අතිරේක ලේකම්, රජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය) |
| කේ.ජී. ආනන්ද පුෂ්පකුමාර මහතා | - | අධ්‍යක්ෂ |
| එච්.එම්.එන්.සී. හේරත් මහතා | - | අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| **විගණකවරුන්** | : | විගණකාධිපති දෙපාර්තමේන්තුව<br>අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. |
| **බැංකුකරුවන්** | : | ලංකා බැංකුව |
| **සමාගම් ලේකම්වරුන්** | : | කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් පුද්ගලික සමාගම<br>අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07. |

Head Office
**CHILAW PLANTATIONS LIMITED**
Company Reg:No. PB-703

"Kapruk Sewana", No. 165, Puttalam Road, Chilaw, 61000.
Tel: 032 5741273, 032 5741260  Fax 032 2222162
Email: cplmkt@sltnet.lk, cpl2@mobitelnet.lk

DESIGNED & PRINTED BY
**ASLIYA PRINTERS -KURUNEGALA (037 2221772)**